7

# The SIGNALLER

Sri Lanka Signal Corps Journal - 2005



# පදවි ප්‍රාප්ති





මේජර් ජෙනරාල්
එච්එම්ඩබ්ලිව් සෙනෙවිරත්න යූඑස්පී එන්ඩීසී පීඑස්සී විසින්
යුධ හමුදා මාණ්ඩලික ප්‍රධාන වශයෙන්
රාජකාරිය බාර ගැනීම.

බ්‍රිගේඩියර් වයිඑස්ඩී සිල්වා යූඑස්පී පීඑස්සී
විසින් සංඥා බලකාධිපති තනතුර බාර ගැනීම.



කර්නල් එස්ඩීපී සමරසිංහ ආර්එස්පීපීඑස්සී රෙජිමේන්තු මධ්‍යස්ථාන
සේනාවිධායක තනතුරෙන් සමුගැනීම 2005.01.03 වෙනි දින



කර්නල් ආර්ඊ කඩුවෙල මධ්‍යස්ථාන සේනාවිධායක
තනතුර බාර ගැනීම 2005.01.03 වෙනි දින



28





"The Signeller"
is the yearly publication of the
Sri Lanka Signal Corps.

"ද සිග්නලර්"
ශ්‍රීලංකා සංඥා බලකායේ
වාර්ෂික ප්‍රකාශනයයි

## සංස්කාරක මණ්ඩලය

ලුතිනන් කර්නල් ඩීඒපීඑන් දෙමටන්පිටිය පීඑස්සී
මේජර් ඩීඊසී ජයසිංහ පීඑස්සී
මේජර් එස්එච්පීඩී තිලකරත්න ආර්එස්පී
කපිතාන් එම්ආර්එම්ආර්එල්ඩී මීගස්තැන්න
කපිතාන් (උපා) ජීඩීඑච්එස් පෙරේරා

**ලිපිනය**
සංස්කාරක
සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය
යුධ හමුදා ජනපදය
පනාගොඩ.
දු.ක : 011 2342818එස්

මුද්‍රණය හා පිටුසැකසුම
සෙනෙවිරත්න ප්‍රින්ටර්ස්
කටුවාන පාර හෝමාගම.
දුර. 01-2857761, 01-2892183

## පටුන | පිටුව

| පටුන | පිටුව |
|---|---|
| පණිවුඩ | 4-6 |
| චරිතාපදාන | 7-9 |
| පියවරක් ඉදිරියට | 10 |
| සංඥා විත්ති | 11-42 |
| ආකර්ශණ | 43-44 |
| සුනාමි | 45-47 |
| සිප් සතර | 48-57 |
| සෙබළ තෙලිතුඩ | 58-80 |
| ක්‍රීඩා හපන්කම් | 81-83 |
| සුභ මංගලම් | 84-85 |




## කතු වැකිය

සංඥා බලකාය මගින් වාර්ෂිකව මුද්‍රණය කරණු ලබන 'ද සිග්නලර්' සඟරාවේ 2005 කලාපයේ කර්තෘ වශයෙන් කටයුතු කිරීමට ලැබීම පිළිබඳව අවංකවම මා සතුටු වෙමි. පෙර වසරවලදී ප්‍රකාශයට පත් කරන ලද ද සිග්නලර් කලාප හා සසඳා බැලීමේදී මෙවර කලාපය සඳහා ශ්‍රී ලංකා සංඥා බලකා සාමාජිකයින්ගේ ප්‍රතිචාරය ඉතා ඉහළ මට්ටමක ඇති බැව් පෙනී යයි. සංඥා බලකා සමාජිකයින් වන ඔබ සියළු දෙනාගේ සැඟවුණු කුසලතා, විවිධ හැකියාවන් එළි දැක්වීමට මෙම සඟරාව මහඟු පිටුවහලක් වන බව අපගේ හැඟීමයි, අපගේ ඒකායන ප්‍රාර්ථනාවයි.

වත්මනෙහි අප වටා ඇති දියුණු අවධියක පවතින තාක්ෂණ ක්‍රියාකාරකම් අප විසින් ද උකහා ගත යුතුවාක් මෙන් ම එමගින් පුද්ගලිකව අපගේද අප බලකායේද සමස්ත යුද හමුදාව ඇතුලු අප දැයෙහිද උන්නතිය උදෙසා දායක විය හැකිනම් එය අප විසින් ලබාගත හැකි උපරිම ජයග්‍රහණයක් වන්නේය. එබැවින් ඉදිරියේදී මෙම කලාපය අති සාර්ථක අයුරින් එළි දැක්වීම සඳහා ඔබගේ නව නිර්මාණයන් අදහස් හා යෝජනා අප ඉත සිතින් අපේක්ෂා කරන්නෙමු.

විවිධ රාජකාරීන් මධ්‍යයෙහි වුවද මෙවර කලාපය සාර්ථක අන්දමින් එළි දැක්වීමෙහි ලා සහය දැක්වූ සියලු ජ්‍යෙෂ්ඨ නිළධාරීන් ඒකක අණදෙන නිළධාරීවරුන් ඇතුළු සියළුම නිළධාරීන් හා සෙසු නිළයින්ට මාගේ අවංක ස්තුතිය පුද කරන අතර විවිධ බාධක මධ්‍යයේ මෙම සඟරාවේ අන්තර්ගතය පෙළගැස්වීම සඳහා තම ශ්‍රමය කැපකළ සංස්කාරක මණ්ඩලය වෙත මාගේ හෘද්‍යාංගම ප්‍රණාමය පුදකරමි.

අවසාන වශයෙන් මෙම වාර්ෂික කලාපය පෙර වසරවලදී මෙන්ම මෙවරද ඉතා අලංකාර අන්දමින් මුද්‍රණය කොට ඔබ අතට පත්කරන්නට ස්වකීය ශ්‍රමය කැපකළ හෝමාගම කටුවාන පාරේ සෙනෙවිරත්න ප්‍රින්ටර්ස් අධිපති ඇතුළු කාර්ය මණ්ඩලයට මාගේ ප්‍රශංසාව පුද කරමි.

සංස්කාරක.





## MESSAGE OF COLONEL COMMANDANT



It is with great pleasure I issue this message to the **SIGNALER-2005**, which publish in parallel to the 62nd Anniversary of the Sri Lanka Signal Corps. In this information age it is our duty to see that whether are we ready to face the new challenges? Several hundred years ago the Commanders had to deploy on a hilltop to survey personally the disposition of all friendly and adversary forces. But today he can do this by standing on an 'electronic hilltop'

The Information Age and Information Revolution has change the whole communication system of the modern Armies. In that it has changed the conventional hierarchical communication structure into a network grid system, which facilitate lateral flow of communications there by giving the speed and flexibility for the commanders at all levels. Therefore all members in Corps of Signals must understand this present context and must take necessary steps to use this new technology to the advantage of our Army in particular and the country in general.

Finally I appreciate the effort taken by the editorial board to publish this very informative and educative SIGNALER journal in this year too.

**YSA De Silva USP psc**
Brigadier
Colonel Commandant SLSC

# සංඥා බලකාධිපති පණිවිඩය



ශ්‍රී ලංකා සංඥා බලකායේ 62 වන සංවත්සරයට සමගාමීව 'ද සිග්නලර්' - 2005 කලාපය වෙනුවෙන් මෙවැනි පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම ඉමහත් භාග්‍යයක් කොට සලකමි. වත්මන් තොරතුරු තාක්ෂණ යුගයෙහි නව අභියෝගයන්ට මුහුණ දිය හැකිද යන්න සොයා බැලීම අප සියලු දෙනාගේ යුතුකම වේ. ශතවර්ෂ කිහිපයකට පෙර සිටි යුද මෙහෙයවන්නන් හට තම මිතුරු හමුදාවල මෙන්ම සතුරු හමුදා චර්යාවන් නිරීක්ෂණය කිරීම වස් ගිරි දුර්ග මතට පා නගන්නට සිදුවිය. එසේ වුවද ඔවුහු වර්තමානයේ විද්‍යුත් මාධ්‍ය මත සිට එම කාර්‍යය ඉටු කරයි.

තොරතුරු තාක්ෂණ යුගය හා තොරතුරු පරිණාමය නූතන යුද හමුදාවන්හි සංනිවේදන කටයුතු වල පෙරලියක් ඇති කොට එමගින් මෙතෙක් චාරිත්‍රානුකූලවූ සන්නිවේදන ව්‍යුහය වෙනස් කොට සියලුම තරාතිරමේ අණදෙන්නන්ගේ පහසුව සඳහා කාර්යක්ෂම වූත් නම්‍යශීලී වූත් සමාන්තර ජාලයකට සංනිවේදනය යොමුකොට ඇත. එබැවින් අප බලකායේ සියලුම සාමාජිකයින් මෙම පවතින තත්වය මැනවින් තේරුම්ගෙන යුද හමුදාවේ මෙන්ම පොදුවේ දැයෙහි ප්‍රගතිය උදෙසා නූතන තාක්ෂණය උපයෝගී කර ගැනීමට සිහිතබාගත යුතුය.

අවසාන වශයෙන් මෙම වසරේදීත් සවිස්තරාත්මක මෙන්ම අධ්‍යාපනික වශයෙන් සපිරි 'ද සිග්නලර්' සඟරාව මුද්‍රණය කිරීමෙහිලා සංස්කාරක මඩුල්ලෙහි කාර්යභාරය පැසසුමට ලක්කරමි.

**වයිඑස්වී ද සිල්වා යූඑස්පී පීඑස්සී**
බ්‍රිගේඩියර්
සංඥා බලකාධිපති





# සංඥා බලසේනාධිපති පණිවුඩය



ශ්‍රී ලංකා සංඥා බලකාය විසින් එළිදක්වන ''සිග්නලර්'' සියළුම කලාපයන් සඳහා සංඥා බලසේනාධිපති වශයෙන් පණිවුඩයක් මා නිකුත් කරන්නේ අතිශය ආඩම්බරයෙන් හා මා ලැබූ වරප්‍රසාදයක් ලෙස හදපිරි සතුටිනි.

මංගල කලාපයේ ආරම්භයත් සමගම එළිදැක්වූ ''සිග්නලර්'' සියළුම කලාපයන් ඉතා උසස් මට්ටමකින් ඉදිරිපත් කිරීමට හැකියාවක් ලැබුණු අතර, එම උසස් තත්වය රැකගනිමින් හත්වන කලාපය ද සාර්ථකව එළිදක්වන්නට මූලිකත්වය ගෙන දායක වූ සංස්කාරක මණ්ඩලය ඇතුළු සියළුම නිළධාරීන් හා සෙසු නිළයින් වෙත ප්‍රථමයෙන් මාගේ ප්‍රණාමය පුද කරමි. සංඥා බලකාය විසින් එළිදක්වන මෙම සඟරාව මඟින් සංඥා බලකායේ සියළුම සාමාජිකයින්ගේ ඇති හැකියාව එළි දැක්වීමත්, නව දැණුම තවදුරටත් වර්ධනය කර ගැනීමට ඉඩ ප්‍රස්ථාවන් ලැබෙන අතර, එමඟින් සීඝ්‍රයෙන් දියුණුවන නව තාක්ෂණ දැණුම සමඟ ඉදිරියට යාමට හැකියාව ලැබෙනු ඇත.

ශ්‍රී ලංකා සංඥා බලකායේ ආරම්භයේ සිට සංඥා සම්බන්ධතා ලබාදීම අපගේ කාර්‍යයක සහ වගකීමක් ලෙස පැවතුන අතර, මෙය තවදුරටත් කාර්යක්‍ෂමව සහ උසස් මට්ටමින් ඉටුකිරීම යුධ හමුදාවේ ව්‍යාප්තියත් සමගම සංඥා බලසේනාවට පැවරුණි. යුධමය වාතාවරණයක් පැවතුනද පසුගිය වකවානුව තුළ ක්‍රියාන්විතයන් සඳහා සංඥා සම්බන්ධතා ඉතා උසස් මට්ටමින් ලබාදීමෙන් සංඥා බලසේනාවේ කීර්ති නාමය රැකගැනීමට අප හට හැකියාව ලැබුණි. මේ සඳහා තම වගකීම් සහ කාර්‍යයන් ඉතා උසස් අයුරින් ඉටුකල සංඥා බලකායේ සියළුම සාමාජිකයින්ගේ කැප වීම සංඥා බලසේනාධිපති වශයෙන් මා අගය කරන අතර, ඉදිරියේදීත් වඩාත් උසස් මට්ටමකින් සංඥා සම්බන්ධතාවයන් ලබාදීමට ඔබ සැමට ධෛර්‍ය ශක්තිය ලැබේවායි මම ප්‍රාර්ථනා කරමි. මෙම හැකියාවන් ලබාගැනීම සඳහා සියළුම නිළයින් ඉදිරියටත් තම පුහුණුවීම් කටයුතු නිසි පරිදි කළ යුතු බවත්, යුධ හමුදාවේ විනය හා පැවැත්මට අනුව කටයුතු කිරීමට අප සැම අදිටන් කර ගත යුතු බවත්, සිහිපත් කරමි.

සංඥා බලකායට ඇති සීමිත සම්පත් මඟින් විශාල කාර්යයන් ප්‍රමාණයක් ඉටුකිරීමට සිදුවන බැවි සියළුම නිළයින් ධාරණය කර ගත යුතුව ඇති කරුණකි. එමෙන්ම ලොව ඇති තාක්ෂණයේ ඉහාමත් දියුණු උපකරණ සමඟ අපි නිරන්තරයෙන්ම සම්බන්ධ වන්නෙමු. එම උපකරණ භාවිතය පිළිබඳ සහ නිසි අයුරු පරිහරණය පිළිබඳව නිසි අවබෝධයක් ලබාගැනීමට නිරන්තරයෙන්ම උත්සාහ දැරිය යුතු අතර, නවීන තොරතුරු තාක්ෂණයේ ව්‍යාප්තිය සමඟම අප සංඥා බලකායේ සියළු සාමාජිකයින් හට තම කාර්යයන් ඉටු කිරීමේ හැකියාව තිබීම ඉදිරියේදී අත්‍යාවශ්‍යතාවයක් වන බැවින්, මේ සඳහා සියළුම නිළයන්ගේ ඇප කැපවීම හා තම වෘත්තීය දැණුම වැඩිදියුණු කරගැනීමට නිරන්තරයෙන්ම උත්සාහ දැරිය යුතුවේ. සීඝ්‍රයෙන් දියුණු වන නව තාක්ෂණය සමඟින් අප වෙත ලැබී ඇති ඉතා වටිනා උපකරණ ආරක්ෂාකාරීව භාවිතා කරමින් එම උපකරණ වලින් නිසි ප්‍රයෝජනය ගනිමින් අප මුහුණපා සිටින බෙදුම්වාදී ත්‍රස්ථවාදීන් පරාජය කිරීමට දායකත්වය ලබාදීමට බලකායේ සියළුම නිළයින් අප්‍රතිහත ධෛර්යයෙන් යුතුව ක්‍රියාකරණු ඇතැයි මාගේ විශ්වාසයයි.

දේශය වෙනුවෙන් ආත්ම පරිත්‍යාගයෙන් යුතුව තම ජීවිතය පුදකලා වූ බලකායේ සියළුම රණවිරුදවන්ටත් මාගේ ගෞරවණීය ආචාරය පුද කරන අතර, ක්‍රියාන්විතයේ දී තුවාල ලැබූ සහ ආබාධිත තත්වයට පත්ව ඇති සියළුම රණවිරුවන්ට සැනසුම් සුවය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

අවසාන වශයෙන් ශ්‍රී ලංකා සංඥා බලකායේ සියළුම නිළධාරීන් සහ සෙසු නිළයින්හටත් තම පවුල්වල සාමාජිකයින්ටත්, සිවිල් සේවකයින්ටත් ඔවුන්ගේ පවුල්වල සැමටත් සුභාශිංසනය පිරිනමමි.

**ඒපී ද ඉසෙඩ් අබේසේකර යූඑස්පී**
බ්‍රිගේඩියර්








# පිරිය දිවියක පියසටහන්

දෙවන ලුතිතන් වරයෙකු වශයෙන් ශ්‍රී ලංකා යුද හමුදාවට බැඳී ශ්‍රී ලංකා යුද හමුදාවේ මාණ්ඩලික ප්‍රධාන තනතුරට පත් වූ සංඥා පවුලේ එකම නිලධාරියා ලෙස අභිෂේක ලබමින් ශ්‍රී ලංකා සංඥා බලකායට නවමං විවර කල මේජර් ජෙනරාල් ඒඑම්සීඩබ්බී සෙනෙවිරත්න යූඑස්පී,එන්ඩීසී,පීඑස්සී, 2004 දෙසැම්බර් මස 10වන දින විශ්‍රාම ගනු ලැබුවේ තම බලකායටත්, ශ්‍රී ලංකා යුද හමුදාවටත් සමස්ථයක් ලෙස මුලුමහත් ශ්‍රී ලංකාද්වීපයටත් විශිෂ්ට වූත්, ගෞරවාන්විත වූත් සේවයක නිමාව දකිමිනි.

1970 වසරේ ශ්‍රී ලංකා යුද හමුදාවේ නිත්‍ය බළසේනාවට කෙඩෙට් නිළධාරියෙකු ලෙස බැඳී පාඨමාලා අංක 3 යටතේ දියතලාවේ කෙඩෙට් නිළධාරි පුහුණු පාසල වෙතින් සාර්ථක ලෙස පාඨමාලා නිමාවෙන් පසු 1971 මැයි මස 01 වන දින 2 වන ලුතිතන් වරයෙකු ලෙස අධිකාරියට පත් වී 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකායට එක් විය. 1971.09.01 වන දින සිට 1971.12.24 දින දක්වා ඉන්දියාවේදී තරුණ සංඥා නිළධාරි පාඨමාලාව හදාරා 1971.12.25 වන දින නැවත ඒකකයට එක්වූ තරුණ දෙවන ලුතිතන් ඒඑම්සීඩබ්බී සෙනෙවිරත්න අනතුරුව 1972.01.03 දින සිට 1972.08.01 වන දින දක්වා යුධ හමුදා අභ්‍යාස මධ්‍යස්ථානය දියතලාව පුහුණු පාසලෙහි බණ්ඩභාර නිළධාරියෙකු ලෙස සේවය කර ඇත. 1972.08.02 වන දින 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකායේ බණ්ඩ භාර නිළධාරි තනතුරට පත් මෙම නිළධාරි 1972.08.02 වන දින දක්වා එම තනතුරේ රාජකාරි කොට 1972.11.02 වන දින කෙඩෙට් නිළධාරි පුහුණු පාසල දියතලාව හි නිළධාරි උපදේශක තනතුරක් සඳහා යා කරන ලදී. 1972.12.20 වනදින දක්වා කෙටි කාලයක් නිළධාරි උපදේශකයෙකු ලෙස සේවය අවසන් කොට 1973.01.01 දින සිට යාපනය ප්‍රදේශයේ නීති විරෝධි කාර්යය මැඩලීමේ ඒකකය (නිවිකා) සංඥා නිළධාරි තනතුරට පත් දෙවෙනි ලුතිතන් ඒඑම්සීඩබ් සෙනෙවිරත්න 1973.02.05 වන දින ලුතිතන් නිළයට උසස් වීම් ලැබීමෙන් අනතුරුව 1973.08.08 වන දින නිවිකා සංඥා නිළධාරි තනතුර අත් හරින ලදී.

1973.08.09. දින සිට 1973.12.20 දින දක්වා සංඥ අනුබණ්ඩය මැදිරිගිරිය හි නිළධාරි අණදෙන තනතුර ද 1973.12.21 දිනසිට 1974.04.20 දින 1 වන සංඥා බළකායේ 1 වන බළසණයේ ඒ බණ්ඩයේ නිළධාරි අණදෙන තනතුරෙහිද රාජකාරි මැනවින් ඉටුකළ ලුතිතන් ඒඑම්සිඩබ්බී සෙනෙවිරත්න 1974.04.21 දින ආධුනිකයන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානය කලාඔය ප්‍රධාන උපදේශක තනතුරට පත් විය. 1974.11.02 දින සිට 1975.03.01 දින දක්වා 1 වන ශ්‍රී ලංකා සංඥා බලකායේ වැඩ බලන විධායක අධිකාරි තනතුරෙහි රාජකාරි කිරීමෙන් පසු ඉන්දියාවේ පවත්වන ලද ප්‍රති විප්ලවවාදි ඒකාබද්ධ සටන් පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් ලබා එම පුහුණු පාඨමාලාව සඳහා 1975.03.02 දින දිවයිනෙන් බැහැර විය. 1975.04.20 දින දක්වා කාලය තුළ පාඨමාලාව නිම කොට පැමිණීමෙන් පසු අනතුරුව 1975.04.21 දින සිට 1976.01.03 දින දක්වා 1 වන සංඥා බලකායේ 1 වන බළසණයේ බණ්ඩභාර නිළධාරි තනතුරට පත් වන ලදී. 1976.01.04 දින නැවතත් යාපනය ප්‍රදේශයේ නිවිකා සංඥා නිළධාරි තනතුරෙහි රාජකාරි ඉටුකරණ අතර තුර 1976.02.05 වන දින කපිතාන් නිළයට උසස් වීම් ලබා 1976.07.01 දින දක්වා එම තනතුරෙහි රාජකාරි ඉටුකරණ ලදී.

1976.07.02 දින 1 වන ශ්‍රී ලංකා සංඥා බලකායේ විධායක අධිකාරි තනතුරට පත් කපිතාන් ඒඑම්සිඩබ්බී සෙනෙවිරත්න 1977.03.25 දින දක්වා එම තනතුරේ රාජකාරීන් ඉටු කිරීමෙන් අනතුරුව 1977.03.26 දින යුධ හමුදා මූලස්ථානයේ 'ප්‍ර' ශාඛාවේ මාණ්ඩලික නිළධාරි III (ක්‍රියාන්විත/සම්බන්ධීකරණ) වශයෙන් පත්විය. 1978.11.05 වන දින දක්වා යුහමු හි ප්‍රමානි තනතුරෙහි සේවය කිරීමෙන් අනතුරුව නැවතත් ඉන්දියාවේ පවත්වන ලද සංඥා නිළධාරි උපාධි ඉංජිනේරු පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් ලැබූ බැවින් 1978.11.06 දින දිවයිනෙන් බැහැර විය. එතෙර පාඨමාලාව හදාරණ කාලය තුළ එනම් 1980.02.05 වන දින මේජර් නිළයට උසස් කිරීම ලැබ 1981.10.31 දක්වා කාලය තුළ පාඨමාලාව සාර්ථක ලෙස නිම කරන ලදී.

ආරක්ෂක සේනා මූලස්ථානය යාපනයෙහි මාණ්ඩලික නිළධාරි II (ක්‍රියාන්විත) වශයෙන් පත් වීම ලැබූ මේජර් ඒඑම්සිඩබ්බී සෙනෙවිරත්න 1981.11.01 දින සිට 1983.04.04 දින දක්වා එම තනතුරේ සේවය කිරීමෙන් පසු 1983.04.05 දින සිට 1 වන ශ්‍රී ලංකා සංඥා බලකායේ 1 වන බළසණයේ නිළධාරි අණදෙන තනතුරේ රාජකාරීන් ඉටු කිරීම සඳහා ඒකකය වෙත රපෝර්තු කරන ලදී. 1984.03.13 දින දක්වා 1 බළසණයේ නිළධාරි අණදෙන තනතුරේ රාජකාරි ඉටු කිරීමෙන් පසු 1984.03.14 දින දක්වා නැවත එතෙර පාඨමාලාවක් හැදෑරීම සඳහා දිවයිනෙන් බැහැර විය. 1984.12.28 දින දක්වා කාලය තුළ බංග්ලාදේශයේ අණ හා මාණ්ඩලික පාඨමාලාව ඉතා සාර්ථක ලෙස නිම කුල මේජර් ඒඑම්සිඩබ්බී සෙනෙවිරත්න, පීඑස්සී යුධ හමුදා මූලස්ථානයේ 'ප්‍ර' ශාඛාවේ මානි II (සැලසුම් හා පුහුණු) වශයෙන් 1984.12.29 දින සිට 1985.02.17 දින දක්වාත් කොළඹ මෙහෙයුම් ආඥාපති කාර්යාලයේ ප්‍රමානි II (ක්‍රියා) වශයෙන් 1988.10.22 දින සිට 1990.01.04 දින දක්වාත් කොළඹ මෙහෙයුම් ආඥාපති කාර්යාලයේදී ප්‍රමානි වශයෙන් 1988.10.02 දින සිට 1990.01.14 දින දක්වා ද එවකට රටේ උද්ගතව පැවතුනු වාතාවරණයට මුහුණ දීම සඳහා අනුපමේය සේවයක් ඉටු කරන ලදී. රට ජාතිය වෙනුවෙන් කරන ලද එම නිකැළැල් සේවය ඇගයීම වස් 1988 දී උත්තම සේවා පදක්කමෙන් පිදුම් ලැබූ අතර 1988.10.16 දින ලුතිතන් කර්නල් නිළයට උසස් කරනු ලැබීය.

# ශ්‍රී ලංකා සංඥා බලකාය
## 61 වන ජන්ම දිනය
## මෙසේ සැමරූ වගයි...



බලකාධිපති සම්මාන මුරය
බ්‍රිගේඩියර් වයිඑස්වී ද සිල්වා යූඑස්පී පීඑස්සී



රණවිරු ස්මරණය
දිවිදුන් රණවිරුවන්ගේ ලඟම ඥාතීන්



රණවිරුවන්ට මල් මිටක්
නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල්
එච්එම්සීඩබ්ලිව් සෙනෙවිරත්න යූඑස්පී එන්ඩීසී පීඑස්සී



දිවිපිදූ රණවිරුවන්ට උත්තමාචාරය



The SIGNALLER



61 [illegible] සංඥා දානමාව
රණවිරු ලඟම ඥාතීන්ගේ සහභාගිත්වයෙන්





සියලු නිලයින් සමඟින් දිවා ආහාරය



නිලධාරී සාදය



# 1 SLSC





The SIGNALLER

# 1 වන සංඥා බළකායේ පසු ගිය වසරක මතක සටහන්

1943 ඔක්තෝම්බර් මස 19 දින ආරම්භ කරන ලද 1 වන ශ්‍රී ලංකා සංඥා බළකාය සිය සාඩම්බර 62 වන සංවත්සරයට පා තැබීමට සූදානම් වෙමින් සිටී. මෙම අඩසියවසකටත් වැඩි කාලය තුල 1 වන සංඥා බළකාය මගින් ශ්‍රී ලංකා යුද හමුදාවට ඉටු කරන ලද සේවය අතිමහත්ය. 1 වන ශ්‍රී ලංකා සංඥා බළකා මෑණියන්ගේ පසුගිය සය මස තුල සිදුවූ විශේෂ අවස්ථා මෙසේ පෙල ගස්වමු.

- 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකායට අඩුවක්ව තිබූ නිළධාරී නිවස්නය ඉදිකිරීම සඳහා 2001.12.01 දින මුල් ගල තබා එහි මූලික වැඩ කටයුතු ආරම්භ කරන ලදී. එවකට අණදෙන නිළධාරීව සිටි ලුතිතන් කර්නල් ඩී ඒකනායක ඒකක අණදෙන නිළධාරී තනතුරෙහි වැඩකටයුතු නිමාකර නික්ම යාම වෙනුවෙන් 2004.12.26 දින සම්මාන පෙළපාලියක් පැවැත්වූ අතර, 1 වන සංඥා බළකායේ නව අණදෙන නිළධාරී ලෙස ලුතිතන් කර්නල් එම්ටී වෛද්‍යරත්න 2005.01.18 වන දින වැඩ භාර ගැනීම සිදුකල අතර, නව අණදෙන නිලධාරීතුමා වෙත සම්මාන පෙළපාලියක් ද පවත්වන ලදී.

- 2004.12.26 දින මුලු මහත් දකුණු ආසියානු කලාපයටම තර්ජනයක් හා ව්‍යසනයක් කැදවා සුනාමි ඛේදවාචකයට ලක්ව අවතැන්වූ 1 වන සංඥා බළකායේ සෙනීන්ගේ හා ඔවුන්ගේ ඥාති හිත මිත්‍රාදීන්ගේ තොරතුරු සොයා බැලීම සඳහා 1 වන සංඥා බළකාය වෙතින් විශේෂ වූ වැඩ කටයුතු රාශියක් සූදානම් කරණ ලදී. එහිදී 2004.12.30 දින නිළධාරියෙකුගෙන් සහ සෙසුනිළයින්ගෙන් සමන්විත කණ්ඩායමක් වියලි ආහාර සහ අනෙකුත් මූලික අවශ්‍යතා සපුරාලමින් ඔවුන්ගේ ඉදිරි සුභසාධක කටයුතු සොයා බලන ලදී.

- 2005.01.23 දින 1 වන සංඥා බළකායේ නිළධාරීන්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් සුනාමි සහන සේවය සඳහා එම ප්‍රදේශයන්වෙත පිටත්කර යැවීන.

- 1 වන ශ්‍රී ලංකා සංඥා බළකායේ අණදෙන නිළධාරී තුමා ඇතුළු සෙසුනිළ මඬුල්ලක් 2005.03.27 දින ව්‍යසනයට පත්වූ ප්‍රදේශයන් වල සෙනීන්ගේ තොරතුරු සොයා බැලීම සඳහා සංචාරයක නිරත වන ලද අතර, එහිදී එම අදාල සෙනීන්ගේ අවශ්‍යතාවයන් හඳුනාගෙන ඒ සඳහා විධිමත් පිලියම් සකසන ලදී.

- 2005.04.07 දින රෙජිමේන්තු සේනා විධායකගේ කඳවුරු සංචාරය වෙනුවෙන් සම්මාන මුරයක් පවත්වන ලද අතර, එදින සේනාවිධායක තුමා විසින් මෙම ඒකක සෙනීන් අමතන ලදී.

- 2004.09.13 දින පුහුණුවීම් ඇරඹූ ආධුනික පුහුණු පාඨමාලා අංක 05 යටතේ පුහුණුව ලැබූ ආධුනික සෙනීන් 146 ක් පුහුණුව නිමාකර මූලික සංඥා පුහුණු පාඨමාලාවද සාර්ථකව නිමා කිරීමෙන් පසු 2005.02.24 දින විසිර යාමේ උත්සවය 3 වන ශ්‍රී ලංකා සංඥා බළකායේදී පවත්වන ලදී.

- වෙසක් උත්සවය වෙනුවෙන් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව මගින් මින්නේරිය පාබල පුහුණු මධ්‍යස්ථාන ක්‍රීඩාංගනයේදී පවත්වනු ලැබූ විවෘත මහා වෙසක් පහන් කූඩු තරගය සඳහාද පළවන ශ්‍රී ලංකා සංඥා බළකාය විසින් ඉමහත් ආකර්ශනීය වෙසක් පහන් කූඩුවක් ඉදිරිපත් කරන ලද අතර, දැඩි තරගකාරීත්වයකින් පසු ඒකක නිර්මාණය සඳහා තරගකරුවන් 13 දෙනෙකු අතරින් 4 වන ස්ථානය හිමිකර ගන්නා ලදී.

- 2005.06.06 දින සිට ආධුනික පුහුණු පාඨමාලා අංක 06 යටතේ ආධුනිකයන් 40 ක් පුහුණු කිරීම සඳහා ඒකකය වෙත වාර්ථා කරන ලද අතර ඔවුන් මේ වන විට සාර්ථකව පාඨමාලාව හදාරමින් සිටී.

61 වසරක තේජාන්විත ඉතිහාසයකින් හෙබි සංඥා බළකායේ මිණිපහන වූ 1 වන සංඥා බළකා මෑණියන් සදාකල් දිලේවායි පතමු.

ලුතිතන් වල්අයියු ලොකුසූරිය
1 රෙජි ශ්‍රී ලංකා සංඥා බළකාය
මින්නේරිය






The SIGNALLER

# 3 වන රෙජිමේන්තුව
## ශ්‍රී ලංකා සංඥා බළකායේ සාඩම්බර ගමන් මග

1. ශ්‍රී ලංකා යුධ හමුදා සංඥා බළකායේ 3 වන සංඥා රෙජිමේන්තුව 1989 මාර්තු මස 09 වන දින 2 වන සේනාංකය කේන්ද්‍ර කොටගෙන ඉපැරණි ඓතිහාසික පූජනීය නගරයක් වූ අනුරාධපුරය ආශ්‍රිතව ස්ථානගත විය. මෙම ඒකක කුමරුගේ පළමු නියමුවා වූයේ අණදෙන නිළධාරී ලුතිතන් කර්නල් ඩබ්ලිව්. පෙරේරා වන අතර එම අවධියේදී සුළු නිළධාරීන් සෙසු නිළයින් පිරිසකගේ අපරිමිත ධෛර්‍යයෙන් ජනිතවූ මෙම රෙජිමේන්තුව උතුරු නැගෙනහිර ප්‍රදේශයේ ගුවන් විදුලි සම්බන්ධතාවයන් පවත්වා ගැනීම ඉතා හොඳින් සිදු කරන ලද අතර දැනට මූලස්ථාන හට පිරිස් වල සංකීර්ණත්වය හා සංඥා බළසේනාවේ ව්‍යාප්තිය සමගම උතුරුකරයේ යම් යම් ප්‍රදේශ දක්වා සංඥා සම්බන්ධීකරණයන් මනා අයුරින් කරගෙන යනු ලැබේ.

2. තවද රටේ පැවතුනු වාතාවරණය මත තම සංඥා වෘත්තීන්ට අමතරව මෙම රෙජිමේන්තුවේ නිළධාරී / සෙසු නිළයින් 5 ශ්‍රීලංසංබ, 6 ශ්‍රීලංසංබ යන ආධාරක බළඇණිවලද, 214 බසේමු යටතේ අභ්‍යන්තර ආරක්ෂක රාජකාරී අනුඛණ්ඩයක් ලෙසද රණශූරත්වයෙන් යුතුව ක්‍රියාන්විත රාජකාරී කාර්‍යක්ෂමතාවයකින් යුතුව සිදුකරගෙන යනු ලැබේ.

3. විශේෂයෙන් මෙම ඒකකයේ නිළධාරී / සෙසු නිළයින් ක්‍රිඩාවෙන්ද යුද හමුදා හා ජාතික කණ්ඩායම් මළල ක්‍රීඩා හා පිටියේ ක්‍රීඩා සඳහාද නියෝජනය කිරීම කර තම ඒකක නාමය දිග්විජය පතුරා ඇති බැව්ද සතුටින් ප්‍රකාශකල හැකිය.

4. මීට අමතරව ඒකකයේ නගා සිටුවා ඇති බීකන්ස් සංගීත කණ්ඩායම හා යුද හමුදා වැටූ සංදර්ශණය සඳහා සහභාගී වන මෙම ඒකක ධාවන පැදිකරුවන් නිසාද යුද හමුදාවේ හා සිවිල් ජනතාවගේද ජනාදරයට පත්වී ඇති බව සතුටින් පැවසීමට හැක.

5. මෙවර 16 වන සංවත්සරික උත්සවයද අප රට මුහුණ පෑ සංවේගජනක සුනාමි ව්‍යසනය නිසා ඉතා චාම් ලෙස සිදුකල අතර එහිදී වත්මන් නියමුවා වන මේජර් සීඑම්ඩීපී චන්ද්‍රසේකර හට පිරිනැමුනු සම්මාන මුරයක් හා සම්මාන පෙළපාලියක් සහ සියළු නිළයින්ගේ දිවා භෝජන සංග්‍රහයක්ද 2005.03.09 දින පවත්වා සංවත්සරික උත්සවය සිදුකරන ලදි.

6. දේශයේ භෞමික අඛණ්ඩතාවය උදෙසා තම ජීවිත පූජාකල උදාරතර රණවිරුවන් හා සුනාමි ව්‍යසනයෙන් විපතට පත් සියළුම රටවැසියන්ටත් යුධ හමුදා අයවලුන්ටත් විශේෂයෙන්ම 3 ශ්‍රීලංසංබට අයත් සියළුම අයවලුන්වත් සිහිකරමින් ඔවුන්ට පිං පැමිණවීම උදෙසා බෝධි පූජාවක් ජය ශ්‍රී මහා බෝධි රාජයාණන් වහන්සේ අභියසදී අණදෙන නිළධාරී ඇතුළු සියළු නිළයින්ගේ ප්‍රධානත්වයෙන් පහන් සිතුවිලි ඇතිව සිදු කරන ලදි.

7. තවද විශේෂයෙන්ම සිහිපත් කල යුතු කරුණක් වන්නේ ශෝකයෙන් හා භීතියෙන් රටම මුසපත්වූ සුනාමි ව්‍යවසනයට මෙම ඒකක අයවළුන්ට කල හැකි දායකවීමක් වශයෙන් ක්‍රියාන්විත ප්‍රදේශ වලද නිළයින්ගේ සහභාගිත්වයෙන් නිළධාරී සහ සෙසුනිළයින් 50 ක් පමණ පිරිසකගේ සහභාගිත්වයෙන් කතරගම පූජනීය පෙදෙස තුලදී කතරගම කිරිවෙහෙරට අටපිරිකර පූජාව, කතරගම දේවාලේ දේව පූජාව, මියගිය රණවිරුවන්ට හා සුනාමියෙන් මියගිය අයවළුන්ට පිං පැමිණවීම, ඒකක ධජයන්ට සහ 3 ශ්‍රීලංසංබ ඒකක සියළු හට පිරිස් සඳහා සෙත්පැතීමද, දකුණු ප්‍රදේශයේ සංඥා ඒකක වල සුනාමියෙන් අලාභහානි වූ පවුල් වල නිවෙස් වලට ගොස් පුද්ගලිකවම ඔවුන්ගේ විස්තර විමසා මානසික තත්වය ගොඩ නැගීමටද දායක වූ බව කිව යුතුවේ.

8. අවසාන වශයෙන් 3 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකායේ මෙතෙක් ආ ගමනේ සාර්ථකභාවයට ජීවය ලබාදුන් සියළුම අණදෙන නිළධාරීවරුන් හා රෙජිමේන්තු සැරයන් මේජර් වරුන් සෙසුනිළයින්ද ජීවිත කැප කල ඒකක රණවිරුවන්ද සිවිල් සේවක අයවළුන්ද ගෞරවයෙන් සිහිපත් කරන අතර 3 වන සංඥා බළකා මෑණිය දිනෙන් දින දියුණුවේවායි කියා එක සිතින් ප්‍රාර්ථනා කරන්නෙමු.

# 3 රෙජි ශ්‍රීලංසංබ 16 වන සංවත්සරය නිමිතිකොටගෙන සුනාමියෙන් විපතට පත්වූවන්ට සෙත් පැතීමේ පිංකම් පැවැත්වීම



1. 3 වන රෙජිමේන්තුව සංඥා බළකායට වසර 16 ක් පිරීම නිමිත්තෙන් 2005.03.09 දිනට 16 වන සංවත්සරය යෙදී තිබුණි. මෙවර සංවත්සර උත්සවය 2004.12.26 දින රටේ ඇතිවූ ව්‍යවසනකාරී තත්වය හමුවේ ආගමික වතාවත් වලට මුල්තැන දෙමින් ඉතාමත් චාම් අන්දමින් සමරන්නට යෙදුනි.

2. අප ඒකකයේ සංවත්සරික උත්සවය මුල්කරගෙන ඒකක අණදෙන නිළධාරීගේ අනුමැතිය මත මේජර් ඩබ්ලිව්එන් ජයසිංහ ආර්ඩබ්පී ආර්එස්පී වන මා හා ඒකකයේ විධායක අධිකාරී වන කපිතාන් ටීඑස් ලියනගුණවර්ධන යන නිළධාරී ඇතුළු නිළධාරීන් සහ සෙසුනිළයින් 45 දෙනකු පමණ 2005.03.29 දින 3 ශ්‍රීලංසංබ අනුරාධපුරයේ සිට කතරගම දක්වා ගමන් අරඹන ලදී. මෙම ගමනේ අරමුණ වුයේ සුනාමි ව්‍යසනයෙන් මෙම ඒකකයට අයත් මියගිය සහ විපතට පත්වූවන්ට පිංපැමිණවීම, සෙත් පැතීම හා අනෙකුත් සංඥා ඒකකයන්ගේද, සමස්ථ යුද හමුදාවේද සියලු ලක් වැසියන්ගේද මියගිය විපතට පත් අයවලුන්ට පිංපැමිණවීම සහ සෙත් පැතීමයි.

3. අප ඒකක අයවලුන් විසින් ගමන් අරඹන ලද කතරගම ගමන සඳහා මෙම ඒකකයේ දැනට ක්‍රියාන්විත ප්‍රදේශවල රාජකාරීන්හි නියතු අයවලුන්ද බොහෝ සංඛ්‍යාවක් සහභාගී කරවා ගන්නා ලදී. මෙම ගමන අනුරාධපුර සිට කතරගම දක්වා ගමන් ගැනීමේදී මෙම ඒකකයට අයත් සහ අනෙකුත් සංඥා ඒකකයන්ට අයත් සුනාමි ව්‍යවසනයෙන් විපතට පත් අයවලුන්ගේ නිවෙස් වෙත ගොස් පුද්ගලිකවම ඔවුන් හා කථාබහ කර ඔවුන්ගේ සුවදුක් අපද බෙදා ගන්නා ලදී. මෙම ඒකක භට පිරිස් ඔවුන්ගේ නිවෙස් වෙත ගොස් ඔවුන්ගේ සුවදුක් විමසා බැලීමේදී ඔවුන්ගේ සිත්වල වූ දුක් කම්කටොලු මද වේලාවකට හෝ ඉවතලා සතුටට පත්වූ බවද අපහට දැනගන්නට ලැබුණි.

4. මෙම ඒකක අයවළුන් විසින් කතරගම බලා ගමන් ගැනීමේ ප්‍රධානතම අරමුණ වූ විපතට පත්වූවන්ගේ සුවදුක් විමසා බැලීමෙන් පසු කතරගම පූජා භූමිය වෙත 2005.03.30 දින අලුයම වන විට පැමිණීමට හැකි විය. ඉන් අනතුරුව කතරගම පූජා භූමියේදී මෙම ඒකකයෙන් සහභාගී වූ සියලු අයවළුන් විසින් පහත සඳහන් ආගමික වතාවත් සිදු කරන ලදී.

   i. කතරගම කිරිවෙහෙරට අටපිරිකර පූජා කිරීම.
   ii. කතරගම දේවාලයේ දේව පූජාව.
   iii. මියගිය රණවිරුවන්ට හා සුනාමියෙන් මියගිය අයවලුන්ට පිං පැමිණවීම.
   iv. ඒකක ධජයට හා 3 ශ්‍රීලංසංබ ඒකක සියළු භට පිරිස් සඳහා සෙත් පැතීම.

5. අප විසින් ඉහත දක්වා ඇති සියළු ආගමික වතාවත් සිදුකර සියලු භට පිරිස් සමග 2005.03.31 දින නැවත ඒකකය වෙත පැමිණියෙමු.

**නි/61892 මේජර් ඩබ්ලිව්එන් ජයසිංහ ආර්ඩබ්පී ආර්එස්පී**
බළසේනාධිපති මූලස්ථාන බළසේනාව
3 ශ්‍රීලංසංබ





## ආසෙමු (වන්නි) ආඥාපති තුමාගේ 3 ශ්‍රීලංසංබ කඳවුරු සංචාරය - 2005.01.26 දින



ආඥාපති තුමාගේ කඳවුරු සංචාරය අවසානයේ ඒකක සමරු පොතෙහි සටහන් තබනු ලබන අවස්ථාව

මෙම කඳවුරු සංචාරයේදී ආසෙමු(ව) ආඥාපති මේජර් ජෙනරාල් පීවීඑස්බී කුලතුංග ආර්එස්පී යූඑස්පී විසින් කඳවුරු භූමිය පරීක්ෂාවට ලක් කරන ලද අතර කඳවුර අලංකාරවත්ව ඉතා පිරිසිදු තත්වයෙන් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ආඥාපතිතුමාගේ ප්‍රශංසාව ඒකක අණදෙන නිලධාරී සහ රෙජිමේන්තු සැරයන් මේජර් ඇතුළු සියළුම නිලධාරීන් සහ සෙසුනිළයින් වෙත පිරිනමන ලදී.

සෙ/66262 බෂි 11 සුනිල් ධනසිරි
ප්‍රධාන ලිපිකරු - 3 ශ්‍රීලංසංබ



2005.06.11 දින යුධ මාණ්ඩලික විද්‍යාලය සිසුන් සඳහා පැවති සේනාංක පාලන පෙළදක් (තිසාවැව) 3 ශ්‍රීලංසංබ විසින් ඉදිරිපත් කළ සංඥා මධ්‍යස්ථානය














The SIGNALLER

# 4 වන රෙජිමේන්තුව

## ශ්‍රී ලංකා සංඥා බලකායේ 14 වන සංවත්සරය 2005.06.05 දින අභිමානයෙන් යුතුව සැමරූ වගයි.

1 වන සංඥා මණ්ඩියන්ගේ තුරුලේ වැඩුණු පිරිසක් ඉන් මිදී යුද හමුදාවේ පුළුල් ව්‍යාප්තවීමත් සමග 4 වන සංඥා රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය නමින් තවත් සංඥා ඒකකයක් හැටියට වර්ෂ 1991 ජුනි මස 05 දින සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය පනාගොඩ හිදී නගා සිටුවා සමාරම්භක උත්සවයකින් පසු මහනුවර බූවැලිකඩ කඳවුරේ ප්‍රථමයෙන් ස්ථානගත විය. එතැන් පටන් මේ දක්වා පසුගිය වසර 14 ක කාලයක් අණදුන් අණදෙන නිලධාරීන් පිළිවෙලින් කෘතඥපූර්වකව අභිමානයෙන් යුතුව පහත සඳහන් පිරිදි සනිටුහන් කරමි.

| | | |
|---|---|---|
| ලුතිනන් කර්නල් | එච්එම් | චිත්‍රරන්ජන් |
| ලුතිනන් කර්නල් | වයිඑස්ඒ ද | සිල්වා පීඑස්සී |
| ලුතිනන් කර්නල් | එස්ජීපීපී | සමරසිංහ ආර්එස්පී |
| මේජර් | සී | වීරතුංග |
| ලුතිනන් කර්නල් | එච්එම්එච්ඒ | හේරත් එම්එස්සී පීඑස්සී |
| ලුතිනන් කර්නල් | ඒටී | ඛානගොඩ අර්එස්පී |
| මේජර් | ඒආර් | සමරසිංහ |
| මේජර් | ජේඑන් | වික්‍රමආරච්චි |
| මේජර් | එන්එම් | හෙට්ටිආරච්චි පීඑස්සී |
| මේජර් | එඑපී | සෙනෙවිරත්න |
| මේජර් | එන්එම් | හෙට්ටිආරච්චි පීඑස්සී. |
| ලුතිනන් කර්නල් | එන්එම් | හෙට්ටිආරච්චි පීඑස්සී |
| මේජර් | කේඑම්ආර්පී | කරුණාතිලක පීඑස්සී |
| ලුතිනන් කර්නල් | කේඑම්ආර්පී | කරුණාතිලක පීඑස්සී |



නව අණදෙන නිලධාරී සුභ මොහොතින් වැඩ ඇරඹූ වගයි.

ඉහත දක්වා ඇති අණදෙන නිලධාරීන්ගේ පූර්ණ කැපවීම යටතේ ගොඩ නැගුණු මෙම බලකායේ 2005.06.05 දිනට යෙදුන 14 වන සංවත්සරයේ පළමු අධියර ලෙස ස්වාමීන් වහන්සේලා 17 නමක් දර්ශණීය පෙරහැරකින් ඒකකය වෙත වඩම්මවා සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනයක් පවත්වා පසුදින සංඝගත දක්ෂිණාවක් පිරිනමන ලදී. ඒකකයේ මතු සෞභාග්‍යය අපේක්ෂාවෙන් හා තුණුරුවන්ගේ ආශිර්වාදය මැද්දේ සාංවත්සරික කටයුතු මෙසේ ආරම්භ කර අන්‍ය ආගමික කටයුතු වශයෙන් කෝනේෂ්වරන් කෝවිල යාපනය, සාන්ත මරියා දේවස්ථානය යාපනය හිදි පුණ්‍ය කටයුතු සිදුකරන ලදී.

ඒකක කඳවුරේ බෝ සමිඳුන් සිපගෙන හමන මඳ සුළඟින් ඒකක ධජය ලෙලදෙද්දී 2005.06.05 දින රෙජිමේන්තු සෙබළුන් විසින් අණදෙන නිලධාරී තුමන් වෙත පිරිනමන ලද උත්තමාචාරය කාගෙත් සිත් ඇද ගැනීමේ දසුනක් විය. එවන් විචිත්‍රවත් සම්මාන මුරයක් හා සම්මාන පෙළපාලියක් අණදෙන නිලධාරීතුමන් වෙත පිරිනැමීමෙන් පසු එදින සියළු සෙසුනිල භෝජන සංග්‍රහයක් ද පවත්වන ලදී. තවද කඳවුරු භූමියේ ස්ථාපිත බෝමළුවේ සිට බෝධි පූජාවක් පවත්වා ආශිර්වාදය ද ලබා ගන්නා ලදී.

2005.06.07 දින සෙසුනිල සුහද හමුව වීරාගත පොල්තෙල් පහන දල්වා ඒකක සෞභාග්‍ය හා චිරසාර සාමය අපේක්ෂා සහගතව ආරම්භ කරමින් සියළු නිළයින්ගේ සුහද හමුව පවත්වන ලදී. මෙහිදී බලසණ අතර පැවැති



• ඒකක දිනය වෙනුවෙන් පැවති ආගමික වතාවත් හි යෙදෙමින්




අණදෙන නිළධාරී සඳහා පැවති සම්මාන පෙළපාළිය



සමූහ ඡායාරූපය

අවසන් ක්‍රිකට් තරගයද, මෙදිනට පෙර පැවැති අත්පන්දු හා පාපන්දු ක්‍රීඩා වලින් ජයගත් ජයග්‍රාහක කණ්ඩායම් වෙත ත්‍යාග ලබාදීම ද සෙබළුන් ඒකාකාරී බවෙන් මුදවා නිරෝගි ශාරීරික යෝග්‍යතාවය පවත්වා ගැනීමට දුන් අත්වැලක් හැටියට රෙජිමේන්තුවේ ඉදිරියට ක්‍රීඩා ක්ෂේත්‍රය නංවාලීමට ද එමගින් අපේක්ෂා කරන ලදී.

ඉන්පසු 2005.06.08 දින රෙජිමේන්තුවේ බනි/සැරයන් නිවස්නයේ සාදයක් පවත්වා ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරීන්ගේ අන්‍යොන්‍යය සුහදතාවය නංවාලීම 14 වන සංවත්සරය වෙනුවෙන් සිදුකරන ලද තවත් කාර්‍යයකි. 14 වන සංවත්සර කටයුතු වල අවසාන අධියර ලෙස නිලධාරී නිවස්න සුහද හමුව 2005.06.14 දින



වයන පදට පා තැබීම



ක්‍රීඩාව තුළින් සාමූහිකත්වය



The SIGNALLER



බනි සැර නිවස්නයට ආරාධනා ලැබ

මෙම රෙජිමේන්තුවේ වර්ෂ 14 ක පසුගියාව දෙස බැලීමේදී රෙජිමේන්තුව විසින් ලක්මාතාවට ඉටුකර ඇත්තේ ප්‍රශංසනීය සේවාවකි. වත්මන් සාමකාමී වාතාවරණය ඔස්සේ වුවද සේනාංක 04 ක හා බලසේනා 19 ක ඇතුළු එම බලසේනා අණසක යටතේ ඇති බළඇණි 54 ක සංඥා සම්බන්ධතාවය යාපනය බල ප්‍රදේශය තුළ පමණක් උසස් අයුරින් ඉටුකිරීම එයට කදිම නිදසුනකි. ඊට අමතරව දිවයිනේ නන්දෙස සංඥා රාජකාරි හා පොදු රාජකාරි ඉටුකරමින් සිටී.

තවද හයිටි රාජ්‍යයේ සාමසාධක හමුදා රාජකාරීවල යෙදීමේ පළමු ඛණ්ඩයක් ලෙස පහත සඳහන් අයවළුන් එම රාජ්‍ය වෙත රපෝර්තු කරවා එම රාජකාරි සාර්ථකව නිමා කර දිවයිනට පැමිණ සිටීම ඒකකයට තවත් ප්‍රණාමය ගෙනදෙන කරුණකි.

නි/63167 කපිතාන් එස්ඩීඑස්එස් කරුණාරත්න
සෙ/275630 කෝප්‍රල් අබේරත්න ටීඑස්
සෙ/275649 කෝප්‍රල් සිසිරකුමාර කේ
සෙ/66760 සැරයන් රත්නායක ආර්එම්එස්කේ
සෙ/275643 කෝප්‍රල් කඳන්ගම සීඩීකේ

හයිටි රාජ්‍ය සාමසාධක හමුදා රාජකාරි දෙවන කණ්ඩය හැටියට පහත සඳහන් කණ්ඩායමද 2005.05.04 දින විදෙස් ගත වී ඇත.

සෙ/275192 කෝප්‍රල් රත්නායක එස්ආර්එප්පී
සෙ/275201 කෝප්‍රල් වීරාජ් ඕඩබ්ඒපී
සෙ/275350 කෝප්‍රල් බංඩාර පීජීජේ
සෙ/275198 කෝප්‍රල් සමන්කුමාර එස්ජේඑම්
සෙ/275221 කෝප්‍රල් අබේවික්‍රම එස්එම්එම්ර්

මෙම රෙජිමේන්තුවේ 14 වන සංවත්සරය නිමකොට 15 වන වියට පා තබමින් වත්මන් අණදෙන නිලධාරීගේ අණදීම යටතේ රෙජිමේන්තුවේ සියළුම නිලධාරී ඇතුලු සෙසුනිල සියල්ල සෑම අතින්ම සාමූහිකව හා විනය ගරුකව කටයුතු කිරීම රෙජිමේන්තුවේ උන්නතියට මහත් පිටිවහලක් වී ඇති බැව් පෙන්වා දීමට කැමැත්තෙමි. මෙවන් නිහතමානී නායකත්වයකින් ලැබෙන මානුෂික සුවය සෙසු සියල්ලන් ප්‍රබෝධමත්ව රාජකාරි ඉටුකිරීමට හේතු සාධක වී ඇත. මෙමගින් එකමුතු භාවයෙන් හා සාමූහික කැපවීමකින් යුතුව කටයුතු කිරීමේ ප්‍රවණතාවය දිනෙන් දින ඉහළ යමින් පවතී. ඒ අනුව මෙම ඒකකයේ නිරන්තර දියුණුව තවදුරටත් සිදුවන්නට සුභාශිංෂණ කරමි.

**එම්ආර් හමීම්**
කපිතාන්
විධායක අධිකාරී 4 ශ්‍රීලංසංබ



නිළධාරී නිවස්නයේ සාදය



# 5 SLSC (Rft)







11 වන වියට පා තැබූ

# 5 වනසංඥා බළකාය

(ආධාරක බළඇණිය)



සුභ මොහොතින් වැඩ භාරගත් නව අණදෙන නිළධාරී තුමා ආගමික වතාවත් වලට සහභාගී වෙමින්

1994.01.01 දින මේජර් ඊපී ද ඉසෙඩ් අබේසේකර අණදෙන නිළධාරී තුමාගේ නායකත්වයෙන් ආරම්භ කරන ලද 5 වන ශ්‍රී ලංකා සංඥා බළකාය (ආධාරක බළඇණිය) 2005 වසරේදී සිය 11 වන සංවත්සරය සමරන්නේ මහත් වූ අභිමානයෙනි. ගතවූ වසර 11 ක කාලය තුලදී ශ්‍රී ලංකාවේ ඒකීය භාවය ආරක්‍ෂා කිරීම වෙනුවෙන් දිවිපිදූ සහ ආබාධිත තත්වයට පත් ඒකකයේ සියලු රණවිරුවන් මේ මොහොතේදී සිහිපත් කරන්නේ හදපිරි ගෞරව භක්තියෙනි.

ඒකකය පිහිට වූ දින පටන් නැගෙනහිර ප්‍රදේශය තුල ත්‍රස්ථවාදී ක්‍රියාකාරකම් මැඩ පැවැත්වීම උදෙසා ඒකකයේ රණවිරුවන් කල උදාර හා අභීත ක්‍රියාන්විත මෙහෙවර සියලු දෙනාගේම ප්‍රශංසාවට ලක්වී ඇත. යුධමය තත්වය පැවති සමයේ මඩකලපුව බළ ප්‍රදේශයේ ඉටු කරන ලද ක්‍රියාන්විත වලදී ලද ජයග්‍රහණයන් පෙරටුව පසුගිය පොවසර තුලදීද අවබෝධතා ගිවිසුම ආරක්‍ෂා කිරීමේ භාරදූර වගකීම දරමින් ඒ සඳහා උරදී කටයුතු කරන ආකාරයද පැසසුමට ලක් කරන බව සඳහන් කරමි.

2005 ජනවාරි මස 02 වන දිනට යෙදී තිබූ ඒකකයේ 11 වන සංවත්සර උත්සව මාලාව 2004 දෙසැම්බර් මස 26 වන දින සිදුවූ සුනාමි ඛේදවාචකයත් සමග අවලංගු කිරීමට සිදුවූ අතර එහිදී දැනට බළඇණිය ස්ථාන ගත වාලච්චේන නාවල්අඩි බළ ප්‍රදේශය තුළ සිදුවූ අතිමහත් ව්‍යසනයේදී ඒකක භට පිරිස් මහත් කැපවීමෙන් ක්‍රියා කල බවද සඳහන් කරනු වටී. සුනාමි තත්වයේදී විනාශයට පත්වූ 232 බසේමු කල්කුඩා කඳවුර 6/7 ගැජෙබ මාන්කර්නි කජුවත්ත යන කඳවුරු වල භට පිරිස් හා ප්‍රදේශයේ සිවිල් මහජනතාව බේරා ගැනීමේ කටයුතු වලදී අප ඒකකය මහත් කැපවීමෙන් කටයුතු කරන ලදි. පශ්චාත් සුනාමි අවධියේදී ප්‍රදේශයේ අනාථ කඳවුරු භාරව කටයුතු කරමින් හා ආධාර බෙදා හැරීම සඳහා සිවිල් සංවිධාන වලට මග පෙන්වමින් ඒකක අණදෙන නිළධාරී සහ අනෙකුත් නිළධාරී සෙසුනිළයින් සිදුකල මෙහෙයද පැසසුම් කටයුතුය.

ගෙවී යන වසරේදී ඒකකය තුල සිදුවූ වැදගත් සිදුවීම් ලෙස ඒකක අණදෙන නිළධාරී වශයෙන් 2002.12.20 දින සිට වසර 02 කට අධික කාලයක් කටයුතු කල මේජර් එම්ටී වෛද්‍යරත්න තනතුර අත් හැරීම හා ඒකකයේ 08 වන අණදෙන නිළධාරී වශයෙන් මේජර් එච්පී සෙනෙවිරත්න 2005.01.27 දින වැඩ භාරගැනීමත් සිදුවිය. එමෙන්ම 2005.05.13 දින සිට නව අණදෙන නිළධාරී තුමා මේජර් නිළයේ සිට ලුතිතන් කර්නල් දක්වා උසස්වීම් ලැබීමද සිදුවිය.

ඒකක සෙනින්ගේ දැනුම නංවාලීම සඳහා මෙම වසරේදී ප්‍රථම වරට මූලික සංඥා පාඨමාලාවක් 2005.04.02 දින සිට ඒකකය තුල ආරම්භ කරන ලදි. දැනට සෙනින් 39 දෙනකු සාර්ථක අයුරින් මෙම පාඨමාලාව හදාරමින් සිටින අතර ඒකක අණදෙන නිළධාරී තුමාගේ සහ උපදේශක මඩුල්ලේ කැපවීම මෙහිදී කැපී පෙනේ.

තවද 2005 වසරේදී සංඥා රෙජිමේන්තුව පවත්වන ලද අන්තර් ඒකක සරඹ තරගාවලියේදී අන් සියලු ඒකක අභිභවා 5 වන ශ්‍රී ලංකා සංඥා බළකාය වෙතින් ඉදිරිපත් කරන ලද බණ්ඩය විසින් එම ශූරතාවය දිනා ගන්නා ලද බව මහත් අභිමානයෙන් යුතුව ප්‍රකාශ කරමි. එහිදී අණදෙන නිළධාරී ප්‍රමුඛව උපදේශක මඩුල්ලේ හා බණ්ඩ භාර නිළධාරී වශයෙන් කටයුතු කල කපිතාන් බීවම් ජයවීර ප්‍රමුඛ සරඹ බණ්ඩයේ සියලු නිළයින්ගේ කැපවීම මෙහිදී සඳහන් කරනු වටී.

ගෙවී ගිය වසර 11 ක කාලය තුලදී අනෙකුත් පාබල ඒකකයන් සමග උරෙනුර ගැටෙමින් තම රාජකාරි ඉතා සාර්ථකව ඉටු කරමින් 5 වන ශ්‍රී ලංකා සංඥා බළකාය ලක්මවට සිදුකරන ලද විශිෂ්ඨ සේවය අනාගතයේදීත් උපරිම ලෙස ඉටුකිරීමට ශක්තිය ධෛර්යය ලැබේවායි ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

ලුතිතන් ජේඑස්පීකේ ජයලත්
5 ශ්‍රීලංසංබ

# 2005 වසරේ අන්තර් සංඥා ඒකක සරඹ තරගාවලියේ ශූරතාව දිනූ
## 5 ශ්‍රීලංසංබ සරඹ ඛණ්ඩය



නි/62840
කපිතාන් ඩීඑම් ජයවීර



සෙ/66162
බහි 1 ඩීඑම්ඩබ්යූබී මඩවල
රෙජිමේන්තු සැරයන් මේජර්



සෙ/66298
බහි 11 ජයවර්ධන කේ
සරඹ උපදේශක

<u>සෙසු පිරිස</u>

| | | | |
|---|---|---|---|
| සෙ/275712 | සැරයන් | හේරත්බංඩා | එච්එම් |
| සෙ/275727 | සැරයන් | රාජකරුණා | ආර්එම්ඒජේ |
| සෙ/275745 | සැරයන් | මහවඩුගේ | එම්ඒවල් |
| සෙ/275786 | සැරයන් | වන්නිගම | ඩබ්පීඑස්පී |
| සෙ/275791 | සැරයන් | ප්‍රේමචන්ද්‍ර | ඒපීයූපී |
| සෙ/275705 | කෝප්‍රල් | විමලසේන | ඊඒඑන් |
| සෙ/276138 | කෝප්‍රල් | සෝමසිරි | එස්කේ |
| සෙ/276044 | ලා/කෝ | විජේරත්න බංඩාර | කේඑම් |
| සෙ/276101 | ලා/කෝ | රණවීර | ඩීපී |
| සෙ/276192 | ලා/කෝ | සිසිර කුමාර | පීඒ |
| සෙ/276705 | ලා/කෝ | රූපසිංහ | කේපීඒ |
| සෙ/276953 | ලා/කෝ | ප්‍රේමරාජසිංහ | කේකේපීජී |
| සෙ/276041 | සංසෙ | ජයසිරි | ඩීජී |
| සෙ/276125 | සංසෙ | ජයරත්න | ජේ |
| සෙ/276180 | සංසෙ | ඥානසේන | එම්යූඒ |
| සෙ/277218 | සංසෙ | නවරත්න | එච්ආර් |
| සෙ/277447 | සර්සෙ | දිසානායක | පීපීබී |
| සෙ/277455 | සංසෙ | ජයසේන | ඒපීපීඑස්කේ |
| සෙ/277587 | සංසෙ | සිරිවර්ධන | එස්එම්එස්කේ |
| සෙ/277594 | සංසෙ | විමලරත්න | ඩබ්පී |
| සෙ/278527 | සංසෙ | වෙදගේ | ඩබ්එස් |
| සෙ/278549 | සංසෙ | සුසන්ත | පීඑස් |
| සෙ/278602 | සංසෙ | දිසානායක | ඩීඑම්එස්කේ |
| සෙ/278916 | සංසෙ | විජේතිලක | ඒසීඑස් |
| සෙ/279002 | සංසෙ | ජයතිස්ස | ආර්බී |
| සෙ/279026 | සංසෙ | තිලකරත්න | ඒඩබ්එම්සීපී |
| සෙ/279039 | සංසෙ | ක්‍රිෂාන්කුමාර | එච්ඩබ් |
| සෙ/279048 | සංසෙ | ප්‍රේමසිරි | කේඑම්ආර් |
| සෙ/279054 | සංසෙ | ඉන්දික කුමාර | ආර්පී |
| සෙ/279061 | සංසෙ | හේරත් | එච්එම්එන්බී |
| සෙ/279074 | සංසෙ | කුමාර | එච්ඩබ් |
| සෙ/280468 | සංසෙ | කුමාර | පීජේ |





# දිරියෙන් ජයගත් රණවිරුවන්



1. 1977.10.24 දින ඇඹිලිපිටිය වලල්ගොඩ ප්‍රදේශයෙන් උපත ලැබූ හේවා හතුරුගේ කුලතුංග නම්වූ ළදරුවා ර/ඇඹි/වලල්ගොඩ විදුහලේ සිප් සතර හදාරා රටෙහි පැවති යුද්මය වාථාවරණය මධ්‍යයේ 1995.11.17 දින ශ්‍රී ලංකා යුද හමුදා නිත්‍ය බළසේනාව වෙත බැදී 1 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුව මගින් පවත්වනු ලැබූ මූලික යුද පුහුණුව හදාරා සෙ/277237 සංසෙ කුලතුංග එච්එච්කේ නමින් 5 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය වෙත ඇතුලත් වන ලදී.

2. 5 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය වෙත ඇතුලත් වූ දා පටන් තම රාජකාරීන් දැඩි කැපවීමකින් සිදුකල හමුදා සෙබළෙකුගේ තිබිය යුතු විශේෂ දක්ෂතාවක් වන වන වෙඩි තැබීම් සම්බන්ධයෙන් නිරන්තරයෙන්ම පුහුණුව සහ කැපවීම තුලින් දක්ෂ වෙඩික්කරුවකුවීමේ සලකුණු ඉස්මතු වන්නට විය. එය තවත් මුවහත් කිරීම සඳහා ශ්‍රී ලංකා යුද හමුදා ප්‍රවෙපුපා දියතලාව වෙතින් පැවැත්වූ

i. මූලික ප්‍රගුණ වෙඩිකරු පුහුණු පාඨමාලාව.
ii. ප්‍රගුණ වෙඩිකරු පුහුණු උපදේශක පාඨමාලාව.
iii. ප්‍රායෝගික පිස්තෝල පාඨමාලාව.

හදාරා සාර්ථක ප්‍රථිඵල පෙන්නුම් කරන ලද අතර, ඔහුගේ දක්ෂතාවයන් ප්‍රථම වරට සංඥා රෙජිමේන්තු අන්තර් ඒකක රයිෆල් වෙඩි තැබීම් තරගාවලිය තුලදී සංඥා බළකාය වෙත ප්‍රදර්ශණය කරන ලදී. එනම් 1 වන සංඥා බළකාය හිදී 2004.05.10 දින සිට 2004.05.12 දින දක්වා පැවති අන්තර් ඒකක රයිෆල් තරගාවලියේදී ප්‍රථම ස්ථානය ලබාගෙන පදක්කම් 4 ක් දිනාගෙන ඇති මෙම සෙනියා සමස්ථ තරගාවලියේම දක්ෂතම වෙඩික්කරුට හිමි ශූරතාවයද දිනා ගැනීමට සමත්වී ඇත.

3. එමෙන්ම මෙම සෙනියා පහත සඳහන් පාඨමාලාද හදාරා ඉන් උසස් ප්‍රථිඵල ලබාගෙන ඇත.

i. විශේෂ කුඩා කණ්ඩායම් පාඨමාලාව.
ii. විශේෂ ක්‍රියාන්විත ඛණ්ඩ පුහුණු පාඨමාලාව (යුහපුපා - මාදුරුඔය).
iii. විශේෂ ප්‍රහාරක පුහුණු පාඨමාලාව (යුහපුපා - මාදුරුඔය).
iv. විශේෂ කුඩා කණ්ඩායම් ක්‍රියාන්විත පාඨමාලාව (පළවන ස්ථානය).
v. ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලාව.
vi. බෝට්ටු ක්‍රියාකරු පාඨමාලාව.

4. තවද, මෙම සෙනියා 5 ශ්‍රීලංසංබ විටා ප්‍රහාරක කණ්ඩායමේ සාමාජිකයෙකු වශයෙන් 1998.04.18 දින සිට මේ දක්වා කණ්ඩායමේ සිටිති. එමෙන්ම සංසෙ කුලතුංග නව දක්ෂතාවයන් පෙන්වීමේ පෙන්වීමේ පළමු පියවර දැනට ඔහු විසින් තිමකර ඇත. ඔහුගේ මීලග ඉලක්කය ශ්‍රී ලංකා යුද හමුදාවේ සිටින දක්ෂතම වෙඩික්කරුවන් අතර ඉහළින්ම වැජඹී ශ්‍රී ලංකා සංඥා බළකායේ ධජය ඉහළට එසවීමය. ඒ සඳහා අප සියලු දෙනාම ඔහුව දිරිමත් කර ඔහුට ශක්තිය ඒ වෙනුවෙන් ලබාදිය යුතුව ඇත. සංඥා බළකාය වෙතින් මෙතෙක් බිහිකර ඇති ජාතික මට්ටමේ වෙඩිතැබීමේ ශූරයන් අතරට ඔහුත් එක් කිරීමට අප සැවොම ඔහුට ශක්තිය හා ධෛර්යය සහ සුභ පැතුම් ලබා දෙමු.

ආර් ඇල්විටිගල
කපිතාන්
නිළධාරී අණදෙන
සී කණ්ඩායම








# 6 ශ්‍රීලංසංබ (ආධාරක)
## බළඇණියයේ 8 වන සංවත්සරය



08 වන සංවත්සර උත්සවයේදී ලබාගත් සමූහ ඡායාරූපය

6 වන ශ්‍රී ලංකා සංඥා බළකායේ (ආධාරක බළඇණිය) 8 වන සංවත්සරය 2005 ජනවාරි මස 10 දින යාපනය අර්ධද්වීපයේ පල්ලේපායි හිදී ඉතා චාම් අන්දමින් සමරන්නට යෙදුනි

සංවත්සර උත්සවයේ පළමු අධියර වශයෙන් ශ්‍රී ලංකාවේ ඒකීයභාවය වෙනුවෙන් තම ජීවිතය පූජාකල සියළුම වීරෝධාර රණවිරුවන්ට හා ඔවුන්ගේ පවුල් වල අයටත් සේවයේ නියැලෙන අතරතුර ආබාධිත තත්වයට පත්වූ අයවළුන්ටත් ඔවුන්ගේ පවුල් වල අයවළුන්ටත් ඒකක ධජයටත් සෙත්පතා 2005.01.01 දින යාපනය පල්ලේපායි කඳවුරේ දී ගරු ස්වාමීන් වහන්සේලා පහලොස් නමක් වැඩම කරවා, සර්වරාත්‍රික පිරිත් සජ්ජායනයක් පවත්වා පසුදින දවල් දානය පිරිනමා පිරිකර පූජා කිරීමේ පිංකම් මාලාවක්.පවත්වන්නට යෙදුනි.

2005 ජනවාරි මස 10 දින 6 ශ්‍රීලංසංබ (ආ/බ) මූලස්ථානය පිහිටි පල්ලේපායිහිදී ඒකක අණදෙන නිළධාරී වෙත සම්මාන මුරයක් හා සම්මාන පෙළපාලියක් පිරිනැමූ අතර, ඉන්පසු සියලු නිළයින් වෙත දිවා භෝජන සංග්‍රහයක් පවත් වන ලදී.

ඒකක සංවත්සර උත්සවය වෙනුවෙන් අන්තර් කණ්ඩායම් අතර පවත්වන ලද ක්‍රිකට්, අත් පන්දු හා කඹ ඇදීමේ තරගාවලියන්හි ජයග්‍රාහී කණ්ඩායම් වෙත හා වසරේ හොඳම සෙබළාට හිමි ත්‍යාග හා සහතික පත් ප්‍රධානය කිරීමත් ඒකකයේ සිවිල් සේවක මහතුන්ගේ සේවය ඇගයීම සඳහා ත්‍යාග හා තිළිණ ප්‍රධානය කිරීම ඒකක අණදෙන නිළධාරී අතින් සිදු කරන ලදී.

මෙම සංවත්සර උත්සව කටයුතු ඉතා උසස් අන්දමින් සිදු කිරීමට කටයුතු සැලසුම්කර තිබුනද 2004.12.26 දින මුහුදුබඩ ප්‍රදේශයේ ඇති වූ සුනාමි ව්‍යසනය හේතුවෙන් ඉතා චාම් අන්දමින් පවත් වන ලදී.

1997 ජනවරි මස 10 දින ආධාරක බළඇණියක් ලෙස ආරම්භ කරනලද ලාබාලතම ඒකකය වසර 08 ක් වැනි කාලසීමාවක් තුල ජයග්‍රහන රාශියක් එක් කර ගනිමින් අනිකුත් පාබල ඒකකයන් මෙන්ම තම රාජකාරි ඉතා සාර්ථකව ඉටු කරමින් උතුරු ප්‍රදේශයේ ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියි.



නව අණදෙන නිලධාරී සුභ මොහොතින් වැඩ අරඹමින්....

වසර 61 ක ඉතිහාසයක් ඇති සංඥා පවුලේ ලාබාලතම, අණදෙන නිලධාරීන් 05 දෙනෙකුගෙ මාර්ගෝපදේශකත්වයෙන් මෙතෙක් ආ ගමන් මගේ වත්මන් අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් ඩීආර් ධර්මසිරිගේ මග පෙන්වීම යටතේ බළඇණියේ සාර්ථකත්වය උදෙසා මෙතෙක් දුර සාර්ථකව ගමන් ගැනීමට උරදුන් අණදෙන නිලධාරීන්, සෙසු අයවළුන් හා සිවිල් සේවක මහතුන් මේ අවස්ථාවේදී සිහිපත් කරමින් 6 සංඥා බළකාය දියුණුවෙන් දියුණුවට පත්වේවා යැයි ප්‍රාර්ථනා කරමු



අණදෙන නිලධාරී සම්මාන පෙළපාළිය





# 2ශ්‍රීලංසංබ (සෙව්) ඒකකය මෙතෙක් ආ ගමන් මග

1 වන බළසණය ශ්‍රී ලංකා සංඥා බලකාය (සෙව්) යුධ හමුදා ස්වෙච්ඡා බළසේනාවේ සංඥා බළසණයක් වශයෙන් 1980 අප්‍රේල් මස 25 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි 1 වන සංඥා බලකායේ අණ සහ පාලනය යටතේ ආරම්භවූ පසුව 1989 ජනවාරි මස 26 දින 2 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය (සෙව්) ලෙස නගා සිටුවීම සිදුවිය.

නව ඒකකයක් ලෙසින් නිලධාරීන් 08 සහ සෙසුනිළයින් 200 ක ගෙන් සමන්විත වන සේ සංස්ථාව අනුමත කළද ස්වාධීනව ඒකකයක් වශයෙන් රාජකාරීන් හි නියැලීමට තරම් සංඥා භටයින් පිරිසක් 2 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය (සෙව්) හා නොසිටීමහේතුවෙන් ඒකක මූලස්ථානය පනාගොඩ ස්ථාපිත කර සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය යටතේ රාජකාරී ඉටුකරනු ලැබීය.

යුධ හමුදාවේ ඇතවූ සීඝ්‍ර ව්‍යාප්තිය හා යුධ වාතාවරණය හේතුවෙන් සංඥා රාජකාරීන් ඉටුකරනු ලබන ඒකක අතරට සංඥා ඒකකයක් ලෙස 2 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය (සෙව්) පත්වී සේනාංක බළසේනා මූලස්ථානය සහ ඒක වෙත -ගුවන්විදුලි සම්බන්ධතා සපයාදෙමින් ඉතා අගනා මෙහෙවරක් ඉටු කරණු ලබයි. උතුරු නැගෙනහිර ආදි ප්‍රදේශවල ඉටුකරනු ලබන සංඥා රාජකාරීන් වලට අමතරව ඒකක ස්ථාන ගතවී ඇති සේනාංක බල ප්‍රදේශය තුළද විශේෂ සංඥා අවශ්‍යතාවයන් සඳහා සංඥා ක්‍රියාකරුවන් සහ ගුවන්විදුලි උපකරණ සැපයීම ද සිදුකරනු ලබයි. සංඥා සම්බන්ධතා පැවැත්වීමේ රාජකාරීන් වලට අමතරව උසස් මූලස්ථාන වෙතින් දෙන ලද උපදෙස් මත ස්වෙච්ඡා පුහුණු පාසැල් අනෙකුත් රෙජිමේන්තු පුහුණු පාසැල් මගින් පවත්වනු ලබන පුහුණු පාඨමාලා සඳහා සංඥා විෂයන්ට අදාලව උපෙද්ශක සහය ලබාදීම ඒකකය වෙත පැවරී ඇති විශේෂිත වූ කාර්යක් බවට පත්වී ඇත.

දැනට මෙම ඒකකය නිලධාරීන් 10 දෙනෙකුගෙන් හා සෙසුනිළයින් 211 දෙනෙකුගෙන් පමණක් සමන්විත වුවද ශ්‍රීලංසංබ නිත්‍ය ඒකකයන්ට සමානව මෙම අයවලුන්ද දිවයිනේ නොයෙකුත් ප්‍රදේශවල සංඥා රාජකාරීන්හි නිරතවීම හේතුකොට ඒකකයේ දැනට සිටින භට පිරිස් ඌණතාවයට බොහෝ දුරට බලපා ඇත. ඒ අනුව දැනට නිත්‍ය සංඥා ඒකක සංස්ථාව 2ශ්‍රීලංසංබ (සෙව්) ඒකකය වෙත අනුමත කරදෙන ලෙස ඉදිරි කටයුතු සිදු කර ඇත. ඒ අනුව තම සංස්ථාවට අනුමත වන තෙක් වෙනත් ස්වෙච්ඡා ඒකක වලට අයත් වෘත්තීමය දැනුමක් ඇති කෝප්‍රල් නිළයට පහළ සෙනීන් අන්තර් ඒකක මාරුවීම් මත 2ශ්‍රීලංසංබ (සෙව්) ඒකකය වෙත බඳවා ගැනීමේ කටයුතු ආරම්භ කර ඇත. තවද මෙම ඒකක අධීක්ෂණය යටතේ සංඥා බලකාය වෙත බඳවා ගන්නා ලද නිත්‍ය හා ස්වෙච්ඡා ආධුනිකයින් භට ආධුනික පුහුණු පාඨමාලාවන් දෙකක් හා මූලික සංඥා පාඨමාලාවක් ද පසුගිය වසර තුළ සාර්ථක ලෙස පවත්වා ඇත.

ඊට අමතරව ඒකකය වෙත බඳවා ගන්නා ලද ආධුනික සෙනීන් 46 තුළ මූලික සංඥා පාඨමාලාව නිම කිරීමෙන් පසුව සංඥා රාජකාරියෙහි යොදවා ඇත. 2005 වසර වෙනුවෙන් ඒකකය වෙත බඳවා ගන්නා ලද ආධුනික සෙනීන් 78 දෙනෙකු දැනට ආධුනික පුහුණු පාඨමාලාව නිම කිරීම සඳහා අවැසි පුහුණු කටයුතු වෙනුවෙන් ශ්‍රීලයුපුබ පුහුණු පාසල - පැලවත්ත වෙත යා කර ඇත.

2 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය (සෙව්) ඒකකයක් ලෙස 25 වසරක පමණ සාර්ථක ඉදිරි ගමන සඳහා ඒකක ආරම්භයේ සිට නායකත්වය දෙමින් අධීක්ෂණ අණදෙන නිලධාරීන් තිදෙනෙකුගේ මහගු මඟපෙන්වීම හා අනෙකුත් නිලධාරී මෙන්ම සෙසු නිළයින්ගේ සාමූහික ප්‍රයත්නය නිරන්තරයෙන් ම මහෝපකාරී වූ අතර වත්මන් ඒකක අණදෙන නිලධාරී ලෙස කටයුතු කරණු ලබන මේජර් එස්ව් ගුණසේකර ආර්වස්පී ඒකකයේ ඉදිරි අභිවෘද්ධිය වෙනුවෙන් මනා කැපවීමෙන් යුතුව කටයුතු කරණු ලබයි.








# සංඥා පාසල හා පසුගිය වසර

පළමුවන සංඥා බලකාය යටතේ පනාගොඩ ස්ථාපිතව තිබූ සංඥා අභ්‍යාස බලඝණය 1991.07.15 වන දින මහනුවර බූවැලිකඩ ග්‍රාමයේ මනරම් කඳුවැටියක් මුදුනේ සංඥා පාසල නමින් ස්ථාපිත විය. එතැන් පටන් මේ දක්වා ප්‍රධාන උපදේශක වරුන් සහ සේනාවිධායකවරුන් කිහිප දෙනෙකුගේ අධීක්ෂණය සහ මඟපෙන්වීම යටතේ ඉදිරියට පා තැබූ මෙම පාසල 2004.10.12 දින සිය 14 වන සංවත්සරය අභිමානවත් අයුරින් සමරන ලදී.

පසුගිය 2004 වසර තුළ පුහුණු සැලැස්මට අනුව සංඥා පාසල වෙතින් සංඥා ඒකක/වෙනත් ඒකක නිළධාරී/සෙසු නිළයින් වෙනුවෙන් පවත්වනු ලැබූ පාඨමාලා 17 අතුරින් පාඨමාලා 9 ක් සඳහා ඇබෑර්තු 120 වෙන්කරනු ලැබූ අතර, ඉන් ඇබෑර්තු 370 සම්පූර්ණ කිරීම තුළින් 88.09% ක පාඨමාලාවකට සහභාගි වීමේ ප්‍රතිශතයක් ද සංඥා ඒකක සඳහා පාඨමාලා 8 ක් පවත්වා ඇබෑර්තු 260 ක් වෙන් කරනු ලැබූ අතර ඉන් ඇබෑර්තු 234 සම්පූර්ණ කිරීම තුළින් 90% පාඨමාලා සඳහා සහභාගි වීමේ ප්‍රතිශතයක් ලබා ගන්නා ලදී. මීට අමතරව ආධුනික පුහුණු පාඨමාලා දෙකක් පවත්වා ආධුනිකයින් 141 දෙනෙකු හමුදාගත කිරීමට දායක වී ඇත. ඒ අනුව සමස්තයක් ලෙස වෙනත් ඒකක හා සංඥා ඒකක සඳහා විවිධ පාඨමාලා 17 ක් 2004 වසර තුළ පවත්වා වෙන්කරනු ලැබූ ඇබෑර්තු 680 ක් වෙනුවෙන් ඇබෑර්තු 604 සම්පූර්ණ කිරීම තුළින් පාඨමාලා සඳහා සහභාගි වීමේ ප්‍රතිශතය 88.08% දක්වා වර්ධනය කර ඇත. ඒ අනුව මේ පුහුණු පාසල ශ්‍රී ලංකාවේ යුධ හමුදාවේ සියළුම නිළධාරීන් සහ සෙසු නිළයින් හට සංඥා පිළිබඳ දැනුම ලබාදෙන එකම ආයතනය ලෙසත් ඉතා සාර්ථක උපදේශකත්වයක් ලබාදෙන ආයතනය ලෙසත් මනාවට පිළිඹිබු කර ඇත.

තවද සංඥා පාසලේ භෞතික දියුණුව වෙනුවෙන් පහත දක්වා ඇති කාර්යයන් පසුගිය වසර තුළ සැලකිය යුතු දියුණුවක් ලබා ඇත. ඒ සඳහා දායක වූ මෙම පාසලේ නිත්‍ය කාර්යය මණ්ඩලය සහ පාඨමාලා සෙනින්ගේ නොමසුරු සහයෝගය ලැබී ඇති බැව් දන්වා සිටිමු. එම කාර්යයන් නම් ප්‍රධාන පිවිසුම සඳහා නව ගේට්ටුවක් සමඟ නව මුරකුටියක් ස්ථාපනය කිරීම, කර්ණාවෑම් හලක් කඳවුරේ ස්ථාපිත කිරීම, දුරකථන කුටියක් කඳවුර තුළ ස්ථාපනය කිරීම සෙසු නිළ භෝජනාගාරයේ පහසුකම් වඩා දියුණු කර අඟල් 21 වර්ණ රූපවාහිනි යන්ත්‍රයක් ලබා දීම ප්‍රධාන ගොඩනැගිල්ලේ නාම පුවරුවක් සහිතව ජල පොකුණක් ඉදි කිරීම. කොනොනි සමාජ ශාලාවට ජල ටැංකියක් සපයා ජලය ලබා දීම, පරිගණක ස්කෑනර යන්ත්‍රයක් සහ මුද්‍රණ යන්ත්‍රයක් ලබාදීම. කඳවුරේ ජල සැපයුම අඩාලවීමට ප්‍රතිකර්මයක් ලෙස ජල මෝටරයක් යොදා අසල ලිඳකින් ජලය පොම්ප කිරීමේ ව්‍යාප්තියක් ස්ථාපනය කිරීම. ප්ලාස්ටික් පුටු 56 ලබාගෙන ප්‍රධාන දේශන ශාලාවේ පහසුකම් වැඩිදියුණු කිරීම. යන කාර්යයන් සැලකිය හැක.

තවද මෙම පාසල මගින් සිදුකරනු ලබන පුහුණු රාජකාරී වලට අමතරව ඓතිහාසික ශ්‍රී දළදා සමිඳුන් වැඩ සිටින සෙංකඩගල පුරවරයේ ආරක්ෂාව තහවුරු කිරීමේ වගකීම ද ප්‍රදේශ මූලස්ථානය මහනුවර අධීක්ෂණය යටතේ රාජකාරී ඉටුකිරීමට ද මෙම පාසල වගකීමෙන් යුතුව බැඳී සිටින බැව් පෙන්වා දෙමි.

සංඥා පාසලේ ආරම්භයේ සිට මේ දක්වා සිටි සේනාවිධායකවරුන් සහ ප්‍රධාන උපදේශක නිළධාරීන් වරුන්, රෙජිමේන්තු සැරයන් මේජර්වරුන්, උපදේශක කොනොනි වරුන් ආදීන්ගේ නොමසුරු දායකත්වය සංඥා පාසලේ වත්මන් දියුණුවට මහඟු රුකුලක් වූ බව මෙහිලා ස්තුති පූර්වකව සිහිපත් කරන්නෙමු.

# INFORMATION TECHNOLOGY UNIT





The SIGNALLER

# තොරතුරු තාක්ෂණ ඒකකයේ සමරු සටහන්



සමූහ ඡායාරූපය

ශ්‍රී ලංකා යුද හමුදා පරිඝණක ගත කිරීමේ කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාම අරමුණු කොට 1985 වසරේදී යුද හමුදා පරිඝණක කමිටුව (Computer Steering Committee) ආරම්භ කරන ලදී. 1991.08.23 දින විද්‍යුත් දත්ත සැකසුම් ඒකකය ලෙස (භවනි 10/92 අනුව) නගා සිටවූ අතර මෙම ඒකකයේ නාමය 2003.10.14 දින (භවනි 18/2003 අනුව) තොරතුරු තාක්ෂණ ඒකකය ලෙස සංශෝධනය විය.

දැනට නිළධාරී 26 ක් සහ සෙසු නිලයින් 375 කින් සමන්විත මෙම ඒකකය පහත සඳහන් සේවාවන් සපයමින් යුද හමුදාවට තම දායකත්වය සපයනු ලබයි.

1. යුද හමුදා වෙබ් අඩවිය විධිමත්ව පවත්වාගෙන යාම.
2. යුද හමුදාවේ ආයතන පරිඝණක ජාලගත කිරීම.
3. අවශ්‍ය මෘදුකාංග සම්පාදනය කිරීම.
4. පරිඝණක හා උපාංග නඩත්තු කිරීම හා අලුත්වැඩියා කිරීම.
5. පරිඝණක පුහුණු පාඨමාලා පැවැත්වීම.

තවද පසුගිය වසර තුලදී ශ්‍රී ලංකා යුද හමුදාවේ පරිගණක ජාලය විසින් යුද හමුදා නිල වෙබ් අඩවියෙහි යාවත්කාල කිරීම (Update) දෛනිකව සිදු කරන අතර ඒයට නව අංග වශයෙන් යුද හමුදා රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබා ගන්නා සියලු නිලයින්ගේ තොරතුරු අන්තර්ජාලය හරහා බලා ගැනීමට අවස්ථාව සලසා ඇති අතර LTTE සංවිධානය විසින් සටන් විරාමය කඩ කරන අවස්ථාවන් ලෝකයට දැන ගනීම සඳහා දත්තයන් (www.army.lk) වෙබ් අඩවියට ඇතුලත් කරනු ලබයි



සයලු නිලයින්ගේ දිවා භෝජනයෙන් පසු..

තවද පසුගිය වසරේ මෙම ඒකකයේ අධීක්ෂණය යටතේ පරිඝණක යන්ත්‍ර 25 ක් යොදවා මාලඹේ පිහිටි SLIIT ආයතනයේ දී නිළධාරීන් 50 ක් හා සෙසු නිළයින් 1100 කට අධික ප්‍රමාණයකට පරිඝණක පුහුණුව ලබාදී ඇත.



සංවත්සර දින ආගමික වතාවත්

13 වන සංවත්සරය වෙනුවෙන් 2004.08.13 සහ 14 දිනයන්හි ඒකක මූලස්ථානයේ සර්ව රාත්‍රික පිරිත් දේශනාවක් පැවැත්වූ අතර පසුදින සංඝගත දක්ෂිනාවක් පවත්වන ලදී. 2004.08.23 දින ඒකක අණදෙන නිළධාරී වෙනුවෙන් සංඥා රෙජිමේන්තු පිටියේදී සම්මාන පෙළපාලියක් පැවැත්වූ අතර එදින සෙසුනිළ භෝජනාගාරයේදී සියලුම නිළයින් වෙනුවෙන් දිවා භෝජන සංග්‍රහයක් පැවැත්විය.

මෙම ඒකකය සංඥා රෙම යටතේ පාලනය වුවද සංඥා නිළධාරී සෙසු නිළයින් හැරුන විට වෙනත් ඒකක වෙතින් පරිඝණක රාජකාරීන් සඳහා යාකර ඇති නිළධාරී සෙසු නිළයින් ගේ ඇපකැපවීම මෙහිලා අගය කරනු ලැබේ.



සංඝගත දක්ෂිණාව

තවද මෙම ඒකකයේ දෛනික ක්‍රියාකාරකම් වලදී යුද හමුදා මූලස්ථානයේ සියලුම ආයතනවලින් දෙනු ලබන සහයෝගය මෙහි ලා අගය කරන අතර සංඥාරෙම වෙතින් සහ සංඥා බළසේනාව වෙතින් දෙනු ලබන අනුග්‍රහය ද මෙම ඒකකයේ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම සඳහා මහත් රුකුලක්වී ඇත.

තොරතුරු තාක්‍ෂණ ඒකකය යුද හමුදාවේ සියලුම තොරතුරු තාක්‍ෂණ ක්‍රියාකාරකම් වලදී සේවයට ඇපකැපවී සිටින අතර දිගු ගමනකට ආසිරි පතමු.








සංඥා මූලික වැඩපල සේනාවිධායක
ලුතිං කර්නල් ජේඑන් වික්‍රමාරච්චි යූඑස්පී වෙත පිරිනමන සම්මාන මුරය

# සංඥා මූලික වැඩපල පස්වන සංවත්සරය

ශ්‍රී ලංකා යුධ හමුදාව තුළ සංඥා සම්බන්ධතාවයන් පවත්වාගෙන යාම වෙනුවෙන් සහෝදර සංඥා ඒකකයන් වෙත කාර්මික දැනුම ලබාදෙමින් සංඥා සම්බන්ධතායන් ඕහිකිරීම පිණිස උරදුන් සංඥා බලකායේ හදවත බඳු සංඥා මූලික වැඩපල වීතෙක් බලඝණයක්ව පැවති තත්ත්වයෙන් මිදී 2000 අගෝස්තු මස 13 වන දින ඒකකයක් වශයෙන් ප්‍රතිස්ථාපනය විය.

හතරවන සංවත්වරය සැමරූ වර්ෂ 2004 අගෝස්තු මස 13 දින සිට ගෙවී ගිය වර්ෂ පූර්ණය සිහිපත් කිරීමේදී මෙතෙක් ඒකකයක් වශයෙන් අප ලද ජයග්‍රහණයන් පිළිබඳව ඉතාමත් උද්දාමයට පත් වන්නෙමු. ගෙවී ගිය වසර තුළදී අප ලද ජයග්‍රහණයන් අතරට සාම සාධක හමුදා සේවය සඳහා ප්‍රථම වරට කොනොනි තිදෙනෙක් සහ දෙවන වරටත් කොනොනින් තිදෙනෙක් හයිටි රාජ්‍යය වෙත යාමට අවස්ථාව ලැබීම අප සැම ලද ජයග්‍රහණයක් සේ සලකමු. තවද, බටලන්ද මාණ්ඩලික විද්‍යාපීඨයේ පවත්වනු ලබන අණ හා මාණ්ඩලික නිළධාරි පාඨමාලාව හැදෑරීම සඳහා මෙම ඒකක මානි 11 තේරීපත්වීම ද, අප ලද ජයග්‍රහණයකි. එමෙන්ම පසුගිය වසරේ සංස්ථාව තුළ සෙනින්ගේ උසස්වීම් ලබාදීමෙන් ලා/කෝ 34ක් ද, කෝප්‍රල් 11ක් ද, සැරයන් 2ක් ද, මා/සැරයන් 34ක් ද, බනි11 2ක්ද බනි1 8ක් වශයෙන් නිළ උසස් කිරීම් සිදුකර ඇති බව සතුටින් දන්වා සිටින අතර, බලලත් නිළධාරි ලුතිතන්(උපා) කාර්මික නිළයේ අධිකාරියට පත් කිරීම වෙනුවෙන් බලලත් නිලධාරි තිදෙනෙකු තෝරාපත්වීම ඉමහත් සතුටකි.

පස්වන සංවත්සර සැමරුම උදෙසා මෙම ඒකකය විසින් සංවිධානය කරන ලද ලේ දන්දීමේ ව්‍යාපාරය ඉතාමත් සතුටුදායක අයුරින් සාර්ථකව නිම කිරීමට හැකිවූ අතර, ඒ සඳහා මහරගම පිළිකා රෝහල වෙත 2005/08/05 දින ලේ පයින්ට් 105 ක් වැනි අතිවිශාල ලේ ප්‍රමාණයක් අදාල රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන අසරණ රෝගීන් සුවපත් කිරීම පිණිස පරිත්‍යාග කරන ලදි.


සංඥා මූලික වැඩපල සේනාවිධායක ලුතිං කර්නල් ජේඑන් වික්‍රමාරච්චි යූඑස්පී වෙත පිරිනමන ලද සම්මාන පෙලපාලිය






සංඥා මූලික වැඩපලේ නිළධාරි/සෙසුනිලයන් ලේ පරිත්‍යාග කිරීම

පස්වන සංවත්සර සැමරුම උදෙසා සංවිධානය කරන ලද තවත් අංගයක් වූයේ 2005/08/09 දින මීගොඩ රජයේ ආයුර්වේද රෝහල පිළිසකර කිරීමේ වැඩසටහනයි. මෙහිදී අදාල රෝහල් භූමිය මුලුමනින්ම පිරිසිදු කර එහි නේවාසික වාට්ටුවක්ද පිරිසිදුකර වර්ණාලේප කරණ ලදි.

2005/08/11 වන දින පස්වන සංවත්සරය සැමරුම උදෙසා මෙම ඒකකයටත් සංඥා බලකායටත් පොදුවේ සමස්ථ රටටත් සෙත් පතා සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනාවක් පවත්වන්නට යෙදුනු අතර, 2005/08/12 දින සංඝයා වහන්සේලා 12 නමක් වෙනුවෙන් හිල් දානය පිළිගැන්වීම ද, ඉතා සාර්ථක අයුරින් ඉටු කළ,ඩා කණ්ඩායම සමග මෙම ඒකක වොලිබොල් අතර, එදින සවස් කාලයේදී ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ වොලිබෝල් කණ්ඩායමක් වන ගම්පහ සියනෑතරු ක්‍රීඩා කණ්ඩායම සමග මෙම ඒකක වොලිබොල් කණ්ඩායම ප්‍රදර්ශණ වොලිබෝල් තරගයක් පවත්වා මෙම ඒකක කණ්ඩායම ඉතා තියුණු ජයග්‍රහණයක් අත්පත් කරගත් බව සතුටින් දන්වමි.

2005/08/13 දින මෙම ඒකක සේනාවිධායක වෙත සම්මාන මුරයක් හා සම්මාන පෙළපාලියක් පිරිනැමු අතර, එදින සියලු නිළයන් වෙනුවෙන් දිවා භෝජන සංග්‍රහයක් පවත්වන ලදි.

සංඥා බලකායේ ළදරුතම සමාජිකයා වශයෙන් සංඥා රෙජිමේන්තුවට එක්වූ සංඥා මූලික වැඩපල පස්වන සංවත්සරය සැමරූ මොහොතේ ඒකකය වෙතින් ශ්‍රීලංකා සංඥා බලකායටත්, ශ්‍රීලංකා යුධ හමුදාවටත්, ඉදිරියේදී ඉටුවිය යුතු රාජකාරීන් ඉතා මනා ලෙස ඉටු කිරීමට අවශ්‍ය සවිය, දිරිය අප සතුව ඇති බව ඉතාමත් සතුටින් සටහන් කරන්නෙමු.


මීගොඩ අයුරුවේද රෝහල පිළිසකර කිරීම


පස්වන සංවත්සරයේ විශේෂිත අංගයක් වූ සර්ව රාත්‍රික පිරිත් සංජ්ජායනය

# සංඥා බළකා කාන්තා සමාජය

සංඥා බළකා කාන්තා සමාජය විසින් 2004 මැයි මාසයේ සිට මේ දක්වාම සංඥා රෙජිමේන්තු වලට අයත් සෙනින්ගේ සුභ සාධන කටයුතු රාශියක් ඉටුකිරීමෙහිලා දායක වී ඇති අතර, 2004 දෙසැම්බර් මස 26 වන දින ඇතිවූ සුනාමි ව්‍යසනයෙන් විපතට පත්ව අවතැන්වූ සංඥා රෙජිමේන්තු වලට අයත් සෙසුනිළයින් වෙනුවෙන් ඉටුකල සුභසාධන කටයුතු වලට සුවිශේෂ වූ තැනක් හිමිවන ලදි. 2004 දෙසැම්බර් මස 31 වන දින සිට 2005 ජනවාරි මස 04 වන දින ඇතුලත සුනාමි ව්‍යසනයෙන් අවතැන්වූ සංඥා සෙනින්ගේ පවුල් සහ වෙනත් පවුල් උදෙසා වියලි සලාක මලු කෞෂල්‍යා සේනවීර මැතිණියගේ මැදිහත්වීමෙන් මෙම සමාජය වෙත ලබාගැනීමෙන් අනතුරුව බෙදා හරින ලදි.



සුනාමි ව්‍යසනයෙන් අවතැන් වූ සංඥා සාමාජිකයින්ගේ සුවදුක් බැලීමට ගොස්...

2004 පෙබරවාරි මස 04 වන දින කාන්තා සමාජයේ සාමාජිකාවන් පස් දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් ගාල්ල දිස්ත්‍රික්කය තුළ සංචාරය කිරීමෙන් අනතුරුව අඩුපාඩුකම් පිළිබඳ සොයාබලා අවතැන් වූ පවුල් 23 සඳහා සහනාධාර කට්ටලයක් සහ ඇඳුම් පැළඳුම් බෙදාදෙන ලදි. සුනාමි විපතින් සම්පූර්ණයෙන්ම නිවාස අහිමි වූ පවුල් 11 ක් සඳහා තාවකාලික නිවාස 11 ක් ඉදිකරදීම පිණිස අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය සේපාලි සමරසිංහ මැතිණියගේ මැදිහත්වීමෙන් ලබාගන්නා ලද අතර, ඒ අනුව නිවාස ඉදිකිරීම් ආරම්භ කරන ලදි. මේ අනුව ගාල්ල දිස්ත්‍රික්කයේ පදිංචි මා/සැ මෙන්ඩිස්ගේ නිවස ඉදිකර ඔවුන් එම නිවසේ පදිංචිවීම 2005 මාර්තු මස 08 වන දින සිදුවූ අතර එදිනම කාන්තා සමාජයේ සාමාජිකාවන් එම අවස්ථාවට සහභාගීවීම විශේෂ සිදුවීමක් ලෙස දැක්විය හැක.

මෙදින මෙම සමාජයේ සාමාජිකාවන් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක වල අවතැන්වූ සෙසු අයවලුන්ගේ නිවෙස් වල සංචාරයකොට ඔවුන්ගේ අඩුපාඩුකම් පිළිබඳව සොයාබලා අනෙකුත් නිවාස ඉදිකිරීම් පරීක්ෂාකර බලන ලදි. මෙම සංචාර වලදී අවතැන්වූ පවුල් වල පාසල් යන දරුදැරියන් පිළිබඳව දැඩි අවධානයක් යොමුකල සාමාජිකාවන් ඇතුලු ගරු සභාපතිනිය එම දරු දැරියන් සහ දෙමව්පියන් කොළඹට ගෙන්වා සතුටුවීමේ දිනයක් පැවැත්වීමට තීරණය කිරීමෙන් අනතුරුව, එම උත්සවය කොළඹ මිලේනියම් පාර්ක් හි 2005 අප්‍රේල් මස 09 වන දින පවත්වන ලදි. මෙම වැඩසටහන තුලින් සියලුම සිසු දරු දැරියන් වෙනුවෙන් ඔවුන්ට අවශ්‍ය පැසැල් උපකරණ බෙදා දුන් අතර සෑම අයෙකු වෙනුවෙන්ම දිවා භෝජන සංග්‍රහයක්ද පවත් වන ලදි. මෙම සුවිශේෂ වූ වැඩ පිළිවෙල සාර්ථක කර ගැනීම සඳහා සෑම සංඥා රෙජිමේන්තුවකම උපරිම සහය ලද අතර ඒ අනුව සියලු කටයුතු අතිශයින් සාර්ථක විය.

සුනාමි විපතින් සම්පූර්ණයෙන්ම නිවස අහිමිවූ මා/සැරයන් මෙන්ඩිස් බීච් ගේ නිවස පරීක්ෂා කල සාමාජිකාවන් මෙන්ඩිස් මහත්මිය සමග ඉහල ඡායාරූපයෙන්ද, ඔවුන් වෙනුවෙන් ඉදිකරන ලද නව නිවස 2005.03.08 දින පරීක්ෂා කල සාමාජිකාවන් මා/සැ මෙන්ඩිස් බීච් පවුලේ අය සමග පහළ ඡායාරූපයෙන් ද දැක්වේ.







සංඥා බලකා කාන්තා සමාජයේ ගරු සභාපතිනිය දයානි ද සිල්වා මැතිණියගේ මඟ පෙන්වීම යටතේ පසුගිය වසරේ සිට මේ දක්වා සංඥා බලකා කාන්තා සමාජය විසින් ඉටුකරන ලද සුභසාධක කටයුතු වල සංක්ෂිප්තයක් පහත දක්වා ඇත.




ගරු සභාපතිනියගේ ආරාධනය පරිදි සංඥා බලසේනාධිපති තුමා විසින් අයිස්ක්‍රීම් රස බැලූ අවස්ථාවක්

අ. 2004 ජනවාරි 18 දින ප්‍රවීන සුපවේදී ලක්ෂ්මී ලොරෙන්සුහේවා සහභාගී කරවා ගනිමින් සූපශාස්ත්‍ර වැඩමුළුවක් සංවිධානය කිරීම.

ආ. 2004 මැයි මස 06 දින රඹුක්කන හේවාදිවල මාලිගාතැන්න ප්‍රදේශයේ පදිංචි සංඥා බලකායට අයත් ආබාධිත සෙබලෙකු වන සෙ/278822 සංඥා සෙබල නිශ්ශංක එන්ජේඩබ් හට රු. 446055/- ක මුදලක් වැයකොට සම්පූර්ණ නිවසක් තනා භාරදීම සහ රු. 32000/ ක් වැයකොට ගෘහ භාණ්ඩ පරිත්‍යාග කිරීම.

ඇ. 2004 ජූනි මාසයේදී සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයට අයත් සෙසු නිළයින් නාන ළිඳ රු. 32000/- ක මුදලක් වැයකොට සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කිරීම.

ඈ. 2004 ඔක්තෝබර් මස 16 දින සංඥා බලකායේ 61 වන සංවත්සරය වෙනුවෙන් ක්‍රියාන්විත රාජකාරියේදී මියගිය නිළධාරී/සෙසු නිළයින්ගේ ළගම ඥාතීන් වෙනුවෙන් පැවැත්වූ දිවා භෝජන සංග්‍රහය සඳහා යෝගට් 600 ක් ලබාදීම සහ පැවැත්වූ දානමය පිංකම සඳහා පලතුරු පූජා කිරීම.



ගරු සභාපතිනිය ඇතුලු සාමාජිකාවන් විසින් සෙබලෙකුගේ සුව දුක් විමසූ අවස්ථාවක්

ඉ. 2005 පෙබරවාරි 04 දින ගාල්ල දිස්ත්‍රික්කයේ සුනාමියෙන් අවතැන් වූ සංඥා බලකා පවුල් වල සාමාජිකයින් සඳහා වියලි සලාක මලු 90 ක් පරිත්‍යාග කිරීම සහ නිවාස 11 ක් ඉදිකිරීමට ඇවැසි ගොඩනැගිලි ද්‍රව්‍ය ලබාදීම.

ඊ. 2005 අප්‍රේල් මස 09 දින සුනාමියෙන් විපතට පත් සංඥා බලකායෙ පවුල් වල දරු, දැරියන් සඳහා කොළඹ 10, මිලේනියම් පාක් හිදී සතුටුවීමේ දිනයක් පැවැත්වීම සහ ළමුන් සඳහා තෑගි ලබාදීම.

උ. 2005 මැයි මස 31 දින යුද හමුදා සේවා වනිතා ශාඛාව මගින් සංවිධානය කළ වෙසක් භක්ති ගී ප්‍රසංගය නැරඹීම සඳහා පැමිණි අයවලුන් වෙනුවෙන් නොමිලේ අයිස්ක්‍රීම් 500 ක් ලබාදීම.

ඌ. 2005 ජූනි මස 28 දින රාගම රණවිරු සෙවනේ ප්‍රතිකාර ගනු ලබන සෙබලුන්ගේ සුවදුක් විමසා බැලීම, සංඥා බලකා කාන්තා සමාජයේ සාමාජිකාවන් එහි සංචාරය සිදු කිරීම සහ සෙබලුන්ගේ ප්‍රයෝජනය සඳහා ලිපි ද්‍රව්‍ය තොගයක් පරිත්‍යාග කිරීම.

ආකර්ෂණ



# හයිටි රාජ්‍යයේ සංඥා මෙහෙවර



සමූහ ඡායාරූපය පළමුවෙනි කණ්ඩායම



සංඥා සම්බන්ධතා මැදිරිය

එක්සත් ජාතීන්ගේ සමුළුවෙහි ආරාධනය පරිදි හයිටි රාජ්‍යයේ අභ්‍යන්තර අර්බුදකාරී තත්ත්වය මැඩ පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙතින් සාම සාධක හමුදාවක් ප්‍රථම වරට 2004 සැප්තැම්බර් මස 25 දින දිවයිනෙන් පිටත්ව යන ලදි.

ශ්‍රී ලංකා පාබල හමුදාවට ප්‍රධාන කොට විවිධ ඒකකයන්ගේ නියෝජනයෙන් යුක්ත වූ මෙම සාම සාධක හමුදා ක්‍රියාන්විතය (මිනුස්ටා ක්‍රියාන්විතය) සඳහා සංඥා සම්බන්ධතා සැපයීම භාර වූයේ ශ්‍රී ලංකා සංඥා බලකායටය.

ඒ අනුව නිළධාරීන් දෙදෙනෙකු ඇතුලු විසි දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් අධියර තුනකදී හයිටි රාජ්‍ය බලා පිටත්ව යන ලදි. ඔව්හු නැවත 2005 අප්‍රේල් මස පලමුවන අදියර නිමාවෙන් පසු දිවයිනට පැමිණියහ.

ඉන් අනතුරුව යුද හමුදා සිංහ රෙජිමේන්තුව ප්‍රධාන කොට සංඥා නිළධාරීන් දෙදෙනෙකු ඇතුලුව දහඅට දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් හයිටි රාජ්‍ය බලා පිටත්ව ගියහ.



සමූහ ඡායාරූපය දෙවෙනි කණ්ඩායම





# සම්මාන



ආකර්ෂණ



1. පකිස්තාන් ගුවන් හමුදා මාණ්ඩලික ප්‍රධාන එයාර් චීෆ් මාර්ෂල් කලීත් සදාත් NI (M) වෙත ශ්‍රී ලංකා සංඥා බලකාය වෙතින් පිරිනමන ලද සම්මාන පෙළපාලිය - 2005 මාර්තු 09 දින අණදීම කපිතාන් ටීඑස් ලියනගුණවර්ධන

2. 2005.02.26 වන දින ඉඳුරාම් බඳවාගත් ආධුනික සෙබළුන් 315 දෙනෙකුගේ විසිරයාමේ පෙළපාලිය - ප්‍රධාන අමුත්තා සංඥා බලකාධිපති බ්‍රිගේඩියර් වයිඑස්ඩ් සිල්වා යූඑස්පී පීඑස්සී

# සුනාමි

## ව්‍යසනයට ලක්වූ සංඥා බලකායේ නිළධාරීන් / සෙසුනිළයින්

**2004/12/26 දින සුනාමි ව්‍යසනයට ලක්වූ සංඥා බලකායේ නිළධාරීන්/සෙසු නිළයින් සහ මියගිය/අවතැන් වූ අයවලුන් පහත සඳහන් පරිදි වේ.**

මියගිය

| | | | | |
|---|---|---|---|---|
| අ. | සෙ/147809 | ආසෙ | නිමල් එම්ජී මියගිය | |

අවතැන්වූ

| | | | | |
|---|---|---|---|---|
| අ. | නි/65648 | 2/ලුති | එම්එන්ටී ජයසේකර | 4 ශ්‍රීලංසංබ |
| ආ. | සෙ/65893 | මා/සැ | මෙන්ඩිස් පීඒ | 3 ශ්‍රීලංසංබ |
| ඇ. | සෙ/66669 | සැරයන් | සමරසේකර එස්පීඑස් | 3 ශ්‍රීලංසංබ |
| ඈ. | සෙ/66912 | සැරයන් | පුෂ්පකුමාර එම්ඒ | 1 ශ්‍රීලංසංබ |
| ඉ. | සෙ/66758 | කෝප්‍රල් | ධර්මදාස ඕපීජී | 3 ශ්‍රීලංසංබ |
| ඊ. | සෙ/275354 | කෝප්‍රල් | නාමල් ඒපී | 1 ශ්‍රීලංසංබ |
| උ. | සෙ/275832 | ලා/කෝ | මෙත්සිරි පීජී | 6 ශ්‍රීලංසංබ |
| ඌ. | සෙ/276529 | ලා/කෝ | සුරංග එච්කේජී | 1 ශ්‍රීලංසංබ |
| එ. | සෙ/277855 | සංසෙ | මෙන්ඩිස් ටීඑන් | 6 ශ්‍රීලංසංබ |
| ඒ. | සෙ/278678 | සංසෙ | ජයතිලක කේකේඑස් | 5 ශ්‍රීලංසංබ |


සෙ/153227 ආසෙ සංජීව ටීපී ගේ විනාශයට පත් වූ නිවස


සෝ/අජිත් එස්එච්එම් සංමුවැ


ආසෙ ප්‍රසාද් අංසක


නි/65648 2/ලුති එම්එන්ටී ජයසේකර - 4 ශ්‍රීලංසංබ









## අවතැන්වූ අයවලුන් හට සංඥා බලකායේ අතහිත

පහත සඳහන් අයවලුන් හට තාවකාලික නිවාස තනාදෙන ලදී.

| | | | | |
|---|---|---|---|---|
| අ. | සෙ/65893 | මා/සැ | මෙන්ඩිස් පීඒ | 3 ශ්‍රීලංසංබ |
| ආ. | සෙ/66912 | සැරයන් | පුෂ්පකුමාර එම්ඒ | 1 ශ්‍රීලංසංබ |
| ඇ. | සෙ/275832 | ලා/කො | මෙත්සිරි පීජී | 6 ශ්‍රීලංසංබ |


සැරයන් පුෂ්පකුමාර එම්ඒ ගේ නව නිවස


ලා/කො මෙත්සිරි පීජී හට සාදා දුන් නව නිවස






අවතැන් වූ පවුල් වල ළමයින් හට සංඥා කාන්තා සමාජය මගින් වොන්ඩර් වර්ල්ඩ් ආයතනයේ පවත්වන ලද උත්සවයේ අවස්ථාවක්



සෙ/66972 සැරයන් ජයරත්න ඩීකේ. 3ශ්‍රීලංසබ



සෙ/278488 සංසෙ ද සිල්වා ඩීයූඑස් - 6 ශ්‍රීලංසංබ



සෙ/275832 සංසෙ මෙත්සිරි පීපී - 6 ශ්‍රීලංසංබ



සෙ/66912 සැරයන් පුෂ්පකුමාර එම්ඒ - 1 ශ්‍රීලංසංබ



සෙ/278678 සංසෙ ජයතිලක ජේඑස්එස් - 5 ශ්‍රීලංසංබ



සෙ/275624 ලා/කෝ ජයලාල් කේඑස් - 3 ශ්‍රීලංසංබ



සෙ/66697 සැරයන් ශාන්ත කේවී - 1 ශ්‍රීලංසංබ



සෙ/277539 සංසෙ ලක්මාල් වයිආර්එස් - 6 ශ්‍රීලංසංබ





# Micro processors



Introduction to Microprocessor (MP) is the heart of a modern computer, a chip made up millions of transistors and other element, organized in to specific functional units. The process in today's computers have grown tremendously in performance, capabilities and complexity over the post decades. Clock speed has skyrocketed and siz has dwindled even as the no of transistors while same current MP's have upwards of 40 million transistors.

Any computer program consists of many instructions for operating on data. A processor executed the program through four operating stages called fetch, decode, execute and retire. In the fetch stage processor reads program's instruction and any needed data and in the decode stage it determines the purpose of the instruction and passes it to the appropriate hardware element. The exection stage is where that hardware element now freshly fed with an instruction and data, carries out the instruction this might be an add, bit shift, floating point multiply or vector operation. The retire stage takes the result If the execution state and places them into other processor register or the computers main memory. For example the result of an add operation might be stored in memory for later use.

An important part of a microprocessor is it's built in clock, which determines the maximum speed at which other units can operate and helps synchronize related operations. Clock speed is measured in MHz and increasingly GHz Today's fastest commercial processors operate up to 2 GHz or 2 billion clock cycles per second some hobbyists speed it upto get more performance. However this raises the chips operating temperature considerably of ten causing early failure.

Processor circuitry is organized into separate logic elements, perhaps a dozen or more called

execution units. Work in concert to implement the four operating stages. The capabilities of the execution units often overlap a wrong the processing stages. ALU, EPU, branch process unit and vector processing unit are some of the common processor execution units.

Microprocessor History.

A microprocessor is a complete computation engine that is fabricated on a single chip. The first MP was the Intel 4004, introduced in 1971 the 4004 was not very powerful all it could to was add & subtract and it could only do that 4 bit at a time. But it was amazing that everything was on one chip Prior to the 4004, engineers built computers either from collection of chips or from discrete components. The 4004 powered one of the first portable electronic calculations.

The first MP to make it into a home computer was the Inter 8080, a complete. 8 bit processor on one chip, introduced in 1974. the first MP to make a real splash in the market was the Intel 8088 introduced in 1979 and incorporated in to the IBM pc. If you are familiar with the pc market and it's by Intel and all of them are improvements on the basic design of the 8088. the Pentium 4 can execute any piece of code that run and the original 8088, but it does about 5000 times faster.

The following table helps you to understand the differences between the different processors that Intel has introduced over the year.

| Name | Year | Trasistors | Clk Speed | Data (bit) | MIPS |
|---|---|---|---|---|---|
| 8080 | 1974 | 6000 | 2 | 8 | 0.64 |
| 8088 | 1979 | 29000 | 5 | 8 | 0.33 |
| 80286 | 1982 | 134000 | 6 | 16 | 1 |
| 80386 | 1985 | 275000 | 16 | 32 | 5 |
| 80486 | 1989 | 1200000 | 25 | 32 | 100 |
| Pentium | 1993 | 3100000 | 60 | 32 | 100 |
| Pentium II | 1997 | 7500000 | 233 | 32 | 300 |
| Pentium III | 1999 | 9500000 | 450 | 32 | 510 |
| Pentium IV | 2000 | 42000000 | 1500 | 32 | 170 |

MIPS stands for millions for instructions per second" and is a rough measure of the performane of a Mp.

Miroprocessor Generations

PC's are designed around different MP's generations. Intel is not the only company manufacturing MP's but by far the leading one. The following table shows the different MP generations they are predominantly Intel chips, but in the 5th gereration we see altenatives.

| Generation | MP | Year | No: of Transistors |
|---|---|---|---|
| 1st | 8086 & 8088 | 1978-81 | 29000 |
| 2nd | 80286 | 1984 | 13400 |
| 3rd | 80386 DX, 80386SX | 1987 - 88 | 275000 |
| 4th | 80486 DX, 80486 SX | 1990- 92 | 1200000 |
| 5th | Pentium | 1993m-95 | 3100000 |





| | | | |
|---|---|---|---|
| | Cyrix 6 x 86 | 1996 | |
| | AMD K5 | 1996 | |
| | IDT Winchip C6 | 1997 | 35000000 |
| Improved | Pentium MMX | 1977 | 45000000 |
| 5th | IBM/Cyrix 6x86 MX | 1977 | 60000000 |
| | IDT Winchip 23 D | 1998 | 60000000 |
| 6th | Pentium Pro | 1995 | 5500000 |
| | AMD K6 | 1997 | 8800000 |
| | Pentium II | 1997 | 7500000 |
| | AMD K 6-2 | 1998 | 9300000 |
| | Mobile P II | 1999 | 27400000 |
| | Mobile Celeron | | 18900000 |
| | Pentium III | | 9300000 |
| | AMD K 6-3 | | |
| | Pentium III CuMine | | 28000000 |
| 7th | AMD Ori Athlone | 1999 | 22000000 |
| | AMD Athlone Tunder bird | 2000 | 37000000 |
| | Pentium IV | 2001 | 42000000 |

After the 5th generation, there are millions of micro transistors are placed on a tiny silicon wafer to manufacture the MP's The MP's are processed using CMOs technology with smaller and smaller wires' The result is smaller 'dies" (the little area inside the chip holding all the transistor) with more and more transistor. The power comsupmtion goes down and the clock frequancey goes up. The MP's have doubled their calculating capacity every 18 months. This is called "Moore's Law" and was predicted in 1965 by garden Moore.

IBM succeeded as the first in making copper conductors instead of aluminium copper is cheaper and faster, but the problem was to isolate it from the silicon. The problem has been solved with a new type of coating and now chips can be designed with 0.13 micron technology. The technology is expected later to work with just 0.05 micron wiring. Texas instrument announced on August 27th 1998 that they expect 0.07 micron CMPS processing in the year 2001. AMD was the first company to mass produce copper wired MP's.

Without the MP, there would be no PC. The MP's are contnually under going further development. You can see the explosive technology development in data processing most clearly in the development of never and faster MP's the MP's have for years doubled their performance about every 18 months and there are no indentifications that this trend will stop.

**LT DANL Tennakoon**
O/65340 - 3 SLSC

## වසර 10 ක දත්ත සුරකින පෙන් ඩ්‍රයිව්

පරිගණක ක්‍රියාවලියක් තුලදී දත්ත ගබඩා කිරීම ඉතාම වැදගත්ය පරිගණකය තුළින් සිදු කරණ සෑම කාර්යයක්ම අවසන් ප්‍රතිඵලය අදාල දත්තයන් ගබඩාකර තැබීමයි. මෙම දත්ත ගබඩා කිරීමේ මූලික පරමාර්ථය වූයේ කරන ලද කාර්යයක් ආරක්ෂාකාරීව පරිඝණකය තුල තබාගෙන පසුව භාවිතා කිරීමයි. නමුත් අදවන විට දත්ත ගබඩා කරණය මගින් දත්තයන් පසු කලකදී භාවිතා කිරීම ආරක්ෂාකාරීව ගබඩා කර ගැනීම සහ දත්තයන් එහා මෙහා ගෙන යාම වැනි කාරණාද බලාපොරොත්තුවේ.




දත්තයන් ගබඩාකරණයේදී මූලික වශයෙන්ම භාවිතා වන්නේ පරිඝණකය තුල පිහිටි දෘඩ තැටියයි. එහෙත් මේ හරහා දත්ත එහා මෙහා ගෙනයාමේ හැකියාවක් නොලැබේ. දත්ත ගබඩා කිරීම සඳහා දෘඩ තැටියට අමතරව බහුලවම භාවිතා වන උපාංගය වන්නේ ෆ්ලොපි ඩිස්කට් (floppy diskette) එකයි එහි ගබඩා කල හැක්කේ ඉතාමත් සුලු දත්ත ප්‍රමාණයක් වන අතර එය 1.44 MB (මෙගා බයිට්) පමණ කුඩා අගයකි. මීට අමතරව දැනට භාවිතා වන සිප් ඩිසිකට් (zip diskette) වල තරමක් විශාල ප්‍රමාණයක දත්ත ගබඩා කල හැක. CD සහ DVD ද මේ වන විට භාවිතා වන විශාල ඉඩ ප්‍රමාණයක දත්ත ගබඩා කල හැකි වූ දත්ත ගබඩා කරගනු ලබන උපාංගවේ.

ඉහත සඳහන් කල සියලුම උපාංග වල දත්ත ගබඩාකරණය කිරීමෙන් ආරක්ෂාකාරී බව දත්ත එහා මෙහා ගෙනයාම ආදී කාරණා මනාව ඉටුකර ගත හැකිය. නමුත් ෆ්ලොපි ඩිස්කටය හැර අනෙකුත් සියලුම දත්ත ගබඩා කරන උපාංග මග්න දත්ත ගබඩාකරණය සහ දත්ත කියවීම සඳහා විශේෂ ධාවකයක් (drivers) භාවිතා කිරීමට සිදුවේ. උදාහරණයක් ලෙස සිප් ඩිස්කට් එක භාවිතයේදී ඒ සඳහා සිප් ඩිස්ක් ධාවකයක් භාවිතා කල යුතුය. එලෙසම CD සහ DVD සඳහාද දත්ත කියවීම සහ ලිවීම සඳහා CD සහ DVD රොම්ද (ROM) CD සහ DVD බර්නස්ද (Burners) භාවිතා කිරීමට සිදුවී තිබේ. මේ හේතූන් නිසා ඉහත සඳහන් දත්ත ගබඩාකරණය කරන උපාංග භාවිතය තරමක් අපහසුවී තිබේ.

දත්ත ගබඩා කරණයේදී පරිඝණක පරිශීලකයන් විසින් මෙතෙක් මුහුණ දුන් ගැටළු වලට සාර්ථක පිළිතුරක් සැපයීමට පරිඝණක උපාංග නිෂ්පාදකයින් සමත්වී ඇත. මොවුන් දත්ත ගබඩා කිරීම සඳහා නවතම උපාංගයක් නිපදවා ඇත. මෙම නවතම උපාංගය පෙන් ඩ්‍රයිවර් (Pen Drive) ලෙසින් හඳුන්වන අතර, මේ වනවිට බිහිවූ සාර්ථකම දත්ත ගබඩා කරනු ලබන උපාංගයද මෙය බවට පත්වී ඇත. දත්ත ගබඩාකරණයේදී බලාපොරොත්තු වන සියලුම ගුණාංග ඉතා සාර්ථක ලෙස මේ මගින් ඉටුකර ගැනීමට මේ වනවිට හැකිවී ඇත. වසර 1999 දී පමණ කරලියට පැමිණි මෙම උපාංගය මේ වනවිට ජනප්‍රියතම දත්ත ගබඩා කරන උපාංගය බවට පත්ව ඇත.

මෙම පෙන් ඩ්‍රයිවර් නව උපාංගය ප්‍රමාණයෙන් ඉතා කුඩා වන අතර, 8 CM වඩා දිගු නොවේ. බරින් 21 g තරම් වන මෙය පෑනකට සමාන වන ලෙසින් නිපදවා ඇත. විශේෂ ශක්තිමත් ප්ලාස්ටික් විශේෂයකින් මනාව නිමකර තිබීමත් කම්පනයට ඔරොත්තු දෙන ලෙසින් නිපදවා තිබීමත් මෙහි තිබෙන විශේෂ ගුණාංගයකි.

මෙය භාවිතා කිරීම සඳහා පරිඝණකයට පිටතින් සවිකල යුතු අතර, මේ සඳහා පරිඝණකයේ පිහිටි USB





Port ඕනෑම පරිඝණකයක පිහිටා ඇත. මෙම උපාංගය මගින් දත්ත කියවීම හෝ ලිවීම සඳහා පරිඝණකයට සම්බන්ධ කිරීමේදී එහි මුදුන් ආවරණය ගලවා පරිඝණකයට සම්බන්ධකල හැකිවූ කොටස පරිඝණකයේ USB Port වෙත නිසි ලෙස සවිකර ගත යුතුයි.

පරිඝණකයට මෙම පෙන් ඩ්‍රයිවර් සම්බන්ධ කරගත් පසු එය නිවැරදිව සම්බන්ධවී ඇත්නම් පරිඝණකයේ My Computer පිටුව හරහා මෙම උපාංගය විවෘත කරගත හැක. සාමාන්‍යයෙන් මෙම USB Disk හෝ Removable Disk ලෙසින් දත්ත ලැබෙන අතර, E හෝ F අක්ෂර මගින් ධාවකය වෙන්කර ගනී. Windows ME/2000/XP/Mac os/Linux ආදී මෙහෙයුම් පද්ධති මත ඉතා හොඳින් ක්‍රියාත්මක වන අතර, පරිගණකයට සම්බන්ධකල වහාම අදාල ධාවකය ස්වයංක්‍රීයව පරිගණකය මගින් සොයා ගනු ලබයි. නමුත් Windows 98 වැනි පැරණි මෙහෙයුම් පද්ධති මෑතදී මෙම උපාංගය භාවිතා කිරීම සඳහා ඊට අදාල ධාවකය සොයා ගැනීම සඳහා කුඩා මෘදුකාංගයක් භාවිතා කිරීමට සිදුව ඇත. පෙන් ඩ්‍රයිව් මිළදී ගැනීමේදී මෙම මෘදුකාංගය ඒ සමග දෙනු ලැබේ. මෙම උපාංගය භාවිතා කිරීමට සිදුවන්නේ Windows 98 වැනි මෙහෙයුම් පද්ධතියක නම් මුලින්ම කල යුත්තේ ධාවකය සොයා ගැනීම සඳහා තිබෙන මෘදුකාංගය පරිගණකයේ පිහිටුවා ගැනීමයි (Install). ඉන්පසු පහසුවෙන්ම මෙම නවතම උපාංගය භාවිතා කිරීමට ඉඩකඩ ලැබේ. මෙම උපාංගය තුල ගබඩාකර ගතහැකි දත්ත ධාරිතාවය 16 MB සිට 1 GB දක්වා වන අතර මේවා 16 MB, 32 MB, 64 MB, 128 MB, 256 MB ආදී වශයෙන් නිශ්පාදනය කර තිබේ. දත්ත වල ආරක්ෂාව වසර 10 ක් දක්වා සුරක්ෂිත වීමද මෙහි තිබෙන විශේෂත්වයකි. මේවායේ මිළ ගණන් එකිනෙක වෙනස් වන අතර, ධාරිථාවය වැඩිවන විට මෙහි මිළෙහි අගය වැඩිවේ. සාමාන්‍යයෙන් 128 MB ප්‍රමාණයේ මෙම උපාංගයක් වෙළඳ පොලෙහි රු. 3000.00 වැනි මුදළකට ලබා ගත හැකිය.

දත්ත එහා මෙහා ගෙනයාම සඳහා විශේෂයෙන් නිපදවා තිබෙන මෙම උපාංගය තුල ලිපි ලේඛණ පින්තූර පරිගණක ක්‍රීඩා ගීත කුඩා ප්‍රමාණයේ චිත්‍රපටි ආදී ඕනෑම දත්ත ගබඩා කිරීමේ හැකියාව පවතී. මෙහි දත්ත කියවීමේ වේගය තත්පරයට කිලෝ බයිට් 750 - 800 (750 - 800 KB/S) වන අතර දත්ත ලියවීමේ වේගය තත්පරයට කිලෝබයිට් 450 - 600 (450 - 600 KB/S) ක් පමණ වේ. ඩෙක්ස්ටොප් (Desktop) මෙන්ම ලැප්ටොප් (Laptop) පරිඝණක සඳහාද භාවිතා කල හැක.

දත්ත කියවීම ලිවීම පිටපත් කර ගැරීම පරිගණකයක සිට තවත් පරිගනකයක් වෙත දත්ත ගෙනයාම ආදී බොහෝ කාර්යයන් සඳහා මෙය කදිම උපාංගයකි. නුදුරු අනාගතයේදී ෆ්ලොපි ඩිස්ක්, සිප් ඩිස්කට් වලට භාවිතයෙන් ඉවත් වීමට සිදුවුවහොත් එහි වගකීම Pen Driver නම් හුරුබුහුටි උපාංගයට භාර ගැනීමට සිදුවනු ඇත.

පරිගණක සඟරාව ඇසුරෙනි
සෙ/277272
**ලා/කෝ සමරවික්‍රම පීපීඒ**

# Fiber Optics කේබල්

ලොව පුරා සන්නිවේදන තාක්ෂණයේ මහා පෙරළියක් ඇති කරන ලද සොයා ගැනීමක් ලෙස Fiber Optics තාක්ෂණය හැඳින්වීම සාවද්‍ය නොවේ. Fiber Optics තාක්ෂණය අනෙකුත් තාක්ෂණයන්ගෙන් වෙනස් ස්වරූපයක් ගනී අනෙකුත් තාක්ෂණයන් භාවිතා කලේ කොපර් (තඹ) කම්බිය. එය තුලින් ගලා ගියේ විද්‍යුත් ධාරාවකි. එහෙත් මෙහිදී ගලායනු ලබන්නේ ආලෝක ධාරාවකි. එය දත්තයන්ගේ වෙනස් වීමට අනුරූපව වෙනස් වේ. මෙම තාක්ෂණය උපයෝගී කරගත් විට එමගින් ලබාගත හැකි Band Width එක හා දත්ත වලට හානියක් නොවේ වැඩිදුර ගෙන යාමේ හැකියාවද වැඩිය.

විශේෂයෙන් ඉලෙක්ට්‍රොනික ධාරාවක් ආලෝක ධාරාවක් බවට පරිවර්තනය කිරීමේදී ඇතිවන දෝෂ සහ වැයවන කාලය මෙහි ඉදිරි ගමන කෙරෙහි බෙහෙවින් බලපා ඇත. අප මෙහි ව්‍යුහය මදක් සලකා බලමු. මෙහි ව්‍යුහය Coaxial Cable වල ව්‍යුහයට බොහෝ දුරට සමාන වන අතර ප්‍රධාන වෙනස වන්නේ Coaxial Cable වල ඇති පිටත සන්නායකය මෙම Fiber Cable වල දක්නට නැත. මෙහි ආලෝකය ගමන් කරන්නේ වීදුරු කම්බියක් තුලිනි. ඊට පිටතින් තවත් වීදුරු ආවරණයක් ඇති අතර එහි වර්තන අගය (Refraction value) ඇතුලතින් ඇති වීදුරු කම්බියේ අගයට වඩා අඩුය එම නිසා එය තුලින් පිටතට ආලෝකය ගලා යාම අවම කර ඇත. මෙම වීදුරු කම්බි දෙක ප්ලාස්ටික් ආවරණයකින් වසා ඇත. මෙම Fiber Cable හරහා යවන ආලෝකය නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ප්‍රභව 2 ක් ඇත.

* LED බල්බයක
* ලේසර් කිරණ

| ගුණාංගය | LED | LASER |
|---|---|---|
| දත්ත වේගය | අඩුය | වැඩිය |
| ධුර | කෙටි දුර | දිගු දුර |
| ජීවිත කාලය | ඉතා වැඩිය | කෙටිය |
| උෂ්ණත්වය | අඩුය | තරමක් දුරට |
| වියදම | අඩුය | ඉතා වැඩිය |

මෙම වගුව තුලින් එම ප්‍රභවයන් දෙකේ සංසන්දනය ඔබට දැනගැනීමට හැකිය. Twisted Fair Coaxial Cable සහ Fiber Cable වල ඇති වාසි අවාසි සලකා බැලීමේදී ප්‍රධාන සාධකය ලෙස සැලකිය හැකි වන්නේ Band Width එකයි මෙය අනෙකුත් කේබල් හා සසඳා බැලීමේදී අවට පරිසරයෙන් ඇතිවන බාධා ඉතා අඩුය. අනෙකුත් වැදගත් කම වන්නේ මල බැඳීම, විද්‍යුත් චුම්බක බලපෑම්. විදුලි බලය ඇණහිටීම විදුලි බල විචලනයන් බලපෑම් ඇති නොකිරීමයි. තඹ කම්බි භාවිතයේදී ඉහත සඳහන් සියලුදේ පිළිබඳව සැලකිලිමත් වීමට සිදුවේ. මෙය ඉමහත් අවාසියකි.

සවි කිරීමේදී වියදම ඉතා අඩුය. එම නිසා Fiber Optics ක්‍රමය ඉතා ලාභදායි ක්‍රමයකි. තවද ආලෝකය පිටතට යාමේ අවදානම නැති තරම්ය. එම නිසා පිටස්තරයෙකුට එම කේබල් තුලින් යන දත්ත ලබා ගැනීමේ හැකියාවක් නොමැත. මෙය දත්ත සුරක්ෂිතභාවයට ඉතා වැදගත්වේ.

Fiber තාක්ෂණයේ පවතින මූලික අවාසිය වන්නේ තවමත් හුරු පුරුදු නැති තාක්ෂණයක් වීමයි. බොහෝ සන්නිවේදන ඉංජිනේරුවන් මේ තාක්ෂණය පිළිබඳව තවමත් අධ්‍යනය කරමින් සිටී. මෙම තාක්ෂණය සඳහා යොදා ගන්නා උපාංග වල මිළ ඉතාම ඉහලය එසේ වුවත් අද සන්නිවේදන ලෝකය මෙම තාක්ෂණයට සෙමින් සෙමින් ඇදී යන බව පැහැදිලිය. දුරකථන සම්බන්ධතා, පරිඝණක ජාලකරණය ආදී කටයුතු වලදී Fiber Optics තාක්ෂණය ඉතා ඉහල මට්ටමක පවතී.

සෙ/277297
ලා/කෝ සන්දනායක එස්එම්ඩී ආර්එස්පී
සංඥා වැඩපල අංශය - මින්නේරිය





# දුම්පානය

දුම්කොල වියලා එයින් දුම්වැටි සදා ගැනීමේ සිරිත මුලින්ම පැවතියේ ඇමරිකාවේ ගෝත්‍රික ජනතාව අතරය. කොලොම්බස් ප්‍රමුඛ ස්පාඤ්ඤ ජාතික දේශ ගවේශකයන් ඇමරිකාව සොයාගැනීමේ ගෞරවයට මෙන්ම දුම්වැටිය මුලින්ම යුරෝපයට හඳුන්වාදීමේ අගෞරවයටද හිමිකම් ලබයි.

එංගලන්තයේ සර් වෝල්ටර් ස්කොට් දුම්වැටිය යුරෝපයේ ව්‍යාප්ත කරවීමෙහිලා පුරෝගාමියකු විය. සිරුරේ ශිතාධි ගුණයද උෂ්ණ ස්වභාවයෙන් යුක්ත දුම්කොළ දල්වා ආග්‍රහණය කිරීමෙන් සිරුරට සෙතක් වන බවටද කල ඒ අවිද්‍යාත්මක කථාවේ නිර්මාතෘවරයා සර් වෝල්ටර් ස්කොට්ය.

මුල් කාලයේ නිපදවූ දුම්වැටි ඉතා අධික නිකොටින් සාන්ද්‍රණයකින් යුක්ත විය. නිකොටින් දුම්කොළයේ ඇබ්බැහිය ඇතිකරවන ප්‍රධාන රසායනයයි. මේ නිසා මුල් කාලයේ හඳුන්වා දුන් දුම්වැටි ඉතා සීඝ්‍රයෙන් ජනතාව අතර ප්‍රචලිත විය.

ඉවක් බවක් නොමැතිව දුම්වැටි උරන ලෝකයට පලවෙනි අණතුර ඇඟවීම කලේ වෛද්‍යවරයකු නොවේ. එංගලන්තයේ පළමුවන ජෝර්ජ් රජතුමා ප්‍රථම වරට දුම්වැටි ඉරීම අහිතකර පුරුද්දක් බව ප්‍රසිද්ධියේ කියා සිටියේය. දුම්කොළවල ඖෂධීය වටිනාකමක් ඇතැයි යන ඉතා භයානක ප්‍රකාශය කල ජීන් නිකොට් ප්‍රසිද්ධියට පත් රාජ්‍යතාන්ත්‍රිකයකු විය. පෘතුගාලයේ ප්‍රංශ තානාපති වශයෙන් කලක් සේවය කල ඔහු දුම්වැටියට අසීමිතව ලොල්වූවා පමණක් නොව එයට වැඩිවැඩියෙන් ජනතාව නැඹුරුකර ගන්නා ව්‍යායාමයක නියැලුනේය. දුම්වැටියේ පවත්නා ප්‍රධාන සක්‍රීය රසායනය ලෙස සැලකෙන "නිකොටින්" වලට එම නම ලැබුනේද ජීන් නිකොට්ගේ අභිමතාර්ථයට සැලකීමක් වශයෙනි.

17 වන සියවසේදී සිගරට් නිෂ්පාදනය කර්මාන්තයක් ලෙස ප්‍රතිස්ථාපනය වුන අතර එම වකවානුවේදී රුසියාව, පර්සියාව, ඉන්දියාව හා ජපානය යන රටවල දුම්බීමේ සිරිත ව්‍යාප්ත විය. සිගරට් නිෂ්පාදනය කිරීම සඳහා යන්ත්‍රයක් බිහිවූයේ 20 වන සත වර්ෂයේ මුල් භාගයේදීය. සිගරට් නිෂ්පාදනයේ පතාක යෝධයකු වන ජේම්ස් ඩියුක් (1865 - 1925) බ්‍රිතාන්‍ය ඇමරිකානු දුම්කොළ සමාගම (BAT) ආරම්භකලේ ඒ කාලයේය. ඔහුගේ ව්‍යාපාරික ඥාණය උපයෝගී කරගනිමින් දුම්බීම චීනයටද ව්‍යාප්ත කරන ලදි. එයට හේතුව නම් එහි ජනගහනය 430,000,000 වීමයි. ජේම්ස් ඩියුක්ගේ එම ප්‍රයත්නය මල්ඵල ගැන්වින. එනම් චීනයේ බොහෝ දෙනෙකු දුම්පානයට ඇබ්බැහි විය.

දුම්කොළ සමාගම් ජනතාව වෙලාගත්තේද ඉතා උපක්‍රමශීලීවයි. මුල් කාලයේදී ජනතාව හුරු කිරීමට නොමිළයේ වාගේ සිගරට් දෙනු ලැබීය. එය සාර්ථක වීද යන්න සලකා බැලීමේදී අපේ තරුණ පරපුර ඉතා අවාසනාවන්ත ලෙස මේ ප්‍රචාර උපක්‍රමයට හසුවී ඇති සෙයක් පෙනේ. එයට හේතුව නම් ඔවුන් හඹායන්නේ වින්දනයයි. සොයන්නේ ආනන්දනීය තාරුණ්‍යයේ චමත්කාරයයි. දුම්කොළ නිපදවන්නන් ඒ රසය ඒ සතුට ගෙනදෙන බවට තිර ලෙස පොරොන්දු දී තරුණ ජීවිත වල නිරෝගී භාවය ඉතා ඛේදනීය ලෙස හානි කරනු ලබයි. මුළු ලෝකය පුරාම දුම්කොළ වෙළඳාම ආරම්භයේ සිටම තම ශක්තිය පතුරුවාගත් ව්‍යාපාර ආයතන හතක් මගින් සිදුවේ.

- බ්‍රිතාන්‍ය ඇමරිකානු දුම්කොළ සමාගම.
- ඉම්පීරියල් දුම්කොළ සමාගම.
- පිලිප් මොරිස්.
- ආර්.ජේ. රෙනෝල්ඩ්.
- ගල්ෆ් ඇනිඩ් වෙස්ටර්න්.
- රැම්බ්‍රාන්ඩ්ට් සහ රොස්මන්ස් සමූහය.
- ඇමරිකන් බ්‍රෑන්ඩ්ස්.

අද බොහෝ රාජ්‍යයන්හි ප්‍රධාන බදු ලැබෙන ආදායම් මාර්ගය වනුයේ දුම්කොළයි. දුම්කොළ නිෂ්පාදන විකුණා රජයට ලබාදෙන බදු මුදල් සංවර්ධනය වෙමින් පවතින ශ්‍රී ලංකාව වැනි රටවල ආර්ථික ගැටළු විසදා ගැනීමට මහත් උපකාරයක් වෙයි.

සිගරට් පානයෙන් ඇතිවන අතුරු ආන්තරාවන් නිසා රෝහල් ගතවනගිලනුන්ට උවටැන් කිරීමට ඊට වඩා විශාල ධන සම්භාරයක් වැයවන බව සැබෑය. එහෙත් ඒ නිසා දුම්කොළ බදු ලෙස ලැබෙන ආදායම් මාර්ගය අහුරාගත නොහැක.

ලොව ප්‍රමුඛ පෙළේ පර්යේෂණාගාර හා විශ්ව විද්‍යාල, දුම්කොළ සමාගම් වලින් ලැබෙන මුදල් ආධාර නොවන්නට බංකොලොත් වන්නට ඉඩ තිබුනි. ඒවායේ පර්යේෂණයන් සඳහා අවශ්‍යවන ඉමහත් ධනස්කන්ධයක් නොමසුරුව සපයන්නේ දුම්කොළ සමාගම් විසිනි. පසුගියදා New Scientist සඟරාව අනාවරණය කල ආකාරයට එංගලන්තයේ ඔක්ස්ෆර්ඩ් හා කේම්බ්‍රිජ් යන විශ්ව විද්‍යාල දෙකම සඳහා මේ දුම්කොළ සමාගම් යොදවන මුදල් නොවන්නට එම විශ්ව විද්‍යාල බරපතල මූල්‍යමය අර්බුදයකට ලක්වන බවයි.

දුම්කොළ වල ඇති රසායනික සංයෝග සංඛ්‍යාව දෙදහසකට අධික බව කියැවේ. මුල් ස්වභාවයෙන්ම දුම්කොළ තුල ඇති රසායනික කොටස් හැරුණු විට දුම්කොළ වගාවේදී අස්වනු නෙලීමේදී මෙන්ම සිගරට් නිෂ්පාදනයේදී ආකලනය වන විවිධ සංයෝගන් එයට අයත් වෙයි. මෙම විවිධාකාර සංයෝග අතර පිළිකා ඇති කිරීමට හේතුවන රසායනික විශාල ගණනාවක් වෙයි. එහි අඩංගු නිකොටින් නැමැති රසායනිකය ලොව හඳුනාගෙන ඇති විශාලතම ඇබ්බැහිය ඇති කරවන රසායනිකය වෙයි. විනාශය ඇති කරවන මත්ද්‍රව්‍ය ලෙස සැලකෙන ගංජා අබිං හා හෙරොයින් වල ඇති ඇබ්බැහිය ඇති කරවන ගුණාංගයට වඩා නිකොටින් වල ඇති ඇබ්බැහිය ඇතිකරවීමේ ගුණය වැඩිය. මේසා විශාල සංඛ්‍යාවක් දුම්වැටියට අවනත මෝඩයන් කරන්නට හැකිවීමේ රහස එයයි.

දුම්පානය සබැඳි විවිධ රෝගාබාධ අතුරින් වඩාත්ම භයානක වන්නේ පෙනහළු පිළිකාවයි. පෙනහළු පිළිකාවන්ට ගොදුරු වූවන්ගෙන් සියයට 90 ක්ම දුම්පානය කරන්නවුන් වීම මගින් දුම්පානය හා පෙනහළු පිළිකා අතර නොමනා සබඳතාවේ බිහිසුණු බව අවබෝධ කර ගැනීමට පුළුවන. කාන්තාවන්ද දුම්බීමට ප්‍රචලිතව ඇති රටවල වෛද්‍ය නිගමනයන්ට අනුව දුම්බොන කාන්තාවන්ට දරුවන් ගබ්සාවීමේ, මළ දරු උපත් ඇතිවීමේ අඩු බර දරු උපතකට හිමිකම් කීමේ හා ප්‍රතිශක්තීකරණයෙන් හීන දරුවන් ලැබීමේ අවදානම උරුමයි. එපමණක්ද නොවේ මේ කාන්තාවන්ට සරු බවින් නොවසේනම් දරුවන් ලැබීමේ හැකියාව අහින්ද හීනයි. බටහිර රටවල කාන්තාවන්ගෙන් සමහරකට පිළිසිඳගැනීමේ ප්‍රමාද වීමට බලපාන ප්‍රධාන හේතුව නම් දුම්බීමයි.

දුම්බොන බෙහෝ දෙනාගේ මතය නම් දුම්පානයෙන් මිදීම කිසිදා නොකළ හැකි දුෂ්කර කටයුත්තක් බවයි. යමකට ඇබ්බැහි වූවකුට ඉන් මිදීමට නම් වෙහෙසක් ගත යුතු බව සැබෑ මුත් එය නොකල හැකි දෙයක් නොවේ. දුම්පානයෙන් මිදීම සම්බන්ධයෙන් ඔබ කොපමණ පරිත්‍යාගයක් කල යුතුද යන්න තීරණය කල යුත්තේ ඔබ ඊට ඇබ්බැහිවී ඇති ප්‍රමාණය අනුවය. සමහරු දුම්පානයෙන් මිදීමට ඒ වෙනුවට රසකැවිලි ගනිති. සමහරු නැවුම් එළවළු වෙනත් ආහාර පානද ගනිති. නිකොටින් අඩංගු චුයින්ගම් වලට හුරුවීම තවත් ක්‍රමයකි. විදේශ රටවල වෛද්‍යවරුන්ගෙන් ඒවා ලබාගත හැක. මේවා වල නිකොටින් අඩංගු නමුත් ඒවා පෙනහළු තුල තැන්පත් වීමක් සිදු නොවේ. මෙහි දෙවැනි පියවර වශයෙන් නිකොටින් වලින්ද මිදීමට ඔබට සිදුවනු ඇත.

එසේම ඉතා භයානක තත්වයකි අක්‍රිය දුම්පානය මෙය ඔබ නොදන්නවා විය හැක. නමුත් එයට ඔබ ගොදුරු වී ඇති බවනම් නිසැකය. අක්‍රිය දුම්පානය නම් දුම්පානය කරන්නකු වාතයට මුදා හරින දුම අස්වාස ක්‍රියාවලිය මගින් අවට සිටින අය තම තමන්ගේ පෙනහළු තුලට පුරවා ගැනීමයි. හිතා මතා නොකෙරුවත් එමගින් ස්වශන පද්ධතිය ආශ්‍රිත රෝග හට ගන්නා බව සත්‍යයකි.

එබැවින් බ්‍රිතාන්‍ය, ඇමරිකා එක්සත් ජනපදය, චීනය, ඉතාලිය, ප්‍රංශය, කැනඩාව ආදී රටවල් දැනටමත් දුම්පානයෙන් ජනතාව මුදවා ගැනීම සඳහා විවිධ නීති රීති හා ස්වෙච්ඡා සංවිධාන මගින් විවිධ වැඩමුළු ආරම්භකර ඇත.

ඉතින් අපත් මදක් මෙදෙස සවන් යොමා බලමු. දුම්පානයෙන් ආර්ථික හා කායමය පරිහානිය පමණක් ඉතිරිවේ. කවදාවත් අපේ පාලකයන් නම් දුම්කොළ සමාගම් වලට එරෙහිව නඩු කියන්නේ නැත. දුම්කොළ සමාගම් තමන්ගේ ලාභයෙන් සතයක්වත් කාය රෝගීන්ට පිළිකා රෝගීන්ට වැය කරන්නෙත් නැහැ එබැවින් දුම්බීම තවදුරටත් කරනවාද නැද්ද යන්න තීරණය කළ යුත්තේ ඔබමයි. සිය දහස් වාරයක් හෝ සිතා නිවැරදි තීරණය ගන්න.

**කපිතාන් පීපී ප්‍රනාන්දු**
සංඥා මූලික වැඩපල - පනාගොඩ







# මගෙ පමාවට සමාවේවා

පූජානා මෙන්ඩිස්
(දියතලාවේ ශ්‍රීලංයුහ ඇකඩමියේ කපිතාන් අනුරාධ මෙන්ඩිස්ගේ මව)

කවි මුල පුරන්නේ
නෙත කඳුලු වැගිරෙන්නේ
හැකිව වාවන්නේ
කොහොම කවිපද ගැට ගසන්නේ

සුනාමිය පැනලා
ඇති ඇත්තේම ගිලලා
පිනෙකි දිවි රැකිලා
උනිමු අසරණ බවට වැටිලා

හමුදාවේ දරුවෝ
කඳ මළු බැඳන් ආවෝ
කථා බස් කෙරුවෝ
පපුවේ ගින්නට වතුර දැමුවෝ

එකම සුලු මොහොතක්
අපතේ නොදා වී එක්
එක්කෙනා එක් එක්
වැඩ කලෝ වැනි කුම් පොදියක්

අපේ පිළිසරණෙ ට
ආපු හමුදා පුතුනට
පිපාසෙට බොන්න ට
වතුරවත් නැත අනේ දෙන්නට

හාල් තුනපහ අතෙ
ඉවුමට හැලිවලත් නැතෙ
බෙදන්නට බත් පත
අනේ අප ලග පිගානක් නැත

අපෙන් අහර පැන් විඅ ය නැහැ පැතුවේ
කොහෙන් හෝ ගෙනත් අපටත් බත් බෙදුවේ
අවකැන් වූ ළමුන් නැත අමනක කෙරුවේ
දැකට වඩා ගෙහ කැඳවුරු වෝන ආවේ

දණටක් උඩින් තඳ උන ඔඩ හට්ටු ගඳ
පුරා ගෝනි පුරවා කර පිටින් ඇද
ඉවතට අරන් බඩු නිරවුන කසල මැද
හිමිකරුවනට දී පෙන්විය ගතිය හොඳ

උල්වූ යකඩ විදුරු කැට යකඩ ඇණ
නොතකා කරන බව අත්පා වලට වින
සුහිමුන් ඉවත් කරමින් තැන තැන තිගෙන
පිරිසිදු කලෝ වගකීමක් සිතට ගෙන

පෙරලුණ බිත්තිකොන්ක්‍රීට් කණු අස්කෙරුවේ
දස ඔහ යෝධයින් වාගෙයි අප හමුවේ
විරුවෝ පොලිසියේ හා තුන් හමුදාවේ
සම්භාණනීයයි අමිලයි කළ සේවේ

ව්‍යසනයෙදි අපට
පිහිටට පැමිණි අයනට
කළගුණ නැකීමට
පමාවූ බව හැගෙයි දැන් මට

ආයු බොහො වේවා
යෝධ බල විරිය ලැබේවා
ඉසුරුබර වේවා
මගෙ පමාවට සමා වේවා

## සෙබළාගේ කැප කිරීම

යුද්ධය නිමාවන්නට සාමයේ අරුණළු උතුරු නැගෙනහිරින් උදාවන්නට පෙරනිමිති අප කා අතරත්, කථා බහට ලක්වන කරුණකි. එහෙත් යුද්ධයේ සැබෑ අත්දැකීම් යුද්ධයේ කටුක අමිහිරි සිදුවීම් වලට මුහුණ පා ඇත්තේ යුධ පෙරමුණ ගත් ත්‍රිවිධ හමුදා සියලු නිළ දරුවන් මිස අන්කවරෙකු නොවේ. දැනටමත් උතුරුකරයේ කොපමණ සාම ක්‍රියාවලි සබැඳි සාම සාකච්ඡා පැවැත් වූවත් සාමය රඳා පවතින්නේ මිලේච්ඡ කොටි සාමාජිකයින්ගේ නොයෙක් ක්‍රියාකාරකම් හමුවේ ඉතා ඉවසීමෙන් හා බුද්ධියෙන් ලද සියලු යුද හමුදා සාමාජිකයින්ගේ කැප කිරීම මතයි. කොටි සංවිධානය මගින් සිදුකරන සමහර ක්‍රියා දෙස යුද හමුදාව මොනතරම් කැප කිරීමක් කරනවාද යන්න වචනයෙන් කියා නිමකල නොහැක.

රටේ ජනතාවට යුද්ධය අමතක වී ඇත. මීට ඉහත කාල වලදී පාරක් පාරක් ගානේ ගමක් ගමක් ගානේ දකින දකින හැම තැනකම සංගීත ප්‍රසංගයක් වුවත් පටන් ගත්තේ වීරෝදාර සෙබළුන්ට උපහාර පුදමිණි. එහෙත් ඒ වෙනුවට දැන් දකින්නේ ඒ හැම තැනකම විවිධ අරගල මත කියවුනු සටන් පාඨයන්ය. යුද්ධයේ සැබෑ විපාක විඳිනුයේ සොල්දාදුවන් ඔවුන්ගේ දූ දරුවන් හා පවුලේ ඥාතීන් පමණි. සොල්දාදුවාගේ ජීවිතය පඩියකට තක්සේරු කල නොහැකි. සොල්දාදුවාගේ ජීවිතය වටින්නේ මේ ලබාදෙන වැටුපට පමණද. සමහර අයවලුන් සමහර දේශන වලදී පවසන්නේ සොල්දාදුවාගේ වැටුප ගැනයි. ඒ දේශකයින් කිසිම දිනක යුද්ධය කියන වචනය දැක නැති අයවලුන්වේ. තම තරුණ යොවුන් ජීවිතය එපමණක් නොවේ රටේ සිටින නිරෝගීම තරුණ පිරිස වෛද්‍ය පරීක්ෂණ වලින් සමත් වෙලා උදාර සොල්දාදු පදවිය ලබන්නෝ වේ. සමහර විට රැකියා නැතිව රටට ජාතියට ආගමට ලැදිකම ඊට වඩා යමක් කියනවානම් නිර්භීත කම එඩිතරකම තම ජීවිතයේ අවදානම් තත්වය ගැන දැන දැන සටන් පෙරමුණට යන්නේ උදාර වූ සොල්දාදුවායි.

රටේ ඒකීය භාවය වෙනුවෙන් එදත් අදත් තම ජීවිතය පූජා කරල නොබියව ඉදිරියට ගියේ සොල්දාදු සාමාජිකයින් මිස සටන් පාඨ කියන වේදිකා වල නැග වීදි බැස කෑ ගසන හිස් මිනිසුන් නොව උදාර වූ යුද සෙබළා පමණි. සොල්දාදුවා රටේ සම්පතක් ලෙස සලකන මිනිස් සුළු කොට්ඨාශයක් හෝ ඇතැකිම අපේ හිතට පොඩි සහනයකි. යුද්ධය නොපැවතුනා කියා යුද හමුදා සියළු නිළයින්ගේ රාජකාරියේ වගකීම කැපකිරීම අඩුවක් නැත. මදකට හෝ ඇත්තේ යුද්ධය නොමැති කමේ අස්වැසිල්ලක් පමණි. සොල්දාදුවකු ලෙසින් මා අභියෝග කරනුයේ යුද්ධයක් අවශ්‍ය යැයි හැගෙන වීරී සටන් පාඨකයිනි නුඹලා නියම සිංහලයින් නම් රටට දැයට ආදරයක් ඇති පිරිසක් නම් ශ්‍රී ලංකා යුද හමුදාවේසිටින අති දක්‍ෂඋපදේශකයින්ගෙන් පුහුණු වී රට දැය වෙනුවෙන් අවි අත දරා යුද්ධයකට යන ලෙසයි. සැබෑ ජාති හිතෛෂී යුද්ධය ඇත්තේ මහපාරේ බෝඩ් එල්ලාගෙන කෑකෝ ගසන එක නොවේ උතුරු කරයට ඇවිත් නියම සිංහළයින් ලෙස සටන කරන එකයි. මාගේ එකම පැතුම ශ්‍රී ලක් බිමට යුද්ධයෙන් තොර සාමයක් උදාවී අනාගත පරපුරට සෞභාග්‍ය පිරි හෙට දිනකි.

**ප්‍රසාද් සංජය චන්ද්‍රදාස**
සංඥා රෙජි





## සෙබළ තෙළිතුඩ

### වෙසක් මස සඳවතිය

වෙසක් මස සඳ වතිය
තල් අරණ බබලවයි
දැනෙන ඒ සිසිලසට
මුළු හදම කිති කවයි
අඳුරු සෙවනැලි තුලින්
රැහැයි හඬ අමිහිරියි
ජීවිතේ පැතුම් මල්
හදතුලට මිලින වෙයි
ගෙවා ආ කටුක මග
තව තවත් දුෂ්කරයි
උතුම් වූ මිනිස්කම
දෝතින්ම වැළදගෙන
කටුක වූ මාවතෙ
තව තවත් ඇවිදින්නෙ
ඔබේ සෙනෙහස නිසයි

සෙ/276747
ලා/කෝ රාජකරුණා ආර්ඩබ්ඩබ්ජී
1 ශ්‍රීලංසංබ
දිශා සොයා ගැනීමේ බළකාය
මඩකලපුව

### අහිංසක සඳවතිය

පඬු කැවූ කහවතින් මුලු ගතම ඔවාගෙන
බෝ මළුව පිරෙන්නට හිතේ දුක් තබාගෙන
සිනා රැලි ඔය මුවේ තබාගෙන
හදවතින් නොඉකිබිඳ ඉදිනු බණ අසාගෙන

වැලි මළුවෙ පිය මනින ඔය දෙපා පොඩි අතර
පොඩිකාලේ දුව පැන්න බව අමතකව ඇත
බුදු බණම පවසනා ඔය සිහිදු තොල් අතර
එදා තිබූ සිනාවන් මැකී ඇත ඉබේටම
පඬුවතිං වසාගෙන ඉන්න හද මඩල තුල
තිබුණ දඟකාර බව අද නැහැනෙ දකින්නට
දුක සතුට බෙදාගෙන එකට සිටි කුමාරිය
කිමද විරසක වෙලා වගේ ඉන්නෙ සඳවතිය

සෙ/66842 සැරයන් පෙරේරා ඩබ්ජේඩබ්එස්
1 ශ්‍රීලංසබ



### පියාණනි නුඹ

පියාණනි මට
අමතක නොවේ කිසිදා
නිදන තුරු නුඹේ තුරුලේ
කතන්දර කීව හැටි අපට.....

මහ මෙරටත් වඩා බරක්
තබාගෙන සිටියත් හිස මත
සෙනෙහස බිදක්වත්
අඩුකලේ නැහැ නුඹ අපට.....

අපේ ලෝකේ සඳ
මෑණියන් වුයේ
නුඹ නිසයි හිරු එළිය
උතුම් මිනිස් ගුණ ඇති පියාණනි.....

මතු බුදු වෙයි මගේ මෑණියන්
නුඹේ ආසිරි ලැබෙන හින්දා.....

සෙ/279203
සංසෙ සරත් බණ්ඩාර පීආර්
සංඥා සම්බන්ධතා බලකාය
1 ශ්‍රීලංසංබ

සෙබළ තෙළිතුඩ

# නොදුටු සාමය

රට දැය රැක ගන්න යුද බිම වෙත ආවා
දැක්කම සෙබළ සිත වෙත ධෛර්යය ආවා
පුහුණුවකින් පසුව අප මෙහි ගෙන ආවා
දොලොස් වසරකුත් ලංවී ගෙන ආවා

දවසින් දවස අපෙ විරුවන් නැති වෙනවා
බුදුන් වැඩිය රට ටික ටික කෙලෙසෙනවා
බුදු දහමටත් දැන් පනතක් ගෙන එනවා
බලගතු දෙවිවරුන් වැඩ අප සනසනවා

ඉස්සර සටන් වැදුනේ කොටි වනසන්නයි
සතුරන් තුරන් කර මව් බිම රැක ගන්නයි
ඉස්සර විරුවො දැන්නම් අමතක ගානයි
සාමය මුවාවෙව් දැන් කොටි වැඩ පෙන්නයි

සීතල යුද්ධයකි දැන් රට තුළ ඇත්තේ
සතුරන් ටිකින් ටික දැන් වැඩිවී ඇත්තේ
ආවොත් ඔබල මේ මඩකලපුව පැත්තේ
දැක ගත හැකියි සෙබලුන් ඉන්නා තත්වේ

වේයකු සඳයි තුඹසක් හිසී කලාවට
මීයන් නටති බළලුන් නැති වෙලාවට
කවුරුත් සිටිති බළතල ඇති තුරාවට
කිසිවකු නොමැත එම වැරදුන වෙලාවට

සෙ/275829
සංසෙ ජයසිංහ ඩබ්ඩබ්පී
5 ශ්‍රීලංසංබ
සී කණ්ඩායම

## ජීවය දුන් ළඳුනි

ජීවිතය ජීවත් කරවීමට
නොහැකිව සිටි මා හට
අනාගතයේ ටිවි කිරණ විදා
මා අවදිකල චාන්දනිය.....

විසිරී ගිය ජීවිතය
එක්තැන් කලා ඔබ හැමවිට
අනාගතයේ පැතුම් මල්
විකසිත කලා ඔබෙ සෙනෙහස

ජීවත්වන මේ සසර පුරාවට
ආත්මයෙට් ආත්මය මා හට
හිමිවීමට ඔබ සදා කල්හිම
පාරමී පුරන්නම් හැමදාම.....

සෙ/277203 සංසෙ ද සිල්වා
5 ශ්‍රීලංසංබ සී කණ්ඩායම
මීයන්කුලම් වාලච්චේන.



## සාමය උදා වේවා



යුද ගිනි නිවා ලන්න
අපගේ හෙලහ දූහදිය
අප් අයට පෙනේනම්
සාමයට අත වනන්න

සිය දහස් ගණන් දිවි පුදා
පෙරට එන විරුවගේ
අත දෙන්න නුඹලාට
සෙනෙහසක් ලග නැවතුනේ

යුද පිටියෙ යුද වදින
වීර සෙබලුන් හට
සතුටින් සැනසී ඉන්න
සැම දෙනා හට සාමයක්

සෙ/277234
සංසෙ සයිමම් පීවම්
5 ශ්‍රීලංසංබ

## සෙබළ සිතුවිලි

බිම් අගලක් සිටින මිනිසුන් සිටින රටේ
බිම් අගලකට අවිගත් අය සිටින රටේ
බිලිදුන් නොදරුවන් බිලිගෙන විහරු රටේ
තව කැපවෙයන් අම්මේ මව් බිමට අපේ

දෙවියන් ඇති රටේ කරදර නොමවේවා
නාමය විරුවගේ සැමදා පවතීවා
මිනිසුන් විලස අපසැමදා හමු වේවා
සාමය සමාදානය ලොව පවතීවා

මා මිය ගියත් රණබිම වගුරුවා ලෙයින්
ඔබ නාඩන් අම්මේ කිසිදිනක ඉතිං
නිජබිම රකින්නට සටනට පෙරට ගිහින්
මා මිය ගියත් මට සතුටකි අම්මේ ඉතිං

සෙ/279037 සංසෙ ජයලත් ටීවී
5 ශ්‍රීලංසංබ
සී කණ්ඩායම

## මව් බිම

ඔබ මා ඉපදුන
අපේ කියා ගත් මේ මව් බිමේ
කෙලවරක උරුමය පතා
යුද වදින විරෝධාර රණ විරුවනේ

කුරිරු වූ සතුරෙකුගේ වෙඩි පහරින්
මිය ගියත් .....
මේ දෙරන මත රුධිරය හෙලා
එපා කිසිදින හිස නමන්නට
විරුවනේ මේ මව් බිම පරදා .....

සෙ/විඑල්ඩී1585 ආසෙ චතුරංග කේඑඩි
2වන සංඥා බළකාය
යුද හමුදා ජනපදය
පනාගොඩ - හෝමාගම





## බුදු බණක මහිමය



අමාවක සඳ එළිය ඇතිකර
ලොවට පෙන්වන පිනේ මහිමය
ගැන සිතන කොට මට ඉබේටම
සිහිවේවි බුදු රදුන් දෙසූ බණ

සිතේ ඇති උණු ලබැදියාවට
පින් බිමක ඉඳ අසන්නට බණ
නැතත් මට අද යුද බිමක ඉඳ
සිහි කරමි බුදු රදුන් දෙසූ බණ

සංසාර ගත පවින් වෙන්වී
රුදුරු දුක් ගිනි අතර නොතැවී
ලැබෙන දවසක බුදු රදුන් දැක
නිවන් දක්නට සිහි කරමි මා නිතර බුදු බණ

## ත්‍රිකුණාමලේ බුදු පිළිමෙට

දිව රෑ දෙකෙහිම මුරකාවල්ද දමා
තිබුනේ දනන් හට බොදු බැතිය යොමා
ඝණ දෙවියන් පවා වැන්දත් හොඩය නමා
ගැසුවේ බෝම්බය දෙවිදත්තරලා තමා

දෙවිදත්තර එදා පෙරළුව ගල් පොත්ත
යන්තම් සීරුවත් නා හිමිගේ නිය පොත්ත
විහිදා මෛත්‍රීය කරුණා මුදිතා මෙන්න
පෙන්නු හැටි අගෙයි ගුණ සමුදායක සත්ත

දරමින් යලිත් යුද ගිණි අවුලවන තැනක්
කරමින් සුනුවිසුනු කෙරුවත් කොන්ක්‍රීට් ගොඩක්
විහිදා මා හිමි ගුණලොවටම කරලා පසක්
නොතිබිය යුතුයි වෛරය කරුණා ගුණය මිසක්

සෙ/275980
ලා/කෝ ගුණවර්ධන බීඩී
ඩී බණ්ඩායම
5 ශ්‍රීලංසංබ

## විශ්මිත බළවතා

හැම මිනිහෙකුටම මේ ලොව ඉපදුණ මැරුණු
යුතුකම් තිබුන මුත් නුඹගෙන් ඉටු කෙරුණු
බිහිකර බෝම්බය විසතුරු පරමාණු
ලෝකය කරන්නට ඇයි හැදුවේ සුණුවිසුණු

ලස්සන මෙන්ම බොහො දේවල්ද සැත
ලැබුනේ පිරිමදින විට උඹගේ එත
විශ්මිත බළය නුඹ ලඟ ඇති අපරි මිත
මම අත්හරින්නෑ උදුරා ගන්න තැන

රෑ බෝවේ එළිවනහැම මොහොතකම
හදුනා නුබේ හොඳ හා නරක හැම
මිනිසුන් අතින් ගිලිහී යන මිනිස් කම
යලි මිනිසුන්ට දෙන්නට වෙර දරමි මම

සම්මා සම්බුදුටත් අපගේ තිලෝ ගුරු
බුදුවෙන්නට පවා නුඹ මගු උනේ ගුර්‍රු
එම්බා මිනිස් සිත ලෝකයෙ මැවුම් කරු
ලොව වැනසේවි නුඹ නිසි මඟ නොයන තුරු

සෙ/275980 ලා/කෝ ගුණවර්ධන බීඩී
ඩී බණ්ඩායම - 5 ශ්‍රීලංසංබ

## 5 වන බළකා සංඥා මව්තුමිය

අනු හතරේ දුරුතු මාසේ ලැබුවෙමි
දෙවැනි දිනයේ උපත
නොයෙක් බාධක කම්කටොළු මැද හිමාලනි
වසර එකොලහක්
කුම්න විලසින් ගැටළු ආවත් උනි
සෑම විටදිම සිනහවෙන
එදා සිට මේ වන තුරුම ඇය බැබලුනි
තාරුකාවක් ලෙසින්

එදා පටන් 5 වන සංඥා කොමලී
මඩකලපුවේ සිටියෙමි සැමදා බැබලී
සැම මොහොතකම තිබුනත් යුද බිම ඇලලී
සිටියෙමි මහා ඉමිකය විලසින් නොසැලී

පර සතුරන් පැමිණ රට වනසන විදද
ලක් මාතාව සිංහලයන් හට රැකදී
දරුවනි යමවු පෙරටම කියමින් දිරිදී
පැවසූ ඔබට නමදිමි තුති මල් පුදදී

බාධක පැමිණි විටදී නොසැලී සිටිමින්
දරුවන් හට කියාදී ගුණදම් යහමින්
5 වන බළකාය සංඥා මව් තුමියන්
නමදිමි දෙපා පදමින් තුති මල් කවියෙන්

සෙ/275820 සැරයන් කරුණාරත්න පීඑම්
5 ශ්‍රීලංසංබ - ඒ කණ්ඩායම
552 බසේමු -වාලච්චේන

සෙබළ තෙළිතුඩ

# දුම් වැටිය මම නුඹට වෛර කරමි

ජීවිතයේ හද යෞවනයේදී මා නුඹව හදුනා ගත්තේ හදපිරි සතුටින්
මෙලොවදී මා හමුවට පැමිණි උතුම් මිත්‍රයකු ලෙසින්
කාලය ගෙවී යද්දී නුඹ මා හට නින්දා පීඩා විනාශකාරී සියළුදේ
ළඟා කල මුත් මා හට එය නොතේරුණේ නුඹ මා හද තුළට
අති ජාත මිත්‍රයකු ලෙස කිදා බැස සිටි හෙයිනි
එහෙත් අද මා පසු තැවෙමි
මන්ද නුඹ වැනි මිත්‍රයකු ජීවිතයේදී හමුවූ බැවින්
නුඹ මා හට ආදරය කලා නොව
ඒ මුලාවෙ මා හට විනාශය කරා ලඟා වෙන්නට ඉඩ සලස්වාදී
නුඹ සිනාසී අදටත් බලා සිටී
මගේ මොනයම් හේතුවක් නිසාදෝ මම නොදනිමි
අද මේ සිතුවිල්ල පහල වූයේ නුඹෙන් සමු ගන්න වෙලාව ඇවිදින්
මා නුඹෙන් මිදුනාට නුඹට ඇති පාඩුවක් හෝ යාළුවන්ගේ අඩුවක් නොවෙති
දිනෙන් දින නුඹ කරා ලඟා වන්නවුන් බොහෝය
එයට පිළිතුර කොතැනද මා නොදනිමි. එහෙත් මා ජීවත්වන්නාවූ තාක් කල්
තවත් එකම හෝ යහළුවකු මිතුරෙකු නුඹගෙන් බේරා ගැනීමට හැකිනම්
මම ලද ලොකුම ජයග්‍රහණය වේවි
පරක් තෙරක් නොමැති ලෝකයෙන්
නුඹ විනාශ කිරීම අපහසු බව මා දනිමි
එහෙත් නුඹ විනාශ කිරීමට මා සැමවිටම වෙහෙස වීමට ඉටා ගනි.
දුම් වැටිය මම සැමදා නුඹට "වෛර කරමි".

සෙ/277435 සංසෙ බංඩාර ආර්එම්එස්එස්
5 ශ්‍රීලංසංබ
ඒ කණ්ඩායම

# වියෝවූ සොයුරාට උපහාර පිණිස

මල්ලිගෙ අතින් අල්ලාගෙන අයියෙ ඔයා
මතකයි වෙල්යායේ විදුහල වෙතට ගියා
මව් බිම රැකගන්න ඕනෑ කියල ඔයා
ඉගෙනුම නිමාකර යුද පෙරමුණට ගියා

මාවෙඩිවෙමිමු කියනා පොඩි ගම්මානේ
මගෙ සුදු අයියා එඩිතර සටනට යෙදුණේ
සතුරන් අතින් වෙඩි පහරක් එල්ල වුණේ
ඒ වෙඩි පහරෙනුයි අයියා නිහඬ වුණේ

වසර තුනක් අවුරුදු මාසෙට ගෙවුනා
විතක තුනක් ලෙස අප හදවත දැවුනා
මව්පිය දෙදෙනා සමගින් අක්කලා දෙදෙනා
මේ ලෙස වැලපෙනව එක මල්ලියේ කියා

# වේදනාවක්වූ ආදරය

ඉරුණු තල්පෙති අතර සැගවී
පෑරුණු සිතැතිව ඉන්නා විට මා
බිහිසුනු වෙඩි හඩ මැද
ඔබේ දෙනෙත දක්න තුරු
නොඉවසිල්ලෙන් නෙත් අයා සිටිමි මා
මහා වෙඩි හඩ මැද
ඇසෙන ඒ මිහිරි හඩ
දෝංකාර දේ තවත් මට
එදා කියූ ඒ ආදර වදන
අමතක නොවේ මට
එසා ඔබ දුන් ඒ ආදරය
නමුත් ඒ ආදරය අහිමිවී
වේදනාවක් ගෙනදෙයි මට අද දින.....

සෙ/154232 ආසෙ සරත්කුමාර ඩීඑම්ජේ
5 ශ්‍රීලංසංබ
සී කණ්ඩායම

# බංකරේ නැහැ තනිය

ජීවිතේ තුරුණුවිය බංකරේ ගෙවනවා
හදවතේ දුක් කඳුලු නෙත් පුරා ඇදෙනවා
යෞවනේ පැතුම් මල් මිලිනවී වැටෙනවා
කල දඩබ්බර කමට වන්දි ඈ ගෙවනවා

තනි වුවද බංකරේ නැහැ තනිය දැනෙන්නේ
ඒ නිසයි ගිණි අවිය අත් දෙකේ රැඳෙන්නේ
රට නිසයි මේ තරම් දුක් කඳුලු හෙලන්නේ
දැනෙන විට හදවතට මිහිරක්ය ලැබෙන්නේ

සෙ/154623 සංසෙ රත්නායක ආර්එම්අයිඩ්





සෙබළ තෙළිතුඩ



# මගෙ ආදර අම්මා

ලේ කිරි කර මට පොවලා මා දැඩි කල අම්මා
යහගුණ මට කියාදීලු ඔවදන් දුන් අම්මා
හරි මග යන්නට මා හට පාර පෙන්නු අම්මා
මතු බුදු වෙනවිට පතනෙමි මගෙ උදාර අම්මා

වරදක් කල විටදී මෙමට ආදරයෙන් අම්මා
නිවැරදි කර ගන්න අයුරු කියා දුන්න අම්මා
නොකා නොබී නිදි වරලා මා හැදු වැඩු අම්මා
මතු භවයෙත් ඔබේම පුතු වෙන්න පතමි අම්මා

සෙ/276209
ලා/කෝ අනගිරත්න කේජී
5 ශ්‍රීලංසංබ
යුද හමුදා කඳවුර
නාවල්අඩි - වාලච්චේන

# හැරදා ගිය මව්නි

අප හැරදා නුඹ ගියදා
හද බිදුනා අම්මේ
හදවතට දැනුනු දුක කියන්නේ
කොහොමද අපේ අම්මේ
දුක දැරුවේ ඒ විදිහට
අපි පොඩි උන් අම්මේ
පොඩි උන් දැන් ලොකු උන්
නුඹ දැක නැති අම්මේ
නුඹ දුක් වෙයි මේ ලොකු උන්
දුටුව දාට අම්මේ
නුඹ ගියතැන මේ විලසට
දුක් නොමදෙන් අම්මේ

සෙ/276518 කෝප්‍රල් ප්‍රසන්න ලංකා ඩීආර්
1 රෙපී ශ්‍රීලංසංබ
යුහ කඳවුර මින්නේරිය

# සහයෝගීතාවය අපි නිර්මාණය කරයි

**ඔබ සහ සතුට**
නරක ප්‍රතිඵල නොව හොඳම ප්‍රතිඵල බලාපොරොත්තු වන්න ඒ සඳහාම සැපවන්න ජීවිතය ගැටලුවක් කර නොගන්න, ගැටලුව ජයග්‍රහණය සඳහා අවස්ථාවක් කර ගන්න. ජයග්‍රහණය මෙන්ම පරාජයද, ජයග්‍රහණය සඳහා යොදා ගන්න.

**සතුට අපකරා නොඑී**
සතුට තමා තුලම ඉස්මතු කරගත යුතුයි සතුට තමා තුල වර්ධනය කර ගැනීම සඳහා නිරන්තරව පුරුදු පුහුණු විය යුතුය. යහපත් අරමුණු යහපත් ක්‍රියා මාර්ග නොපසුබට කැපවීම් තුල ජයග්‍රහණයත් සතුටත් නිර්මාණයවේ.

**නායකත්වයෙන් බිඳක්**
ජාතික ආගමික ගෝත්‍රික රාජ්‍ය දේශපාලනික ආයතනික වශයෙන් නායකත්වයක් නිර්මාණයවේ. නායකත්වයේ ගුණාත්මක බව මත ලෝකයේ දියුණුව මෙන්ම විනාශයද සිදුව ඇති බවට ඉතිහාසය සාක්ෂි දරයි. යහපත් අරමුණු ආධ්‍යාත්මික පදනම නිවැරදිව සැලසුම් සාර්ථක උපාය සහ ක්‍රියා මාර්ග නොසැලෙන කැපවීම් සාමූහික සහභාගීත්වය විමර්ශණය ඇගයීම සහ නිවැරදිවීම අවධානමට මුහුණදීම සැමට ප්‍රතිලාභ අත්කර දීම සැබෑ නායකත්වයක ගැබ්ව ඇත.

සැබෑ නායකත්වය ප්‍රජාවට ආශිර්වාදයකි. ප්‍රජාවේ දියුණුව ඒ මත රදා පවතී.

සෙ/66100
බනි 11 බණ්ඩාර ඩීඑම්කේආර්

# අසරණ සරණට තුති පුද

පින් පවුකල සියළු දෙනට එක විලයසි හමා ගියේ
දකුණු ලකින් සෝ සුසුමයි නිති ගුවනට නැගී ගියේ
උන් හිටි තැන් උස් මිටි කම් නැති කල රළ එකර දියේ
දහසින් පන නලද රැගෙන සුනාමි රළ හා ගියේ

නිති උතුමන් සතුගුණ දම් ලෙස ඔබ සඳ සෙබළ බලේ
දුක දකිනට ආපු එකත් ලොකු සතුටකි අපගේ පැලේ
අසරණවූ සෙබළ කැලට පිහිට වෙච්ච සියළු වෙලේ
බළකා අධිපති තුමනට තුති පුද වෙයි මෙපද වැලේ

අප සතු වූ සියලු ධනය ජීවත්වූ පැලද සමග
බෝහෝ දෙනද රැගෙන ගියේ ලය රැදි පන නලත් සමග
අවතැන්වී පන්සල් හා කඳවුරු වල දරුවෝ සමග
සහි ගණනින් ගත කල හැටි සිහිවේ රල හඩත් සමග

අසරණ වූ විට බොහෝ දෙන සිහියට එන සියලු වෙලේ
දෙවියෝ මෙන් සෙබළා යන ඔබ රන් වැකකි තවම දිලේ
වැජඹෙන්නට ජය ලබමින් හෙල බල මුළු ඉහළ හිලේ
පැතුම් සමග දීඝායුෂ පතා මෙකවි සෙමර සැලේ

ආත්ම ගෞරය ඇතිව සෙබළකු ලෙස දිවි ගෙවන්න
පෙර විලසම සිතැගි පරිදි උන් හිටි තැන් හදා ගන්න
සියළුම ඉඩකඩ සලසා අපහට සහනයක් දුන්න
බළසේනා පතිතුමනට අවසර මට තුති පුදන්න

අවතැන් සෙබළුනට නිවහන් සදා නිති
නෙක නෙක සහන සලසනවට පුදා තුති
සුනාමි කම්ටුවට හා එහි සභා පති
තුමනට බැඳේ මේ පදවැල් අගේ ඇති

සුන් කරමින් සිත බිය සැක දෙක සැමවිට නිරන්තරේ
දුන් සහයට කතරගෙවා සිටන් පැමිණ අනුර පුරේ
සෙන්පති තුම ඇතුළු මගේ මව් ඒකක සැවොම කෙරේ
රන්-රසවන් තුති පුදයෙන් මේ කවි මල් කැකුළු පිරේ

දයානි සිල්වා මැතිණිය සමගින් නෝනලා නිතර
දිරිමත් කර දූ දරු හැම තෑගි රැගෙන පැමිණ අතර
ඔබසත් ගුණ කිය වෙනවා නිතරම පොඩි ළමුන් අතර
ලැබඅය යුතුයි ජය සංඥා හිළදරු කුළගනන් නිතර

දිවා රෑ දෙකේ වෙහෙසී ගෙන බෝම
අපට සෙවන දෙනුවස් කලු කැප වීම
සෙබළ සොයුරන්ට මගෙ සැම හිළයේම
තුති මල් පිජේ හදවත තුල හැමදාම

දොස ඇති තැන් ඇත කීමට තැන අවසර යන වමැයේ
දැක දැක ඉන් පසු නොබැසිම් අරුන වියයි සෙබළ වියේ
දුක දැක අප සරණ වෙච්ච සංඥා මෑණියන් මයේ
ජය සම්පත තුරුළු කරන් වැජඹේවා සියළු පැමයේ

සෙ/66893 මා/සැ මැන්දිස් පීවී
3 ශ්‍රීලංසංබ

## DREAMS OF SOLDIER

As I am a soldier
I should die
Thinks only this of me
That there is a corner of battle field
Forever in Sri Lanka
Her rich earth, surrounding seas
Mountain, Rivers, Flowers and Birds
And everywhere and every thin under her Sun
Of my own native land
Till we live It won't be divided
And thinks this heard all evils blow a way
Peace will come to every minds .......?
Her sights and sounds
Dreams happy as her day
Laughter, learnt from friends and gentleness
In heards at peace in the land of Sri Lanka

S/275389 Sgm De Silva DST
Comm Sqn - 3 SLSC

## අපේ ලක් මව් අපි හැදූ මව්

අපේ ජීවිත පරදු කරලා රට රකින්නයි ඉපදුනේ
අපි හැදූ මව් පියන් හට බැති ගීත සැමදා ගයන්නේ
අපේ රටදැය අපේ ජාතිය උතුම් ලෙස අපි පුදන්නේ
ලක් මවුනි ඔබ ආදරෙන් අපි සදා කල්හිම රකින්නේ

රණබිමේ ඇති ලේ බිඳෙන් බිඳ වැගුරුනත් අපගෙන් සදා
ඒ ලෙයින් නැහැවුනු අපේ බිම රකිමු සැමදා වැර යොදා
අපේ ලක් මව් අපි හැදූ මව් සදා රැකලමු දිවි පුදා
සසර මතුදා දිනමු ලක්බිම එකට එක්වන ලෙස සදා

සෙ/154811ආසෙරත්නායකආර්එස්
3 ශ්‍රීලංසංබ







# ආදරණීය මව්නි මගේ



දස මසක් කුස තුල හොවා
නොවිදිනා දුක් විඳ
හරියටම අදට අවුරුදු 25 කට පෙර
මා මෙලොවට බිහිකල
දයාබර මව්නි මගේ
මුවේ නුබපෙව් කිරි සුවඳවත් මැකෙන්නට පෙර
රුදුරු ගිණි අවිය අනදරා
ගිණිගත් තල් අරණට පැමිණි
නුබේ දගකාරයාගේ එකම ප්‍රාර්ථනය
මතුත් උපදින සැම භවයකම
උපදින්න මා නුබේම පුතනුවන් වී

# ආදරණීය පියාණනි මගේ



මා කිරි කැටි වියේ සිට
ආදරයෙන් රැකබලාගෙන
දණගාද්දි ඇවිදින්නට මට
අතදුන්
ආදරණිය මගේ පියාණනි
අද නුඹ වියපත්වී ඇවිද
ගන්නටවත් නොහැකිව
කිරිකැටි දරුවකු සේ සිටින විට
නැගිටින්නට අතදෙන්නම්
ආදරණිය පියාණනි මගේ
තවද මගේ ඒකායන ප්‍රාර්ථනාව
වනුයේ
මතු උපදින සැම භවයකදීම
නුඹේ ලෙයින් සැදි නුඹේ තුරුලේ වැඩී
නුඹේ පුතකු වන්නය...

සෙ/278665 සංසෙ ධර්මසිර එච්ඊ
6 ශ්‍රීලංසංබ (ආ/බ)
බී කණ්ඩායම
524 බසේමු
පේදුරුතුඩුව - යාපනය

# දයාබර නැගණියනි



උදෑසන පිබිදී හනික
පිය නගන නැගෙණියනි
දහදිය අතර කදුලු දිය කරන
දයාබර නැගෙණියනි

අනාගතය නමැති සරදමට
පහුරු බදින පුංචි නුඹේ සිත
ඩැහැ ගැනීමට වෙර දරන
කුහකුන් බොහෝ ඇත
එවින්ගෙන් බේරෙන්න
ධෛර්යය සිතට ගෙන
චරිතවත් නැගෙණියක් ලෙස
සිදා දියට සමුදෙන්න

සෙ/279893
සංසෙ බණ්ඩාර ඩබ්එම්ජීඑස්
6 ශ්‍රීලංසංබ (ආ/බ)
524 බසේමු
පේදුරුතුඩුව - යාපනය

මුලු ලෝකයම ජය ගත්තේ තම
නිරෝගී භාවය අහිමි කරගත් මිනිසෙකුට
ඒ සාර්ථකත්වයයෙන් ලැබෙන
ලාභයක් නැත.
සෙ/154637 ආසෙ රාජකරුණා ආර්එම්එස්ඩීආර්

# සිත

## පාවී ගියත්

### සිතේ නැහැ තරහවක්

පැලදිග අහසේ සැන්දෑ වලාවේ
කවුළු දොරින් පැන යද්දී
විමසුම් දෑසින් බලා උන්න මමත්
අනෝරා වැහි වැටි සිතිජ ඉම බොඳ කරන්

හිත පාවී ගියත්
සිතේ නැහැ තරහාවක්
නෙතින් නෙත ගැටී පෙර දිනක හමු වුවත්
මතක පමණක් ගියේ හදවතේ පතුලමත

සොවින් වැලපෙයි පවන් රොද
ඉතින් නම් යන්න බෑ දුරක්
ඔබ ගිහින් ඈතටම
විරහින් හිස්මුණු සුසුම් පොදින්

යදිම් මා කඳුළු බිඳු
ආත්මය සමුගෙන ගියත්
ඉතින් නෑ තරහක් ප්‍රේමයේ නාමයෙන්

සෙ/277631 ලා/කෝප්‍රල් දිසානායක ඩීඑම්ජේඑස්යු
6 ශ්‍රීලංසංබ (ආ/බ)
මූලස්ථාන කණ්ඩායම
පේදුරුතුඩුව - යාපනය

## බංකර් කුරුටු ගීයක්

කොයිකාටත් එකයි කියලා
හිච්පුම් ඇති කලා
අපිත්වීක පිළිගත්තා
අප්පුඩි තලතලා

එල්ටීටීය ගුවනින් යයි
පැරිස් නුවර බලා
අපි තවමත් නිදි මරණවා
බංකරයට වේලා

සෙ/275980
ලා/කෝ ගුණවර්ධන ඩීඩී
ඩී බණ්ඩාරගම
5 ශ්‍රීලංසංබ

## රණවිරුවෙනි යලි අප හා එක්වන්න

සුරතොහි ගිණි අවිය සුදානම් බැල්ම
වනයෙහි රැදී හිඳ - හිරු දිලෙන කල්ම
සතුරන් සනා හෙල විකුමන් පෑ ..... මුල්ම
යුගයන් අමතකද සොයුරනි..... පෑ..... ඇල්ම

නිල ඇදුමක් පැලඳ සොල්දාදුවෙක් වෙලා
රට දැය රැක ගන්න යුග මෙහෙවරක් කලා
ජය රැඹ පෙනි පෙනී..... නිම වන සටන බලා
ඉන්නේ කෙලෙස සොයුරණි ඔබ නිහඬ වෙලා

ලංකාවේ වෙසෙන අප මහ ජාතියද
බර්ගර් දමිල යොන් සුළු දෑ රාශියද
මිනිසත්කම නමින් රකිනා නීතියද
අප රැකගත යුතුයි ..... නැතිකොට භීතියද

මව්පිය සොහොයුරන් බිරිඳත් සහ දරුවන්
රකිනා ලෙසින් රටදැය සමගින් තොරුවන්
රැකගත යුතුයි හසමින් දඩයක් කාරුවක්
එවිටයි වන්නෙ සොයුරණි..... අප සැම විරුවන්

සේවය අතරමග නවතාලා ඉන්න
සොයුරණි..... යුද උපක්‍රම හොඳහැටි දන්න
යුද්ධය දිනාලා කුසලානය ගන්න
හැකි ඉක්මනින් යලි ..... හමුදාවට එන්න

සෙ/66479
මා/සැරයන් ජයලාල් කේඑම්එස්
සංසංබ
5 ශ්‍රීලංසංබ

## ආදර්ශමත් ලොකු හාමුදුරුවෝ .....

නෙක නෙක පාට මල් බුද්ධාසනය පුරා
ගඳ කුටියෙන් නැගේ සදහම් ගුණය පෙරා
සිය දහසක් පහන් එහි ආලෝක කරා
ගම දහමින් රැකෙයි පන්සල - තිබෙන තුරා

තෙරුවන්ගේ ගුණය සිත තුල ආරක්ෂා
කර මෙන් වැඩීමෙන් සැම දිවි වෙයි රක්ෂා
ලොකු හාමුදුරුවන් බුදු ගුණයක් වස්සා
පැන් කොතලයෙන් මල් අසුනට පැන් ඉස්සා

දංගෙය අසල මිහිරැති සුවඳට මුසුව
අම්මා ලෙඩ ඇඳේ කිසි අහරක් නැතිව
ඇය සමකල හැකිය බුදු රදුනට සිතුව
එළියට ආවෙ දංගෙය දානෙත් ඇතිව

දං හොරකම් කලත් පන්සල් බිමේ සිට
යන්නට හැකිද කොල්ලෝ නොපෙනිලා මට
ඇකිත්තෑ තෙමේ යම රජු විලාසෙට
ගුටි පූජා දරුවට පොල්ලක් කඩා වැට

අම්මා අංශ බාගෙන් දුක් විදින කොට
අපගේ පියාණන් කුලියට ගියා පිට
ගල් වැඩ පලේ ගල් බෝරිය දමන කොට
දුප්පත් තාත්තා අහිමිව ගියා මට

නව අවුරුද්දෙ වයසැති මේ පොඩි දරුවා
ඉකි ගසමින් අඩන හැටි ඇසුමට බැරුවා
ලොකු හාමුදුරුවෝ වී ගැලවුම් කරුවා
අසරණ දරුවාගෙ සිත සුවපත් කෙරුවා

පන්සල කියන්නේ පොදු දේපළයි මහා
අසරණ මේ පවුල ගොඩගත යුතුය විහා
ගොස් සැපදුක් සොයා මේ පුතු මවගෙ දිහා
ආදර්ශමත් විය සගරුවනටම මහා

සෙ/66479
මා/සැරයන් ජයලාල් කේඑම්එස්
සංසංබ 5ශ්‍රීලංසංබ





## සුනාමි බේදවාචකයෙන් බිඳක්

සිටි සැටියෙම ජල රකුසා කෝප වුනා
නොසිතූ ලෙසට මහ රළ ගෙඩි ගොඩ ආවා
ජීවිත රැගෙන දිය රකුසා මුහුදු ගියා
ලොවින් අඩක් ඇසුරු සැනින් මරු දුටුවා

මුහුදු පතුලේ අසරණයින් නිදන් වුනා
තව කොටසක් දියඹ දෙසට ගලා ගියා
තව කොටසක් සැඩ පහරට මරු දුටුවා
ඉතිරි කොටස ලෙඩින් පෙලී මිය ඇදුනා

සැමියට බිරිඳ බිරිඳට සැමියා අහිමි කලා
මවට දරුව දරුවට මව අහිමි කලා
පියවරුන්ට දරු සෙනෙහස අහිමි කලා
නෑ හිතවතුන් සැම අපහට අහිමි කලා

ඇදිවත පමණි අද සාටත් ඉතිරි උනේ
ජල දෙවියගේ දුන් දඬුවම හරිම අගේ
මෙවන් විපත් මින් මතුවට නොදෙනු අනේ
නැවත එනු එපා ජීවිත ගන්න අපේ

සෙ/278215
සංසෙ රුවන් සමීර ටීපී
6 ශ්‍රීලංසංබ

## සෙබළ තෙළිතුඩ

## වැසි දවසක්

ටිකටික අඳුරක් එන්නේ
සුළඟට ගස් සෙලවෙන්නේ
වැහි ළිහිණියෝ පියඹන්නේ
වැස්සයි මේ ලඟ එන්නේ

විදුලි රේඛා අහසේ දිලෙයි
ගිගුරුම් හඬ අහසේ ඇසෙයි
හිරිකඩ පොද ඇඟට වැටෙයි
දුවමු දුවමු අපව තෙමෙයි

සෙ/278077
සංසෙ ප්‍රේමතිලක එම්එල්එස්
මූලස්ථානය 6 ශ්‍රීලංසංබ
පල්ලේපායි - යාපනය

## අම්මේ

සිත පවන රලු වෙනවා
තල් අරඹ වෙව්ලනව
මගේ පාලුව මකා ගන්න
මම ගී වැල් අමුණනවා

මලේ බඹරු රොන් උරන්න
මල් වටේට කැරකෙනවා
යුද සෙබළුට පෙම් කරන්න
පෙම් පණිවිඩ මුමුණනවා

යුද්ධය නැති අද දවසේ
සාමය මෙහි රජ වෙනවා
අම්මේ ඔබෙ චූටි පුතා
මුර කුටියක තනිවෙනවා

සෙ/277924
සංසෙ ගුණරත්න කේයූඑස්
මූලස්ථානය 6 ශ්‍රීලංසංබ
පල්ලේපායි - යාපනය



## සෙබළ ජීවිතය

නිහැඩියාව ඇත ලොවම
ලොවම ඇත නිදියගෙන
ඝණ අඳුර පැමිණෙන රාත්‍රියේ
හින්දක් නොමැති මා නෙතට

පාලුවක් තනිකමක් හැමවිටම
රිදුම්දෙයි මා සිතට
පවන මඳ සුලග සීතලයි
දරා ගන්න බැහැ වතට
නිදියහන මත රැදී නුබ
හෙළන සුසුම් හඬ මට
ඇසෙයි මට දැනෙයි
රිදුම්දෙයි හදවතට

නුබේ සසුමට සමව
සුසුම් හෙලනු මිස මම
වෙන කුමක් කරන්නද
මෙයයි සෙබළ ජීවිතය

සෙ/2004එච්එල්ඩී1597
ආසෙ බස්නායක සීඩීඑස්එස්
2වන සංඥා බළකාය
යුද හමුදා ජනපදය
පනාගොඩ - හෝමාගම

## සෙබළ සිතක්

මැයි මල් පිපිලා පාර පුරා
හීන පෙනෙනවා ආලපුරා
ඔබේ අත් අල්ලන් යන්න හිතෙනවා
අනන්තයෙන් මග ගෙවෙන තුරා

අහසෙත් පොළවෙත් මල් වැහි උතුරනවා
වසන්තයේ සැනකෙළිය ලගයි
අවුරුදු ආවත් රට පුබුදන්නට
ඔබ ලග නැති අවුරුද්ද දුකයි

සෙ/277639 ලා/කෝ කුමාරසිංහ එම්ජීඩී
මූලස්ථානය 6 ශ්‍රීලංසංබ
-පල්ලේපායි යාපනය

## සොල්දාදුවකු වීම

පරිපූර්ණ වෘත්තීමය සොල්දාදුවකු වීමට සැම අයෙකුට නුපුලුවන. ඒ සඳහා විශේෂ කැප කිරීමක් අධිෂ්ඨානයක් විනයක් ශික්ෂණයක් අවශ්‍යය. එම ගුණාංග නැත්නම් එය ප්‍රගුණ කල යුතුය. එය අසීරු කාර්‍යයකි දුෂ්කර ක්‍රියාවකි සොල්දාදුවකු වීම සැමට නොහැකිය කීවේ එම නිසාය කෙසේ වුවද අප අපේම කැමැත්තෙන් හමුදාවට බැදී ඇත්තෙමු

සෙ/122971
ලා/කෝ තුෂාර ඊපීපී
6 ශ්‍රීලංසංබ (ආ/බ)
පල්ලේපායි - යාපනය

## සෙබළ තෙළිතුඩ

# සිතක සේයා



මහද ලැගුම් ගත් සඳය ඔබ
සදා සිහිනයක් වී හදෙහි ලැගුම් ගෙන
පාරමී පුරා හදවතින්
ඔබට මා පෙම් කලත්
ඔබ මට පෙම් කලත්
එක්වීම සිහිනයක්ද ?
අප හට ........

පාසැල් දිවියේ මතක ගිනි සිළු
නොනැගේද හද මාගේ
පොත් පතට තුරුළුවී
ඔබ මා පෙම් කල කාලය
අනාගතයේ දී සිහිනයක් වීද ?
එනමුදු සඳවතිය ඔබය

මාගේ ජීවය මා මියෙන තුරා
සිව් වසරක ප්‍රේමය
සදා නොවේද අද
ඔබට මා ආදරෙයි ........

සෙ/279279
සංසෙ රණසිංහ ආර්එම්ආර්එස්එම්
මූලස්ථාන බළසෙණය
4 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා
සංඥාබලකාය
නාසිවිලාන්
පලාලි
යාපනය

# අහිමි ඔබ

ගංදෑල නිසසල කවිකාර දෙනුවනට
ආදරය සුව ගෙනෙන
සිහින නෙළුමක් සොදුර ඔබ මට

හිරු මඩල මලානික සැන්දෑව විහඟුණට
සුවදුනිද මඳ පවන
සියම් සුව කොයිද - ඔබේ රුව නොදුටු කල

අකුරු කල පද වැලක-තනුව ගෙනවයනකල
මිහිර දැනුනද සවන
තුටු නොවෙයි ඔබෙ හස නොහස

තුරු උයන මැද ලගින විහඟුනේ පෙම්කරන
තනි කමට ලංවෙන්න
ඇයිද අපහට අහිමි බව

සෙ/151103
ආසෙ ගුණවර්ධන ඩීපීඩීඑස්
මූලික සංඥා පාඨමාලාව අංක 02
4 වන සංඥා රෙජිමේන්තුව
යුද හමුදා කඳවුර
පලාලි හාසිවිලාන්
යාපනය.

# ආදර මගෙ පියා

අව්ව වැස්ස දෙක නොබලා මා ඇඩි කල | පියා
කන්න අඳින්නට දීලා දුක සැප බැලූ | පියා
ලෙඩ දුක වුනු හැම මොහොතෙම මගෙ ලග උන් | පියා
කඳ සූරිදුන් හට භාරයි මගෙ ආදර | පියා

මගෙ නුවණැස පාදන්නට වෙහෙස දැරුව | පියා
පත පොත මට ගෙනත් දීල පාසැල් යැවූ | පියා
යහමග යන්නට මා හට අවවාදන් දුන් | පියා
මතු භවයෙත් වේවා ඔබ මගෙ ආදර | පියා



සෙ/276209
ලා/කෝ අනගිරත්න කේපී
5 ශ්‍රීලංසංබ
යුද හමුදා කඳවුර
නාවල්අඩි - වාලච්චේන

# අහිමි ආදරය

මට අහිමි ඔබේ සුවඳ
සිත අද්දර කවියක්ව
ඇස් මහිමයෙන් සරදමක්ව
සැඟවී හද තුලින්
මම නිබද ඔබ

චපල ආදරයකින්
ලබන තාවකාලික සතුටට වඩා
අවංක සෙනෙහස පුදා
ලබන වේදනාව උතුම්ය

සෙ/වීවීඑල්ඩී1578 ආසෙ වරාපිටිය ඩීඑම්ඩබ්ඩබ්
2වන සංඥා බළකාය
යුද හමුදා ජනපදය
පනාගොඩ - හෝමාගම





# අහිමි සෙනෙහස

දම්පැහැ කහට කප්‍ර පුහුලම් පිපි | කාලේ
රංචුව ගැහුනු හැටි මතකද අපි | බාලේ
මල්වර වියේ නුඹ ඉඳහිට දුටු | වේලේ
බැරි උනි කියා ගන්නට හිත බැඳි | ආලේ

සුදපාට මල් පිපුණු
අරලියා සෙවන යට
බාලිකාවේ සුවඳ තනි වෙලා
අපි ඉතින් වෙන්ව යමු
අපි අතින් ගිලිහි ගිය
සියළු දේ අතීතෙට පවරලා

සියොත් කැල ගී ගයන
අෑත වැව් තල කොනැක
තනිව හිඳිනා ඇයට
කෙලෙස මා කියන්නද
මගේ මේ ආදරය

සබඳ නුඹ ලිහිනියෙකි
රැයේ අදුරට හඩන
මමද ලිහිනියකු වෙමි
කැඩුනු තටු පිරිමදින
අතීතය සිහිනයකි
යලිත් සිත නොරිදවන

සෙ/279446
සංසෙ බංඩාර ජේඑම්ජේසී



# අම්මාට

එක තුස උපන් දරු කැලක්සේ
එකට එක්වී
මව් හුවිය තුල
ඉන්නා විට අප
සාමයේ හඩ නැගෙන තුරා
කෙසේ ඉන්නද අම්මෙ
මේ කටුක ජීවිතය දරාගෙන
එන්නම් අම්මෙ මා දිනක
සාමය උදාකර මේ මව් බිමට

සෙ/154618 සංසෙ ක්‍රිස්ටි ඩබ්පී

# දියාබර විරුවාණෙනි

අවි අත දරා පොරණේ විරුවන්
රට රැක්කා සේ
එක්වෙමු විරුවනි ජාතියේ නාමයෙන්
රට දැය රකින්නට
රට දැය වෙනුවෙන් හෙලවූ ලේ බිඳු
එකට එක්වී ලක් පුතුනි
ජාතියේ නාමයෙන් රට රකින්නට
එක්වෙමු විරුවනේ.....

සෙ/154639 සංසෙ දීපාල එච්ආර්

# ඔබ නැති ජීවිතය

නෙත නිදි එන රාත්‍රියේ
සිහින ගෙන එනු දෙවියනේ
සිහින අතරේ ඔබ පෙනෙනතුරු
එළිය නොදෙනු මැන
හිරු කුමරුනේ

සිහිනයෙන් හෝ නොපෙනුනොත්
දුකයි මගේ කුමරියේ
ඔබ නොදැක බෑ මට
මමත් එමි ඔබේ
ලෝකය තිබෙන තැනට
හෙට දිනේ.....

සෙ/154612 සංසෙ කුමාර එල්ඩීඑන්
සංඥා මූලික වැඩපළ
පනාගොඩ - හෝමාගම



හීනියට හද එබෙන රැයක
පුංචි පුංචි පිනි බිඳු වැටී
ගත හිත සනසන රැයක
වලාවක පාවී
තරුමල් අතරින්
නුඹව මැවී පෙනේවි

සෙ/154647
සංසෙ ගුණවර්ධන ජේඑස්

# පෙම්වතියට හමු නොවූ

මුර කුටියේ තනිවීලා සිටින විට
මගෙ හද සැලෙනවා නුඹ නැති නිසා ලග
මට උරුම හැමදාමත් තනිකමද
බින්දුවක්වත් නුඹේ සිත තෙරපෙන්නේ නැද්ද

සුලග හමාවීත් හදවතේ වැදෙන විට
තනිකම දැනෙනවා රත්තරං තාම
පෑන් තුඩින් මගෙ දුක් කවි කරලා ලියන විට
කදුලු සැලෙනවා නෙතැගින් නොදැනීම

ඇස් පියවෙන්නේ නෑ නුඹ සොයනවා නිතර
හදවත පෑරෙනව නිතරම නුඹ නැති නිසා ලග
සිතට සතුට නෑ දුක උරුමයි තාම
මට විතරක් නුඹේ සෙනෙහස අහිමියිද

මගේ නෙතින් ගලන කදුලු නිවන්නට
කවදාද එන්නේ කියලා මට කියනවද
මගෙ දුකට හැමදාමත් සතුටක් වෙන්න
ලගදීම ඇවිත් නවතින්නට නුඹ එනවාද.......

සෙ/154611 සංසෙ නිශාන්ත ඩීඑන්

# මහල්ලා හා තරුණිය

ආදරය සුන්දරයි
සොඳුරිය,
මා ඔබට වෛර නොකරමි
ඔබේ ජීවිතය පසෙක තබා
ඔබ මා යුධ බිමේ
ආරක්ෂා කල හැටි
කිසිදා අමතක නොකරමි
ඔබගේ එඩිතර හැඟීම්
මා නිතර අවදියෙන් තැබුවෙමි.
එත් ........
දැන් මම මහළුය
වෙනදා වගේ මට ඔබ සමග රඟන්නට බැරිය
දසක දෙකකට අධික කාලයක්
අප දෙදෙනා අතර අමනාපයක් නොතිබුණි.
මම ඔබද, ඔබ මමද
හැර නොගියෙමි
නමුත් ........
මම අද ඔබෙන් සමුගත්තෙමි
ඒ මගේ දෛවයයි .......

සෙ/65983
බහි 1 කේ.ඒ. වික්‍රමරත්න
සංඥා අංශය
53 සේනාංකය
කොඩිකාමම්

## ක්ෂණිකයි ස්ථිරයි අපගේ නාමය

යුද හමුදාවේ සේවා බළකා රැසකි
සංඥා බළකාය ඉන් එකකි
ජූනි මාසයේ 5 වෙනිදා දිනකි
අපේ අම්මාට අවුරුදු 14 කි

රණ විරුවන් සංඥා බළකායේ
ඔබ සැම සිහි කරමි වජ් මස 19 දිනයේ
රටට දැයට ඔබ කල මෙහෙයුම් පායේ
තුති මල් පුදන්නෙමු ඔබ සැම් වෙත ආයේ

නැන ගුණ වීර ගතියෙන් අප බලවත්ය
පෑනෙන් පොතෙන් කරනා වැඩ බලවත්ය
අහස් තරංගයෙන් වැඩ අපමනය
පොදු සේවයට අප කවදත් හිතවත්ය

අප යන ගමන සරු සාරය බලවත්ය
සෙබල කැලෙන් වන සේවය අපමණය
බාධක මැදින් අප යන දුර දුෂ්කරය
ක්ෂණිකයි ස්ථිරයි අප ධජයේ නමය

සෙ/ 277060
ලා/කෝ නීල් පෙරේරා ආර්ඩබ්න්
මූලස්ථාන බළකණය
4 වන සංඥා රෙජිමේන්තුව
පලාලි, වාසවිලාන් යාපනය.

සෙබළ තෙළිතුඩ

## කඳවුරේ සිට අම්මාට කවිමල්

තල්වැට උඩින් පායන විට සඳ කලට
මැවී මැවී පෙනේ ඔය පින් බර මුහුණ මට
ඔබ ගුණ කඳ සිහිව මේ කවි මල් ලියන විට
දෙනෙතින් මගේ වැගිරෙයි උණු කඳුළු කැට

අම්මා කියන ඔය ලස්සන අකුරු තුන
මට සැනසුමකි සැමදාමත් සුවය දෙන
දුක්විඳ හැදූ මගේ මවුගේ මහඟු ගුණ
සිහිපත් කරමි කවි සිතුවිලි සිතට ගෙන

රට ජාතිය සාමය නිදහසම පතා
යුද සේවයට ගියේ ඔබගේ පොඩිම පුතා
දුක් නොම වන්න අම්මේ මා ගැනම සිතා
පසු බට වන්නේ නැහැ කවදත් ඔබගේ පුතා

නිදහස රකින්නට මීස මව් රටෙහි දැයේ
පුතුන් තිදෙනෙක්ම ඔබෙ යුද පෙරට ගියේ
විහාර මහා දේවිය මින් පෙර යුගයේ
ඒ වගෙ තමයි අම්මේ ඔබ මේ භවයේ

යුද ගිනි දැල් රටෙන් සුන්වී යන්න සිතා
පර සතුරන් රටෙන් සුන්වී යන්න සිතා
අවියක් අරන් පුතු ගියෙ සාමයම පුතා
ලක්බිම ජය අරන් එනවා ඔබගේ පුතා

වැඩි ඈතක නොවේ සාමය ලබන දින
අම්මේ ඔබේ පුතුන් හට ආසිරි පතනු මැන
සෙබලෙකු වන්න ඔබෙ ලේ කිරි පොවපු දින
මතු බුදු වන්න ඇති ඔබ ඒ කරපු පින

මව්බිම රකින්නට දරුවන් බිහි කරලා
සතුරන් නසන්නට යුද බිම වෙත යවලා
අම්මේ තාත්තේ මගේ නෙත් දෙක ඔබලා
අභිමානයෙන් සිහි කරනෙමි හිස නමලා

සෙ/276798
ලා/කෝ දිසානායක කේවීඑස්කේ
4 වන ශ්‍රී ලංකා සංඥා බලකාය
වාසවිලාන්
පලාලි, යාපනය





## ගංගාවක සිහිනය

සෙබළ තෙළිතුඩ

ජීවිතය සුන්දර ගංගාවක්
ඒ ගඟේ තාලෙට පාවෙන ඔරුව ජීවිතයයි
ජයග්‍රහණයේ නොවුපල ඇත
මෑත පෙනෙනමුත්
විශාල කම්කටොලු ගල්මුල් දුක් ගැහැට
හමුනොවුනා බව පියනගමු
සියලු දෑ පසෙක කොට ගෙන
අතීත අභිමානයෙන් ධෛර්යයෙන්
ශක්තිය කැටිකොට ගෙන
සත්‍ය ජීවන රටාවට මුහුණ දෙමි...

එය එසේ වුවද දෛවය
අපට සරදම් කරනු ඇත
අප දෛවයට සරදම් කර
ජයග්‍රහණය - ස්ථාවරත්වය පිරි
මුලිනුපුටා දැමිය නොහැකි රුක්ෂයක් ලෙස
අභිනව සත්‍යයට මුහුණ දෙමු
එවිට ස්ථාවරත්වය - ජයග්‍රහණය
අප පසුකර දමා .....
දිව යනු ඇත ..... //

සෙ/2ශ්‍රී00436 සංසෙ පියරත්න ආර්පීඑස්ව
2වන සංඥා බළකාය
යුද හමුදා ජනපදය
පනාගොඩ - හෝමාගම



## වටිනාකම ඔබේය

සඳු රාත්‍රියට ගනඳුර මැකුවත්
සඳුගේ අඳුර මකන්නේද හිරුය
අහස පුරා විසිරී ගිය තරු
සිනා සෙන්නේද.....
හිරු නිසාය
හිරු නැතිනම් සඳුගෙන්ද
පලක් නැත
දයාබරියේ.....
ඔබනැති දාකදී... මාද
හිරු නැති සඳු සේය
එල්ලයක්
නොදුටු ජීවිතයකි
මගේ හිත ගත්
හිතවතියේ.

සෙ/154642 සංසෙ බණ්ඩාර ඩීපීවීවස්

## මගේ පුංචි නැගණිය



දැහැන් ගතව නුඹේ හසුනට
සිහිකරනෙමි නුඹේ මතක
නුඹ හැර අන් කිසිවකු නැත

## මගෙන් දුරස් වී නොයන්න

සුන්දර මල් කැකුලක් වී
අතු අග ඉඳ සුපිපෙන්න
පෙම්බර සිතුවිල්ලක් වී
මගෙ හදවත් සනසන්න
සීතල දිය දෝතක් වී
මගෙ පවස නිවාලන්න
සුන්දර සිහිනයක් ලෙසින්
සදා මතකයේ රැඳෙන්න
සිරි සිරි පොද වැස්සක් වී
හෙමි හෙමිහිට ගලා යන්න
කඳුලක් නෙතු අග රඳවා
මගෙන් දුරස් වී නොයන්න

සෙ/154633 සංසෙ අතපත්තු

# සාමය

සාමය නමැති රන් මාලය පලඳින්න
ගිනි අවි වලින් අපි සැමදෙන දෙන්න
සාමය උදාවී කාගෙත් සිත් පැහැදෙන්න
සිරිලක් මව්නි අපටත් සාමයදෙන්න

සිංහළ දෙමළ මුස්ලිම් බේදය ඇති කරලා
සාමයේ පරවියා අප වෙත ලං කරලා
යුද්දෙට ගිය අපි අද නිහඩ වෙලා
සැමට මල් පුදමී අපි එක්වීලා

ගිනි අවි පෙලට අපි දැන් සමු දෙනවා
සාමයේ පහන් වැට ලඟ ලඟ දැල්වෙනවා
මව් පිය දෙදෙනාගේ සිත් සතුටින් වැජඹෙනවා
සාමයේ මල් පිපී අපි කවුරුත් සැනසෙනවා

සෙ/279047 සංසෙ ද සිල්වා ඊපීඑ්පී
5 ශ්‍රීලංසංබ
සී කණ්ඩායම

# තනිවූ සිතුවිලි

| | |
|---|---|
| හද තුල මගේ ඇතිවී තිබි | කැවීමක් |
| හින්දා කලා පෙර බව ගැන | තැකීමක් |
| උල්පත් වගේ ආලය වී | ඉහිමක් |
| මෙබවෙන් එලෙස කිතියෙන් වෙයි | දැනීමක් |
| | |
| උයනක තිබෙන සුවදැති මල් | කැවීමක් |
| වාගේ තමයි පෙම්බර බස් | දෙඩීමත් |
| හිමිනැති කමට ඇතිවෙයි දුක් | ඇඩීමක් |
| කොතරම් එයට ගරහයි ගල් | ගැසීමක් |
| | |
| හද වියලිලා ආදර දිය බිදු | නැතුව |
| මා තනිවෙලා හිස් පැතුමක් | ඇතුව |
| සිහිනෙන් උවත් මා ආශාවෙන් | පැතුව |
| මා වෙත එන්නෙ කවැරුද දෙහිතක් | නැතුව |

සෙ/279072 සංසෙ දුමින්ත කේවම්වඩු
5 ශ්‍රීලංසංබ
සී කණ්ඩායම



# පොසොන් උදාව

| | |
|---|---|
| දහසක් පැතුම් ඉටුවන පින්බර | දිනක |
| සොඳුරිය ඔබව සිහිවෙනවා නිතර | මට |
| සාමය සතුට ඇති කොරුමට තිබේ | මට |
| ඒ ගැන සිතා යනු මැන බුදු හිමි | ලඟට |
| | |
| පොසොන් සිසිල හැම හද තුළ | ඇතිවේවා |
| එපින් බලෙන් හැමගෙම දුක්දුරු | වේවා |
| සඳහම් එළිය සිරිලක තුල | වැජඹේවා |
| මගෙ සොඳුරටත් මා නැති දුක | නොදැනේවා |
| | |
| බුදු හිමි ලඟට යමු පෝයට අපි | දෙන්නා |
| කියලා ලියපු ලියමන අද දින | ලැබුනා |
| දෙපලක ඉදන් හිටියත් සෙනෙහස | පෙන්නා |
| කෙලෙසක වඳින්නද බුදුහිමි අපි | දෙන්නා |

සෙ/277833
සංසෙ රණතුංග බංඩා ඩීබී
6 ශ්‍රීලංසංබ (ආ/බ)
පල්ලේපායි - යාපනය

# දේශ ප්‍රේමියකු සමග

දේශයේ ඒකීය භාවය සුරකින්නට
ගිණි අවි අත දරා
සිටින සෙබළ සොයුරන්ගේ
දෑත් වලට පෑන් තුඩක්
කොපමණ හුරුද කියලා තේරෙන්නේ
දේශප්‍රේමියෙකු විශේෂාංගයට ඔවුන්ගෙන්
ලැබෙන ලිපි ටික දැක්කාම...... ඉතාම
ආකර්ෂණීය ආකාරයට වචන පෙල හැඩ ගස්වා
එවා තිබුණු එවන් ලිපියක් මගේ අතට
පසුගිය දිනක ලැබුනා......

සෙ/277445 සංසෙ කුමාරසිංහ
5 ශ්‍රීලංසංබ
සී කණ්ඩායම

| | |
|---|---|
| කටත් බඩත් පුරවා අල සෙවන | සිට |
| සිතත් ගතත් යොදවා හෙළයෙකු | ලෙසට |
| රටත් දැයත් වෙනුවෙන් සේවයක් | කොට |
| මලත් සමක් නැහැ සෙබළෙකු | ලෙසට |
| | |
| විරුවකු ලෙසින් ආවොත් මා යුධ | බිමට |
| සිතුවේ කිමද ඔබ රට රැක ගන්න | කියා |
| රෑ කළු යාමේ යුද අවි අපි අතරේ | රැඳිලා |
| රට රැක ගිහිමු එක මවකගෙ සෙබළු | කියා |

සෙ/279069 සංසෙ රූපසිංහ ඒපීපී
5 ශ්‍රීලංසංබ
සී කණ්ඩායම









# සදා ඔයාව

ඔබ වන් කෙනෙක් මට ලැබුනේ
කෙසේදැයි මම සිතමි.

බොහෝ දේ අහිමිවී ගිය - නොලැබී ගිය
මේ ජීවිතයේ මටම ඔබ ලැබුනේ
ප්‍රාතිහාර්යයකින් වන්නට ඇත.....

නොවේ නම් මා පූර්ව ආත්මයක
පුංචි පිනක් නොව මහා පින්කමක්
කරන්නට ඇත.....
පින්කල අනුහසින් දෙවියන් දුන්
තිලිණයක් ලෙස මට ඔබව ලැබෙන්නට ඇත.....

අන්ත වූ වියෝගයෙන් පිරි මේ සංසාර චාරිකාවේ
මහෝගයක් සේ මා ලද ඔබ
අහිමි වී යතැයි මේ දැන් පවා
මට බිය සිතෙයි.....

මේ ආත්මයේ මට ලබාගත යුතු දෙයක් ඇත්නම්
ඒ ඔබ පමණි

ඔබ ලබා ගැනීමට මට කලහැකි දෙයක් වේද
සියලු බාධක මැඩගෙන මම එය කරමි.....
ඔබවන් කෙනෙක් මගේ ජීවිතයේ
කුඩා වපසරිය මත තබා ගන්නට
මා කලයුතු පින්කඳ බොහෝය
ඒ නිසා මම එය කරමි.....

ඒ පින් බලයෙන්වත්
මට ඔබ අහිමි නොවේවා
ඔබ මටම ලැබේවා
ඔබ මගේම වේවා.....

සෙ/278977 සංසෙ කුමාර ආර්පීඑන්වල්
සංඥා සම්බන්ධතා බලඝණය
1 ශ්‍රීලංසංබ

# දයාබර චතු

ඇතිමුත් ලස්සනදේ
ලොවේ සැම තැන
ඒ සියලු දේටත් වඩා
නුඹ සුන්දර යැයි
සිතුනා සඳ සාවියේ මට.....
නුඹ නෙත ගැටුනුදා සිට
බිඳෙන් බිඳ
නිසන්සල විය
විඩාබර වූ මගේ සිත.....
මගේ දිවියට
අලුත් අරුතක්
කියා දුන් නුඹ
බලාපොරොත්තු දහසක්
ඇතිකරන්නට විය
මගේ සිත තුල.....
සඳුගේ එළියෙන්
පිපි දිදුලන
පිච්චුරු කුමුදු මලක් වන්
සිහිනෙන් පවා නුඹේ රුවට
පෙම්කරන්නට විය
මගේ සිත
බලාපොරොත්තු පොදි බැඳ
සිටියා මගේ සිත
පායන තුරු නුඹ මගේ දිවියේ
සිමඳ සඳ සාවියේ
නපුරු උනේ නුඹ
අමාවක සඳක් වන්නට
මගේ දිවියේ.....

සෙ/279203
සංසෙ සරත් බණ්ඩාර පීආර්
සංඥා සම්බන්ධතා බලඝණය
1 ශ්‍රීලංසංබ

# නිවාඩුව

| | |
|---|---|
| දිනගෙවී සති ගෙවී එළඹේ | නිවාඩුව |
| අයදුම්කර බලා සිටින්නේ ලැබෙනතුරු | නිවාඩුව |
| ගෙදර ගියවිට ඉක්මනින් ගෙවී යයි ලැබූ | නිවාඩුව |
| නිමා වී කඳවුරට යලි පැමිණි | නිවාඩුව |
| කවදාද යලි එන්නෙ මගේ ප්‍රිය | නිවාඩුව |

සෙ/275606 කෝප්‍රල් නිහාල් ශාන්ත එන්ඒ

සෙබළ තෙළිතුඩ

# මගේ මිතුරු ගිණි අවිය

හිටියත් තල් අරණේ පාළුවේ හුද කලාවේ
මගෙ තනි නොතනියට හිටියේ ගිණි අවියමවේ
මා තනිකර දමා කිසිම දිනක වෙන්ව නෙවේ
ඔබයි මගේ ලඟින්ම ඉන්නා මිතුර වේ

තනි නොතනියට හිටියේ ගිණි අවිය තමයි
ජීවිත රැක දුන්නෙත් මේ අවිය තමයි
දුක සැප දෙකට ලඟ හිටියෙත් ඔබම තමයි
යුද පිටියේදී දිවි බේරා දුන්නේද ඔබයි

සෙ/278214
සංසෙ දයාරත්න ජීජීඅයිඑස්
6 ශ්‍රීලංසංබ (ආ/බ)
පල්ලේපායි - යාපනය

# පෙම්වතියට

පිච්ච පෙති මත පින්න තවරා
පොකුරු කරු කැට සිනාසෙන සඳ
නින්ද ලග නැති පාළු මහ රෑ
සිහින් ඔය රන් දෙතොල් සිඹිමි

සෙ/277702
ල/කෝ ලලිත් එච්ඩීජී
6 ශ්‍රීලංසංබ (ආ/බ)
පල්ලේපායි - යාපනය

# සෙබළ සිතුවිලි

දුප්පත් කමට හමුදාවට බැදුනාට
ගිණි අවියක් මේ සුරතට ගත්තාට
කාකි ඇදුමකින් මුළු ගත වැසුනාට
හදවත උණුවෙයි නංගියෙ සෙබළාට

කඳු ගැට තුළින් සුදු සඳ රැස් ගලන විට
සීතල සුළං ඇවිදින් ගත වෙලන විට
හැඟී නොයයි රස හැඟුමන් පපුව යට
වෙන අය මොටද මගෙ රංකඳනැතුව මට

සෙ/277834
සංසෙ කරුණාදාස කේඑම්
6 ශ්‍රීලංසංබ (ආ/බ)
සී කණ්ඩායම
පල්ලේපායි - යාපනය

රට දැය වෙනුවෙන්
# දිවි පිදූ
රණවිරුවකු හට

රට දැය වෙනුවෙන් දිවි පිදූ වීර සෙබළුනේ සෙබළියනේ
අතුරුදන් වූ තුවාල ලැබූ සියළු සෙබලුනේ, සෙබළියනේ
මුතු පලසක් වැනි සුන්දර ලංකා දීපය
ආරක්‍ෂා කිරීමට තම ජීවිත පූජා කල
සියලු සෙබළුනේ, සෙබළියනේ
ඔබ රටදැය වෙනුවෙන් කල ඒ උදාර සේවය
සැම දිනකම සැම මොහොතේදීමඅප සිහිපත් කරන්නෙමු
ගතින් නැතිවුනත් සිතින් ඔබ ලග සිටිමි
ඔබ යලිත් උපන්නොත් අප අතර යලි ඉපදේවි
ඔබ සැමට නිවන් සුව අත්වේවා

සෙ/277667 ලා/කෝ බැසිල් බීඑන්කේ
6 ශ්‍රීලංසංබ (ආ/බ)
සී කණ්ඩායම
පල්ලේපායි - යාපනය

# අවිහිංසක අම්මා

මා කලකින් නිවසට පැමිණෙන විටදී
අවිහිංසක නිල් නුවන් අගට කඳුලැල් මතුවුවත්
සදාකාලිකව මගේ ජීවිතය නුඹ නමිනි අම්මේ
නුඹගේ නිකැලැල් අවිහිංසක සෙනෙහස අභිමුව
මා දඟකාර කිරිදරුවෙක් අම්මේ.....
උණුසුම් වූ ඔබේ ලමැද මත තුරුලුවෙන්න ආසයි අම්මේ
ගෙවුනු ඒ සොදුරු සමයේ සෙනේහය ඔබ ලග තබා
කදුළු බින්දු හිතනුනාට යලිත් දෙමසකිනි ඔබේ ලොවට
ඉක්මනින් පැමිණෙන්නම් සතුට රැගෙන අම්මේ.....

සෙ/279396 සංසෙ පතිරණ පීපීයේ
6 ශ්‍රීලංසංබ (ආ/බ)
බී කණ්ඩායම
524 බසේමු
ජේදුරුතුඩුව - යාපනය





# කැප්පල්ල

දක්‍ෂයා යටකර - බැරි එකා උඩට එන
දිය යටින් ගින්දර දෙමින් - එකිනෙකා කොටවන
ඇතිකර නැති අවුල් - අටවමින් මර උගුල්
සැමට වින කරන - මේ ලොවේ සෙල්ලමයි
බෙල්ල කැපිල්ල..........

සෙ/275717 ලා/කෝ පුෂ්පකුමාර ඩීඊඑස්
5 ශ්‍රීලංසංබ
සී කණ්ඩායම

දේශයේ
# වීර සොයුරනේ

රුදුරු ගිණි අවි අත දරා
තල්වැට මායිමේ යුද වදින
සොයුරනේ
අවිවැසි නොතකමින්
දිවා රෑ නිදි නොලැබ
ලක්දෙරණ රැකීමට
සතුරන් හා යුද වැදී
හද බැදී භක්තියෙන්

දිරිය සොයුරන් ලෙසින්
ජයලැබ එන ලෙසින්
සතුරු බල පරදමින්
යුද වදී ලක් මව නමින්
දිරිය ශක්තිය පතන්නම්
මා සැම රජා විරුවකු නමින්

සෙ/278760
සංසෙ දිසානායක ඩීජී
5 ශ්‍රීලංසංබ
සී කණ්ඩායම

සෙබළ තෙළිතුඩ



# හෙට දවස

හිරු නැගෙන මේ හෝරාවේ
සඳ බසිනා මේ සැන්දෑවේ
කාත් කවුරුත් නැති
මේ පාළු වැලිකතරේ
ඉමක් කොනක් නොමැතිව
බලා ඉදිමි මා.....
දයාබර සිතුවිලි ආවෙමි
මේ තනිකමට....
සිහිවෙනවා නොයෙකුත් දෑ.....
මේ පුංචි මොළ කැටියට
එනමුත් මා හට බිය තිබුනත්
එඩිතර සිහින් සිතමි
මාගෙ දවස.....

සෙ/278997
සංසෙ දිසානායක ඩීඑම්එන්
5 ශ්‍රීලංසංබ සී කණ්ඩායම

# සිතුවිල්ල

යෞවනයේ මල් වසන්තයේ
නිමල පිච්තුරු කුසුම විසිකර
කම් කටොලු අතරේ කුමරු වී
අගාතේ කුණු ගොඩක් වී.....
ඇයිද.... සොයුරනි කඳුලු බොන්නේ....
විනාශයේ දොරටු ළයේ....
පමාවී හෝ දුකට
එන්න තව කම්පා නොවී
දැක ඇත්නම්.... සිත තිබේනම්....

සෙ/278997
සංසෙ දිසානායක පීඑම්එන්
5 ශ්‍රීලංසංබ
සී කණ්ඩායම

# සාමයේ මල් පිබිදේවා

රණ බිම මත්තේ
මිය දුන විරුවනි
නුඹ දිවි පිදුවේ
මව් බිම වෙනුවෙනී.....

මව් බිම රැකගෙන
අපගේ නිදහස වෙනුවෙන්
සටනට වැදී
ඔබ කල උදාර මෙහෙවර
සැමදා අප හද තුල
රැව් දෙන්නේය.....

විරුවනි ඔබගේ සවියෙන්
මව් බිම තුල
සාමයේ මල්
තව තවත් පිබිදේවා.....

සෙ/278992 සංසෙ අනුර බංඩාර ඒඑම් 5 ශ්‍රීලංසංබ

# ජීවිතයක මතක සටහන්

ජීවිතය යනු බලාපොරොත්තු රැසකි
ඒවා බිඳ වැටෙන්න බිඳ වැටෙන්න
ජීවිතය විනිවිද පෙනෙන කැඩපතක් බඳුයි
සැම සිදුවීමක්ම සිදු වෙන්නේ
කොක් තවලා සිනාසීමටවත් ඉකි බිඳ තවා
වැලපීමටවත් නොවේ.
එයින් අත් දකිම් ලැබීමටයි
ඔබෙ හෙට දිනයට ආසිරි පතමි
ජීවිතයේ ඔබ ගෙවා ඇත්තේ ඉතා
කෙටි කාලයක්
තව දිගු කාලයක් ඔබට යාමට ඇති බැවින්
ඉවසීමෙන් ලැබෙන තමෙ වෙලේම යමක්
ඉගෙන ගැනීමට උත්සාහ කරන්න

සෙ/279004
සංසෙ පියසේන විපී
5 ශ්‍රීලංසංබ
සී කණ්ඩායම

සෙබළ තෙළිතුඩ

# සෙනෙහසෙ පැතුම්

සෙනෙහස අකුරු කර අමුණා එකින් එක
උණුසුම් සුවඳ තවරා පොඩි පිටු අතර
මා වෙත එවා සනසා මගෙ සිත් කමල
සිටි නුඹ කිමද මා අමතක කර මෙලෙස

බලා හිඳිමි නුඹේ ලිපියක් ලැබෙන තුරු
දිනක් දෙකක් නොව සති දෙක තුනක් වෙලා
නුඹ වෙනුවෙන් රළු ගිණි අවි අතට දරා
සෙබලෙක් වූ නිසාදෝ මා අමතක වෙලා

නුඹමයි සඳ කිරණ මා එළිය කොරූ
නුඹමයි මඳ පවන මා සිසිල් කොරූ
අමතක වුවත් නුඹ හට ඔහුගේ පෙම් තතු
නුඹමයි මගේ පෙම්වතිය මගේ දිවි තිබෙන තුරු

සෙ/වීඑෆ්ඩී1607 ආසෙ මාර්ෂෝ ටීජේ
2වන සංඥා බළකාය
යුද හමුදා ජනපදය
පනාගොඩ - හෝමාගම

# අහිමි පෙම

තල්වැට අද්දර කටුක ජීවිතය ගෙවන අතරතුර
නිල්වන් මැණික් සේ දිදුලන
රන් රුවන් දෙනෙත් මැවී පෙනේ
අපේ මේ ජීවිතය අතේ තියාගෙන
ඉන් නා විට අප බංකරය තුළ සඳවන් මුව මඩල
නෙතට ගැටී මට - සීතලට ගැහී ගැහී
වෙව්ලන රාත්‍රියේ -
එන්න සිතයි මට ඔබව සොයා
ඔබට තුරුලුවී ගුලිවී නිදා ගන්න
නමුත් නුඹ අහිමි බව දැනුනේ මට පසුවය
මක්කරන්නද මා අහිමි හදකට පෙම් කලාම
දඬුවම් විඳිමි මම අද එදා කල ඒ පෙමට.....

සෙ/276070 කෝප්‍රල් කරුණාපාල ඩීකෙ
5 ශ්‍රීලංසංබ
බී කණ්ඩායම

# සෙබළ බිරිඳට



හමුවනු අයුරු මතකයි හිමිදිරියේ
දකිනෙමි ඔබව සැමදින මා සිතන රැයේ
දුරස් වෙලා සිටියත් අප තනියේ
ඔබ මට වාසනාවයි මගෙ කුමාරියේ

පිණිකැට වෙලා මල් පෙත්තක තනිවෙන්න
හිමිදිරි උදයේ පිණි කැට මත ඇවිදින්න
රෝස කපුරු මල් වල සුවඳ විඳ ගන්න
ආසයි ළඟදී ඇවිදින් දැක ගන්න

වෙසක් පොසොන් සහ නත්තල් ඇත සද්ද
සෙබළාට උරුම නැත සිංහළ අවුරුද්ද
මගේ පෙම්බරිය ඔබ මගෙ හද බැන්ද
මතකයි නිවාඩුවේ ගත කල සුව නින්ද

ධනපති මැදුරු නැත අපහට වැජඹෙන්න
සිටු පරපුරක් නැත ආඩම්බර වෙන්න
මගේ කුමරියේ මේ ටික අහගන්න
ලක් මව රැක ගන්න ඔබ මට දිරි දෙන්න

සෙ/275351
ලා/කෝ වසන්ත කුමාර ඩීඒ
සී බණ්ඩායම
5 ශ්‍රීලංසංබ

# පියකුගේ ගීතය



සිනා තෙපුල් කෙලි කවට කමින් තව
තවත් පෙමින් තුරුලට ලංවී
මගේ කොපුල් කිරි දතින් රිදුම් දුන්
කුළුණු මතක ඇත ඔත්පල වී

රණ්ඩු කරමින් හැඩූ හඩ නින්නාද වී
දෙසවනද පාරයි
බිත්ති සායම් වසාගත් බල් රූ දකින්නට
නුවන් වෙහෙසෙයි

උපන් ගෙයි තැණි මඩල දුබලයි
පුංචි දරූ පැටවුනි මගේ
නුඹලාගේ දරූවන්ද සමගින්
වරෙල්ලා මතකය දිගේ.....

සෙ/279446 සංසෙ කුමාර ඩබ්කේආර්





# ලෝකයෙ මිම්මක් නැති මාතාව අම්මා



විහාර මහදේවිය ඔබමයි අම්මේ
දහසක් පැතුම් මා හට ගෙන දුන් අම්මේ
ඔබෙ ලේ කිරි වලට මා ණය ගැති අම්මේ
මතු බුදුවන්න පෙරුමන් පුරනෙමි අම්මේ

දසමාසයක් මා කුස තුල තබාගෙන
ලේ කිරි කරලා පොවලා මා හදාගෙන
අම්මා කියන නම සිහිකර නැමීගෙන
අම්මට වදිමි මා බිම දණ ගසාගෙන

වීර පුතුන් බිහි කල ආදර අම්මා
මට ඇති එකම වස්තුව ආදර අම්මා
මව් කිරි වල ගුණය ලොවටම දුන් අම්මා
ලෝකයේ එකම සම්පත මිම්මක් නැති අම්මා

සෙ/275934
කෝප්‍රල් විජේරත්න අයිඩී
5 ශ්‍රීලංසංබ
බී කණ්ඩායම
121 අනු බන්ඩය

සෙබළ තෙළිතුඩ

# ආදරයේ පැතුම්



හදවතින් ඔබ හදට
ලංවෙන්න සැමදා
සසර සරනා තුරා
ඉන්න ලංවී.....

ලොවම ඉඩ දුන්නා
පුදුමයි.....
හිමියෙන් අපි හමුවන්න
සිත්තුලින් අප පැන
පැතුම් ඉටුවේද ලගදී

සෙ/වීඑෆ්ඩී1596
ආසෙ සේනාධීර එස්ඩී
2වන සංඥා බළකාය
යුද හමුදා ජනපදය
පනාගොඩ - හෝමාගම



# සෙබළ හදවතේ බිරිඳ

තනිකමට උරුම කවි කියයි
උනුසුමට හැගුම් බරයි
දරා ගැනුමට උත්සුකයි
දෙනෙත් විඩා බරයි
කඳුලට ආදරෙයි

තාරුණ්‍යයේ ඉහල යොවුන් සිතුවිලි අග ආදරයේ පහස ලබන්නට පාරමී පුරන තරුණ සෙබළ හදවතට සමීප වන්නේ බියට ගුලිවන කුරුළු පැටවකුසේය. ආදරය දිනාගත් දිනේ සිට විවාහයට ඇඟිලි ගනිමින් විවිධ අදහස් හා නිසදැස් කුරුටු ගී පුරාවට ලියා කොළ පුරවන්නේ නොපෙනෙන සෙබළ හදවත සමග හිරව කථා කරයි. දෛවය ගැන අල්ප මාත්‍රයක්වත් සිහින නොමවන ඇය තල්වැට මායිමේ නිදිවර්දිත සෙබළාට මනෝමයෙන් ප්‍රේම කරයි. නිවාඩුවකට ගෙදර විත් ගමට ආ දින සැමට හොරා ඔහු සිප ගන්න දරණ උත්සාය කොතරම්ද නිවාඩු නිමාකර තල්වැට මායිමට යන දිත කඳුළු කථාවෙන් සමු දෙන්න කොපමණ ධෛර්ය වන්නද. විවාහක බලාපොරොත්තු කොපමණ පොදි බැඳීද. විවාහයට කොතරම් ඇඟිලි ගනීද. විවාහය කොතරම් වාමී වුවත් විවාහ දිවිය කෙතරම් සුන්දරද. හැමදාමත් අළුත්ය. විවාහයෙන් පසුව නැවතත් තනිය පාලුව ඇයට මෙන්ම ඝණදුරතල්වැට සෙබළාට උරුමය. සෙබළාට වඩා දරූ සුරතල් බිරිඳ කොතරම් වෙර දරයිද තනිය පාළුව උණුසුම වෙන්වී යනවිට ඔහුගේ සුවඳ දරූ සෙනෙහසින් මතුවේ. කුරිරු යුද්ධයේ ශාපයෙන් තනි වන්නේ බිරිඳය උණුසුම රකින්නේ බිරිඳය. දරූ සෙනෙහස දෛවයේ කුරිරු සරදමට තනි කමට උරුම කවි කියන හුදකලාව මත පතිත වූ දරා ගත නොහැකි දෙනෙත් විඩාබර, සතුට සැගවී ඇති තනි කම් දරූ සෙනෙහසට සීමා කරන බව සෙබළ හදවතේ බිරිඳයි.

සැරයන් පොඩිරත්න අමරසිංහ
2 ශ්‍රීලංසංබ
5 ශ්‍රීලංසංබ සී කණ්ඩායම, මීයන්කුලම

සෙබළ තෙළිතුඩ

# මගේ පියලි ඔබ

පුරා සඳ ලග හැංගිලා
හිනා වෙන තරුවක් බලා
මගේ හිත ලග ලියා දුන්නෙමි
ලස්සනට පද ගලපලා
කදුල කදුලක අමුනලා
වචන දෙකකට පන පොවා
හැඟෙන හිත ඔය හිතේ තැබුවෙමි
පපුතුරේ හිස හංගලා
හමන සුලගට හසුවෙලා
වැටෙන මල්පෙති අහුලලා
ඔබේ සුසුමක සුවද සෙව්වෙමි
ලගට ලංකොට සිඹ බලා
ඇත්තමයි ඔබ සිහිවෙලා
රිදුනු හැටි දුක ඇවිලිලා
දන්නේ නෑ මම කීවෙ නෑ මම
ඔබේ සිත රිදෙයි සිතා
මගේ හිත් අහසට ඒදා
අහම්බෙන් ඔබ පායලා
හිතම පිරිමැද ආදරේවිද
කීව ප්‍රේමය සිහිවෙලා
පතාගෙන ඉන්නෙමි බලා
විශ්වයම ඔබයි කියා
අවදි කර පෙම මගේ සඳ ඔබ
නොයන් වෙන අහසක් සොයා

සෙ/276963
ලා/කෝ සිසිර කුමාර එච්එම්සී
සි කණ්ඩායම

# හෙට දවස

හිරු නැගෙන මේ හෝරාවේ
සඳ බසිනා මේ සැන්දෑවේ
කාත් කවුරුත් නැති
මේ පාළු වැලිකතරේ
ඉමක් කොනක් නොමැතිව
බලා ඉදිමි මා.....

දයාබර සිතුවිලි ආවෙමි
මේ තනිකමට.....
සිහිවෙනවා නොයෙකුත් දෑ.....
මේ පුංචි මොළ කැටියට
එනමුත් මා හට බිය තිබුනත්
එඩිතර සිතින් සිතමි
මා හෙට දවස.....

සෙර/278997 සංසෙ දිසානායක ඩීඑම්එන්
5 ශ්‍රීලංසංබ
සී කණ්ඩායම

# මවගෙ සෙනෙහස

ඔබ මගේ ලෝකයයි
සත්තකයි කියන්නේ
ඔබ මගේ හදවතයි
සත්තකයි සිතන්නේ
ඔබ මගේ ජීවයයි
සත්තකයි දැනෙන්නේ
ඔබ මගේ පිළිඹිමයි
සත්තකයි මවු සෙනෙහස

සෙ/වීවර්ඩී1599 ආසෙ වන්නිආරච්චි ටීඞී
2වන සංඥා බළකාය
යුද හමුදා ජනපදය
පනාගොඩ - හෝමාගම

# ආදර පුතුට



නුඹ ඉපදුනුදා මෙලොවට
මාද යලිඉපදුනා සේ
මට හැගුනා සුදු පුතේ
නුබේ කිරිකැටි සිනාවන් දැක
ලොවම ජයගත්තා සේ
මට දැනුනා මගේ පුතේ
නුඹ අත්පා සලමින්
දඟ කරණා විට
මට සතුටක් දැනුනා චූටි පුතේ
නුඹ බහ තෝරන විට
නුඹ ගෙයි ඈවිදින විට
මා නුඹෙන් දුරස් වූවා සුදු පුතේ

නුබේ දගකාරකම්
සිතින් මවාගෙන
සතුටුවූවා මගේ පුතේ

තාත්තා නැවත එනතුරු
අම්මාගේ තුරුලේ
සැනසියන් මගේ සුදු පුතේ

සෙ/276518 කෝප්‍රල් ප්‍රසන්න ලංකා ඩීආර්
1 රෙජි ශ්‍රීලංසංබ
යුහ කඳවුර මින්නේරිය





සෙබළ තෙළිතුඩ

# යුද බිමේ සිට අම්මා වෙත

ආදර පෙම්වතිය මගේ අත රැඳී අවිය
තුන් තිස් පැයේ තුරුලේ උණුසුම් සුවය
යුද බිම විරාමය මට රන් කහවනුය
මේ කවි ලියුම මගෙ සුදු අම්මා වෙතය

සුවසේ සිටිමි මම නුඹටත් එලෙස පතා
පවසමි මගේ තොරතුරු මා හොඳට සිතා
අම්මේ ඔබේ මේ සුරතල් රණවිරුවා
අරගෙන යන්නෙ නැහැ කොටියා කියන සතා

සෙ/277705 ලා/කෝ ප්‍රියදර්ශණ යුඑච්සී
6 ශ්‍රීලංසංබ (ආ/බ)
ජේදුරුතුඩුව – යාපනය

## පෙම්වතිය වෙත

සිතේ පැතුමන් අතර
විසල් පැතුමක් විලස
ජීවිතේ පුරාවට
කවියක්ව මගෙ සිතට
දිලෙන තරු අතර මැද

කළු වලා රොද අසල
පායනා පුන් සඳක් විලස
නුඹ මගේ ලොවට
ගෙනෙන්නට පැන් පොදක්
නුඹේ සිත දොවන්නට
හදවතේ සිසිල ලෙස
උණුසුමක් කාදන්න
නැහැ ගෙන්න සතුට මිස
කඳුල වරම් නැති වෙමි
ජීවිතේ පුරාවට
මහ පහන් ටැඹක් විලස
මා ලගින් හිදින්නට
නුඹට හැකි වේවි නම්

සෙ/277958 ලා/කෝ හේරත් පීපීයු
6 ශ්‍රීලංසංබ (ආ/බ)
පල්ලේපායි - යාපනය



# ඔබ ලගදි කරපු ලොකුම පින

ඔබ ලගදි කරපු ලොකුම පින සිහි කරන්න
ඒ පුන්‍ය කර්මය චූටි අහිංසක දෙයක් වෙන්න පුළුවන්
ඔබ ලගදි කාටද පිහිට උනේ
කාගේ දුකද ඔබ නිවීවේ
කාගේ බඩගින්නද ඔබ නිවීවේ
කාගේ කරදරයකටද ඔබ නිවනක් වුනේ
ඇත්තෙන්ම ඔබ එහෙම සිහිකරවන්නටවත්
පින් කර නැද්ද
කලානම් ඒ පුණ්‍ය කර්මය අද සිහිකරද්දී
හිතට මොනවද දැනෙන්නේ
ඒ දැනෙන හැඟීම් සදාකාලිකයි නේද
අදත් විදින්නට පුලුවන් හෙටත් විදින්නට පුලුවන්
ඔබ මියෙන මොහොතෙදීත් ඔබට විදින්නට පුලුවන්
වෙයි නේද ?

සෙ/277690 ලා/කෝ වලිසුන්දර ඩබ්එම්
6 ශ්‍රීලංසංබ (ආ/බ)
ඩී කණ්ඩායම
524 බළසේනු
ජේදුරුතුඩුව - යාපනය

# සඳවතියේ

තිගැස්සී ඇහැරුණු
ඇහි පියන් යට
හාදුවක් තවරා
මටත් හොරාවට
ප්‍රේමාතුරව මසිතේ
ලැගුම් ගත් සිතට
කුමක් පුදන්නද මා
ආදරය හැර ඔබට......

සෙ/277720 සංසෙ තිලකරත්න ඒජේ
6 ශ්‍රීලංසංබ (ආ/බ)
සී කණ්ඩායම
පල්ලේපායි - යාපනය

# මරණය

මරණයේ තොටුපලින් නැව් නැගී ආවෙ අප
සිනහවත් කඳුලකින් එක් වුනත් මොහොතකට
ඒ සිනහ ඒ කඳුල සඟවගෙන මොහොතකට
යලිත් අප යා යුතුය මරණයේ දියඹ වෙත

සෙ/වීවර්ඩී1612 ආසෙ විජේසිංහ පීවීඩබ්පී
2වන සංඥා බළකාය
යුද හමුදා ජනපදය
පනාගොඩ - හෝමාගම

# සිතන්න

සිතන්න මොහොතක් ඔබ
ඔබේ අධ්‍යාත්මික ගුණ ගැන.....
ක්‍රියාවේදී ඔබ එය
පෙන්වන්න මුළු ලොවට.....
ජීවය ගෙන යන ගමන
කවදා කොතැනක නතරවේද?
නොදනිමි එය.....
සිහියට ගමු නිතර
ජීවය ගෙනයන නිමේෂය තුල
උන් කිසිවකු හට
වරදක් නොවන ලෙසට
ජීවය ගෙනයාමට.....

සෙ/279484 සංසෙ
බණ්ඩාර එම්එම්වස්

සෙබළ තෙළිතුඩ

# මගේ ජීවිතය

අහස උසට බලාපොරොත්තු පොදිබැඳ
සසර මාවතේ පිය මනින්න
ලොවට පිවිසි මා හට
දෙපා දිගහැර නැගිටින්න
ඉඩ නොදෙන ලෝකයාට
කිසි විටෙක සරදම් නොකරමි මම
නමුත් ජීවිතය
මහා විසඳා ගත නොහැකි දුක සොමිනස
එකට එකතුවී කිසිවකුට
තෝරාගත නොහැකි
මහා උගතෝ කෝටික දෙයකි ජීවිතය
රන් රිදී මුතු තිබුනද මගේ ජීවිතේ
වර්තමානය අනාගතය
ඉදිරියට ගෙනයාමට
මට ලද එකම වස්තුව අවිය පමණයි.

සෙ/154035 සංසෙ විජේසිරි ජීවම්

# සිහිකරමි පියාණනි

වගුරුවා ලේ දහඩිය
වෛරයෙන්, ක්‍රෝධයෙන්
ගිනිගත් මිහිතලයේ
මහමෙරු පර්වතය මෙන්
සසල නොවී
සිසිල් වූ සිතින්
මෙත් වඩන්නට
හුරු කළ
පියාණනි........

මා ඔබ මැවූ ලොව
තැනුවෙමි........
විදු ලොව එකලු කළ
පත්හිදේ සවිය
පෙරටු කර,
සිතක් නැති
ගිනි අවිය අතට ගෙන,
සිහිකරමි........
මළ හිරු බසින හිශායම
සුදු වැලි මත හිඳ
අරලියා මල් අතුර
දොහොත් මුදුනේ තබා.

සෙ/152246
සංසෙ අරුණ බණ්ඩාර කේවිල්
තොරතුරු තාක්‍ෂණ ඒකකය
සංඥා මූලික වැඩපල
පනාගොඩ - හෝමාගම

වෙඩි හඬට බියකරුද සිත
සිත මගෙන් විමසයිද
මගේ රට අපේ රට
හැඟීමෙන් ඉදිරියට
තැබූ පය පෙරට මිස
නොගන්නෙමි පසුපසට

එකම හෙළ දීපයක්
උරුම කර දෙනු කියා
අනාගත දරුවනට
හෙට දිනක් සදන්නට
රකිමු මව් බිම අපේ
සදා දිවි පුදා අපි.....

.....ප්‍රේමයේ විරහව.....
අපට රජයන සඳුරට
කණාමැදිරි එළි නිවාහෙද්දී
පාවී බංකරය පුරා
තනිකම රජයද්දී
සිනා පිරි ඔය මුව මඬල
මගේ සිත ආදරෙන්
කිති කවනා කල.....

ගිනි අවිය මගේ හද
පයට පෙම් බඳිනා කල
දිනෙන් දින ගනිමි දින
නොතූ අගින් ඉගි කරනා
ඔබේ රුව දැකගන්න.....

පාළුවට තනිකමට
මගේසිත හුරුවෙලා
ජිවිතය ජය ගන්න
උපේ ලොව සරසන්න
මගේ පෙම් කුමරියේ
කැඳවුණේ තනිවෙලා.....

සෙ/279523 සංසෙ විමලදාස පීඑච්



# ප්‍රේමයේ විරහව



# අවිය පමණකි මගේ තනියට

අඳුරු වලා අතරින්
හිරු ගිලිහෙන මොහොතක
දැයේ සාමය සමගිය වෙනුවෙන්
මගේ තනියට සිටිනු ඇත්තේ
අවිය පමණකි අතේ දැරුවේ

මිහිරි අමිහිරි අත්දැකීම් මැද
බිහිසුණු කුරිරු වෙඩි හඬ මැද
සදා අප රැකදුන්
මමද සිහිවිය නෙතට
කඳුලක් උනමින
එනමුත් මගේ තනියට
සිටිනු ඇත්තේ
අවිය පමණකි අතේ රැඳුනේ

සෙ/279483 සංසෙ
වීරසිංහ එච්වීජේවස්

# මල් යෞවනය

මල් යොවනය යුද්දෙට කැප උනාදෙන්
පොදි බැඳි පැතුම්තල හා ඉසු උනාදෙන්
මතුදට තවත් පාලුව ලං උනාදෙන්
මව්පිය සැනසෙනු පුතු මිය ගියාදෙන්

සෙ/279494 සංසෙ උපතිසස්ස එච්එම්





# දුංහිද

නිසල හදවත සසල කල
විසිර හදවත එකට කල ඔබ

ලියක වරලස ලෙසට එන
සුපිරි ජලකඳ ඔබයි දුංහිද

විටෙක ලස්සන වුවත් ඔබෙ රුව
කුරිරු වෙයි ඔබ අපත් නොදැනිම
නුවන පිනවන ලියක් වූ ඔබ

මිනිස් ජීවිත ගිලී දැන දැන
කෙසේ වුවත් ඔබගේ රුව ගුණ
සදා මතකයේ රැඳේ දුංහිද

විටක ඇය දෙවඟනකි
නිහඬ වුවකි සනසන
හිමිදිරි උයද වැනි
ඇයි ගැහැණිය

විටක ඇය කුරිරු චන්ඩ මාරුතයකි
නමුත් ඇයගේ හදවත ගලා
යන මහා ජල පහරක් මෙන්
සිසිල ගෙන එයි



සෙබළ තෙළිතුඩ

# සෙනෙහස අහිමි විය

හිරු හිනැහී
සැඟව ගොසින්
අඳුර ඇවිදින් ඉකි බිඳියි
ඉතින් මම කුමක් කරන්නද
දෛවයට ඉඩනොදී.....
අඳුරට පිටදී මම සිටින්නේ
නොහඬා ඉන්නට තහන මට
ඔබේ සිනහව..... ඔබේ මතකය.....
ඔබේ ඔවදන්..... මට වදදෙයි.....

සංසෙ ඒකනායක ඊඑම්පීඩී

# හමුදාවට බැඳීම

නිසි වැටහීමෙන්ද
නිසි කල්පනාවෙන්ද
නිසි වචනයෙන් යුතුව
නිසි වැඩ කිරීමෙන්ද
නිසි දිවි පැවැත්මට
නිසි උත්සාහයෙන්ද
නිසි සිහිය උදෙසා
නිසි සිත් එකගතාවයෙන්ද
පෙරදැරි කරගෙන
නිසි අරමුණකින් සිටිමටද
එක්වූනේ යුද හමුදාවටයි

සෙ/279457 සංසෙ බංඩාර ඩබ්ලිව්ඩබ්ලිව්එම්



# මව

දස මස කුසේ දරා
ලොවට බිහිකල මවුනි මගේ.....
නුඹේ දයා දිය ලොවම වෙළාගෙන
එකතු කළා ඔබ ලොවටම සෙනෙහස
මගේ පුංචි ලෝකයේ
පයු නොනිවෙන තරුව නුඹ.....
රකින්නම් නුඹ දිවි තිබෙන තුරු මම
භවයෙන් භවයට නුඹේම පුතුවී
ඔන්නම් පසු පස
නිවන් දකින තුරු මවුනි මගේ.....

සෙ/279524 සංසෙ චන්ද්‍රපාල ඩබ්පී

# යුද පිටි සියල්ල අවසන්

ඔබ ගැන පැතුවේ
ඔබවම පැතුවේ
ඇයි මම මේ දුර
තනිවම ආවේ
නැතිවී ජීවිතේ
පැතූ සුවද මට
ඉතිරි කළත් දුක
කඳුලු වී නුඹ
ඔබට සදා සතුට
එ සිතින්ම පතමි මම

කටුක දුක කඳුළුක
විඳිරි අමිහිරි අත්දැකීමක
විඳුතුවක් ලෙස මම
අවිය දරාගෙන
යුද බිමේ තනිව සිටිමි මම.

සෙ/279512 සංසෙ
ගුණතිලක ඩබ්ලිව්ඩබ්



# පිපුනු මලක් නුඹ

සොඳුරු ලඳේ
සුවද කලා නුඹ
දිවිය මගේ
නෙතට හොරා
සිත බැඳුනු දිනේ
පැලදොරින් ඇයි
පැනල ගියේ

සෙ/279499 සංසෙ
සමරකෝන්

# ක්‍රීඩා හපන්කම්



## සංඥා රෙජිමේන්තු වොලිබෝල් කණ්ඩායම

**2004** වර්ෂයේ සංඥා මූලික වැඩපල වෙත වෘත්තීය කාර්මික සෙබලුන් වශයෙන් බඳවාගෙන ආධුනික පුහුණු පාඨමාලාව හැදෑරීමෙන් පසුව වොලිබෝල් පුහුණුවීම් කටයුතු සිදුකර සංඥා රෙජිමේන්තු වොලිබෝල් කණ්ඩායම නියෝජනය කිරීම සඳහා එවකට සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක වශයෙන් කටයුතු සිදුකල බ්‍රිගේඩියර් එස්ඩීපීපී සමරසිංහ ආර්එස්පී ගේ අධීක්ෂණය යටතේ මෙම කණ්ඩායම ස්ථාපිත කරන ලදී. ඉතාමත්ම ලාබාල ක්‍රීඩකයින්ගෙන් සැදුම්ලත් මෙම කණ්ඩායම ස්ථාපිත කළ අවස්ථාවේ සිට දිවයිනේ නොයෙකුත් ප්‍රදේශයන්හි පැවති ප්‍රබල වොලිබෝල් තරගවලට සහභාගී වී පහත දක්වා ඇති ස්ථාන ලබාගත් බැවි ඉතාමත් සතුටින් දැනුම්දිය හැකිය. එමෙන් ම ශ්‍රී ලංකා යුධ හමුදා අන්තර් රෙජිමේන්තු වොලිබෝල් තරගාවලියට පළමු වතාවට ඉදිරිපත් වී ඉන් තුන්වන ස්ථානයට හිමිකරගෙන ඇත.



1. 2004 අන්තර් රෙජිමේන්තු වොලිබෝල් තරගාවලිය - ඒ කොටසේ තුන්වන ස්ථානය
2. 2004.04.14 දින අත්තනගල්ලේදී පැවති තරගාවලිය ශ්‍රීලංකා පොලිස් ක්‍රීඩා සමාජය සමඟ - අනුශූරතාවය
3. 2004.04.17 දින දොරණගොඩ/ගම්පහ පැවති තරගාවලිය - දොරණගොඩ "සුහද" ක්‍රීඩා සමාජය සමඟ - ශූරතාවය
4. 2004.06.06 දින අනුරාධපුරය / තිරප්පනේ පැවති තරගාවලිය - බණ්ඩාරවෙල ක්‍රීඩා සමාජය සමඟ - ශූරතාවය
5. 2004.06.19 දින බණ්ඩාරවෙල /හෝනමොටාව පැවති තරගාවලිය - බණ්ඩාරවෙල ක්‍රීඩා සමාජය සමඟ - ශූරතාවය
6. 2004.07.01 දින වේයන්ගොඩ, මාගලේගොඩ පැවති තරගාවලිය - ගම්පහ "සියනෑතරු" ක්‍රීඩා සමාජය සමඟ - අනුශූරතාවය
7. 2004.09.04 දින පිළියන්දල පැවති තරගාවලිය - පොදුසේවා බලකාය සමඟ - අනුශූරතාවය
8. 2004.10.10 දින තලවකැලේ පැවති තරගාවලිය - නුවරඑළිය "ජොලිස්ටාර්" ක්‍රීඩා සමාජය සමඟ - ශූරතාවය
9. 2005.04.30 දින මාතර/ වලස්මුල්ල පැවති තරගාවලිය - තලහගම්මඩුව අරුණ ක්‍රීඩා සමාජය සමඟ - ශූරතාවය
10. 2005.05.15 දින මිරිහාන පැවති තරගාවලිය - කඩුවෙල "නිල්මිනි" ක්‍රීඩා සමාජය - ශූරතාවය.

2004 වර්ෂයේ ආරම්භයේ පටන් මේ දක්වා පුහුණු කරුවෙකුගේ මඟ පෙන්වීම මත මනා සැලැස්මකට අනුව දෛනික පුහුණුවීම් කටයුතු කරගෙන යන අතර එයට මනා පිටුවහලක් සපයමින් සංඥා බලකායේ නිලධාරීන්ගේ හා සෙසු නිලයන්ගේ ලැබුණු සහයෝගය ඉතා අගය කොට සැලකිය යුතුය.





# ක්‍රීඩා හපන්කම්

## ස්කොෂ්



ශ්‍රී ලංකා සංඥා බලකායේ ස්කොෂ් කණ්ඩායම මේජර් ඩබ්එල් ප්‍රේමසිරි, මේජර් එස්එච්පීඩී තිලකරත්න සහ සැරයන් පෙර්රා එස්ජේඊඩී යන ක්‍රීඩකයින්ගෙන් සමන්විත වේ. ඔවුන් විසින් පහත සඳහන් දක්ෂතාවයන් දක්වා ඇත.

1. 1999 සිට මේ දක්වා අන්තර් රෙජිමේන්තු ස්කොෂ් තරගාවලියේ කණ්ඩායම් ශූරතාවය දිනාගැනීම.
2. ඉහත සඳහන් ක්‍රීඩකයින් තිදෙනාම යුධ හමුදා ස්කොෂ් කණ්ඩායම නියෝජනය කිරීම සහ අන්තර් හමුදා ස්කොෂ් තරගාවලියේදී යුධ හමුදා කණ්ඩායම 2002, 2003 සහ 2004 වසර වලදී ශූරතාවය දිනා ගැනීම.

## රගර්

සෙ/66580
මා/සැරයන් රොද්‍රිගු 3 ශ්‍රීලංසංබ





**2003 වර්ෂය :**
යුධ හමුදා රගර් කණ්ඩායාමේ නායකත්වය දැරීම

**2003 වර්ෂය :**
ආරක්ෂක සේවා රගර් ශූරතාවලිය ලබා ගැනීම

## බැඩ්මින්ටන්



ශ්‍රී ලංකා සංඥා බලකා බැඩ්මින්ටන් කණ්ඩායම 2003 වසරේ පැවති අන්තර් රෙජිමේන්තු බැඩ්මින්ටන් තරගාවලියේ කණ්ඩායම් තරගයෙන් අනුශූරතාවය දිනාගන්නා ලදී. ඒ සඳහා පහත ක්‍රීඩකයින් සහභාගී වෙන ලදී.

අ. මේජර් ඩබ්එල් ප්‍රේමසිරි
ආ. මේජර් ඩීබීජී ජයසිංහ පීඑස්සී
ඇ. මේජර් එස්එච්පීඩී තිලකරත්න ආර්එස්පී
ඈ. මේජර් බීඩබ්එම් ප්‍රේමදාස ආර්එස්පී
ඉ. සැරයන් පෙරේරා එස්ජේඊඩී
ඊ. සරත් දේවේන්ද්‍ර එස්කේ

# ප්‍රායෝගික පිස්තෝල වෙඩික්කරුවෝ





## ලුතිනන් කර්නල් එච්පී සෙනෙවිරත්න

ලුතිනන් කර්නල් එච්.පී සෙනෙවිරත්න 1993 වර්ෂයේ සිට ශ්‍රී ලංකා යුධ හමුදා විවෘත ප්‍රායෝගික පිස්තෝල කණ්ඩායම නියෝජනය කරණ අතර 1997 වර්ෂයේ ජාතික ශූරතාවය දිනා ගන්නා ලදී. 1999 වර්ෂයේ සිට ශ්‍රී ලංකා ජාතික විවෘත ප්‍රායෝගික පිස්තෝල කණ්ඩායම නියෝජනය කරයි.

1999 - ලෝක ශූරතාවලිය - පිලිපීනය
2001 - ඕස්ට්‍රලේසියා ශූරතාවලිය - පිලිපීනය (කණ්ඩායම් අනුශූරතාවය)
2003 - තායි විවෘත ශූරතාවලිය - තායිලන්තය (කණ්ඩායම් ශූරයින්)
2004 - ඉන්දුනීසියා විවෘත ශූරතාවලිය - ඉන්දුනීසියාව
2005 - ඕස්ට්‍රලේසියා ශූරතාවලිය - මලයාසියාව (කණ්ඩායම් තුන්වන ස්ථානය)

මීට අමතරව 2003 වර්ෂයේ ශ්‍රී ලංකාවේ පැවති අන්තර් ජාතික ප්‍රායෝගික පිස්තෝල තරඟාවලියේදී ශ්‍රී ලංකා ජාතික විවෘත කණ්ඩායම නියෝජනය කරන ලදී. දැනට ජාතික ලයිස්තුගත කිරීමේ විවෘත අංශයේ 2 වන ස්ථානය හිමිකරගෙන සිටින අතර මෙම නිළධාරීගේ ශූරතාවය ශ්‍රී ලංකා සංඥා බලකායට මෙන්ම යුධ හමුදාවට කීර්තියක් ගෙන දෙන්නකි.



## මේජර් ඩබ්ළිව්එස්එන් පෙරේරා

2004 වර්ෂයේ යුධ හමුදා කණ්ඩායම නියෝජනය කොට යුධ හමුදා සහ ගුවන් හමුදා සංවිධානය කළ තරඟ වලින් සම්මත අංශයේ කණ්ඩායම් පළමු ස්ථානය ද ජාතික තරඟයෙන් සම්මත අංශයේ කණ්ඩායම් දෙවන ස්ථානය ද හිමිකරගන්නා ලදී.

දැනට සම්මත ඉසව් ජාතික ලයිස්තුගත කිරීමේ 10 වන ස්ථානය හිමිකරගෙන ඇත.

ක්‍රීඩා හපන්කම්





## සුභ මංගලම්



මේජර් දිලන්ත ප්‍රනාන්දු
රසිකා ගයානි ගුණවර්ධන
27.05.2004
ගාලුමුවදොර හෝටලයේදී



මේජර් බීආර් ලමාහේවා
එස් නුවන්කා දිල්හානි
9/9/2005
හික්කඩුව සුපර්කොරල්



කෝප්‍රල් කුසුම්සිරි ඩීඒඑස්
නිලූකා ලක්මාලි
2005.07.22
ගොල්ඩ් ඉන් හොටෙල් බෙන්තොට



කපිතාන් මංජුල විජේරත්න
ලුතිතාන් සාගරිකා විජේසිංහ (ශ්‍රීලයුකාබ)
26.08.2004
ඩෙවොන් හෝටලය
මහනුවර



කපිතාන් කමල් විජේසිංහ
ලුතිතාන් ප්‍රියන්තා දිසානායක (ශ්‍රීලයුකාබ)
2005.05.05
හොලිඩේ රිසෝට් - වාද්දුව



කපිතාන් සමන් දිසානායක
මිලානි කරුණාතිලක
27-04-2005
"පබාෂි" බැලුම්මහර









The
SIGNALLER
Sri Lanka Signal Corps Journal - 2005